# ப்ரஜாசக்தி

## 2026 පළමු කලාපය




ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

கிராம அபிவிருத்தி பயிற்சி ஆராய்ச்சி நிறுவனம்

Rural Development Training and Research Institute

# ප්‍රජාශක්ති

අර්ධ වාර්ෂික ප්‍රකාශනය

2026 පළමු කලාපය

*ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි ............*

**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය**


ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
අංක 24/4, කාසල් වීදිය, කොළඹ 08

ප්‍රධාන කාර්යාලය, බොරැල්ල

දුරකථන :- 011 269 5579
ෆැක්ස් :- 011 269 6592
වෙබ් :- www.rdtri.gov.lk
විද්‍යුත් ලිපිනය :- slrdtri@gmail.com

පුහුණු මධ්‍යස්ථානය, පිළිමතලාව

දුරකථන :- 081 257 5292
ෆැක්ස් :- 081 257 9929
විද්‍යුත් ලිපිනය :- dodd.dtri@gmail.com

**උපදේශකත්වය**

තිලිණි සුරංගිකා කරස්නාගොඩ
අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**ඩබ්ලිව්.කේ.එන්.එන්.කෞෂල්‍යා**
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**එච්.එම්.එම්.රුවෙයිත්**
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**සංස්කරණය**
**ප්‍රියශාන්ත කාරියවසම්**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
**පී.ඒ. චිත්‍රා ජයසිංහ**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
**ඒ.එන්.විතානගේ**
සංවර්ධන නිලධාරි
**එස්.බී.එන්.මල්ෂානි ආනන්ද**
සංවර්ධන නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**විද්‍යුත් මාධ්‍යගත කිරීම**
**පී.ඒ. චිත්‍රා ජයසිංහ**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**පිටකවරය හා පරිසනක සැකසුම**
**ඒ.එන්.විතානගේ**
සංවර්ධන නිලධාරි

# ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය.

"සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් කරා"

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI), සහභාගීත්ව සංවර්ධන ක්‍රමවේද යොදාගනිමින් තිරසාර ග්‍රාමසංවර්ධනය උදෙසා ප්‍රජාවගේ සක්‍රීය සහභාගීත්වය උපරිම කිරීමට පුහුණු, පර්යේෂණ හා තොරතුරු සම්පාදනය තුළින් දායකත්වය සපයයි.

අප රට මුහුණ දී සිටින සංවර්ධන අභියෝග හමුවේ, හුදෙක් සහනාධාර ලබන සහ යැපුම් මානසිකත්වයක් සහිත පුරවැසියන්ගෙන් යුත් සමාජයක් වෙනුවට, සවිබල ගැන්වූ ප්‍රජාවක් නිර්මාණය කර ගැනීම වත්මන් රජයේ ප්‍රමුඛතම අරමුණකි. "සංවර්ධනය ජනතාව වෙනුවෙන් නොව, ජනතාව සමඟ" යන සංකල්පය පෙරටුව බිම් මට්ටමේ සිට ක්‍රියාත්මක ප්‍රජාශක්ති වැඩසටහන, අපේ රටේ ග්‍රාමීය පුනර්ජීවනය උදෙසා ගත් ඓතිහාසික සහ ප්‍රායෝගික පියවරකි.

ලංකාවේ සියලුම ග්‍රාම නිලධාරී වසම් ආවරණය වන පරිදි පිහිටුවා ඇති ප්‍රජා සංවර්ධන සභා (CDC) හරහා ග්‍රාමීය ජනතාව තම ප්‍රදේශයේ අවශ්‍යතා හඳුනා ගැනීමේත්, සංවර්ධන යෝජනා ප්‍රමුඛතාගත කිරීමේත් පූර්ණ නිදහස හිමිකරගෙන ඇත. විනිවිදභාවයෙන් හා වගවීමකින් යුතුව ජාතික සංවර්ධන කාර්යයට දායක වීමේ අවස්ථාව මේ හරහා සෑම පුරවැසියෙකුටම උදා වී තිබේ.

ප්‍රජාශක්ති වැඩසටහන පදනම් වන මූලධර්ම හය වන සමාජ සහයෝගිතාව, සමාජ සවිබලගැන්වීම, ජීවන චක්‍රය මූලික කරගත් සංවර්ධනය, සමාජ සාධාරණත්වය, සමාජ අන්තර්කරණය සහ සහභාගීත්ව ප්‍රවේශය යන මූලධර්ම මත පදනම්ව ප්‍රජාවගේ දායකත්වය සහිත නව සංවර්ධන මාදිලියක් අප රජය විසින් රටට හඳුන්වා දෙන මොහොතක ඊට අත්වැලක් සපයමින් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මෙවැනි ප්‍රකාශනයක් එළි දැක්වීම සතුටට කරුණකි.

ස්තුතියි.



ආචාර්ය උපාලි පන්නිලගේ

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍ය.

# නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය.

**"ජනතා සහභාගීත්වයෙන් ගොඩනැගෙන තිරසර ග්‍රාමීය පුනරුදය"**

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI) විසින් ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරයේ පුහුණු ඒකකය ලෙස ක්‍රියා කරමින් නිකුත් කරනු ලබන ප්‍රථම අර්ධ වාර්ෂික සඟරාව වෙනුවෙන් මෙම පණිවිඩය යොමු කිරීමට ලැබීම පිළිබඳව මා බෙහෙවින් සතුටු වෙමි.

අද දවසේ ශ්‍රී ලංකාවේ සංවර්ධන ගමන්මගෙහි සැබෑ වෙනස සිදුවිය යුත්තේ ගම් මට්ටමිනි. සාම්ප්‍රදායික සංවර්ධන ක්‍රමවේදයන් පසුපස හඹා යමින්, සම්පත් බෙදාදීම පමණක් අරමුණු කරගත් යුගය අප විසින් අවසන් කළ යුතුය. ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය යනු ජනතාව රජයේ අත දෙස බලා සිටින පිරිසක් ලෙස නොව, තමන්ගේ ප්‍රදේශයේ සංවර්ධන තීරණ ගන්නා සක්‍රීය නියමුවන් බවට පත් කරන විප්ලවීය ප්‍රවේශයකි.

අපගේ ග්‍රාමීය ප්‍රජාව සතු සැඟවුණු හැකියාවන් සහ සම්පත්, විද්‍යාත්මක ක්‍රමවේද සහ නවීන තාක්ෂණය සමඟ ඒකාබද්ධ කිරීම තුළින් අපේක්ෂිත ආර්ථික ස්වයංපෝෂිතභාවය ළඟා කරගත හැකිය. ප්‍රජා සංවර්ධන සභා (CDC) හරහා අද ක්‍රියාත්මක වන වැඩසටහන් මගින් පවුල් ඒකකයේ සිට ග්‍රාම නිලධාරී වසම දක්වා පැතිරෙන සැබෑ සමාජ සහ ආර්ථික ප්‍රබෝධයක් අප දකිමු.

සමාජ සහයෝගිතාව, සමාජ සවිබලගැන්වීම, ජීවන තත්ත්වය මූලික කරගත් සංවර්ධනය, සමාජ සාධාරණත්වය, සමාජ අන්තර්කරණය සහ සහභාගීත්ව ප්‍රවේශය යන මූලධර්ම හය මත පිහිටා ක්‍රියාත්මක වන මෙම ජාතික වැඩසටහන, ශ්‍රී ලංකාවේ අනාගත අභිමානය ගොඩනැගීමට දරන ප්‍රබල උත්සාහයකි.

මෙම අර්ධ වාර්ෂික සඟරාව තුළින් ප්‍රජාශක්ති වැඩසටහනේ අත්දැකීම් සහ විද්වතුන්ගේ දැනුම හා අත්දැකීම් පිළිබඳව පුළුල් දැනුමක් පාඨකයන් වෙත ලබා දෙයි. ඉදිරි සංවර්ධන අභියෝග ජය ගැනීමට මෙම සඟරාව ප්‍රබල අත්වැලක් වනු ඇති බව මාගේ විශ්වාසයයි.

ප්‍රජාශක්ති වැඩසටහන යටතේ අප අරඹා ඇති මෙම මහා පරිමාණ ගමන සාර්ථක කර ගැනීමටත්, බහුමානික දරිද්‍රතාවයෙන් තොර, සමෘද්ධිමත් සහ අභිමානවත් දේශයක් බිහිකිරීමටත් කැපවී ක්‍රියා කරන සියලුම රාජ්‍ය නිලධාරීන්ට, ප්‍රජා නායකයින්ට සහ ග්‍රාමීය ජනතාවට මාගේ කෘතඥතාව පිරිනමමි.

......................



**වසන්ත පියතිස්ස**

නියෝජ්‍ය අමාත්‍ය,

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය.

# ලේකම්තුමාගේ පණිවිඩය.

"දත්ත මත පදනම් වූ විනිවිද පෙනෙන පරිපාලනයක් - ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය"

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI) විසින් ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරයේ පුහුණු ඒකකය ලෙස ක්‍රියාකරමින් නිකුත් කරනු ලබන ප්‍රථම අර්ධ වාර්ෂික සඟරාව වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

දශක ගණනාවක සිට ශ්‍රී ලාංකේය ග්‍රාමීය ප්‍රජාව දිළිඳු බවින් මුදවා ගනුවස් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර බොහෝ වැඩසටහන් කුටුම්භ කේන්ද්‍රීය ප්‍රවේශයන් ලෙස පමණක් ක්‍රියාත්මක විය. සුබසාධන ඉලක්ක අරඹයා ක්‍රියාත්මක වූ එම වැඩසටහන් ආන්තීකරණ රාමුව තුළ ජීවත් වූ පුද්ගල කණ්ඩායම්වල දෛනික පැවැත්මට උපකාරි වුවද තිරසර ජීවන පැවැත්මට ඍජු දායකත්වයක් නොදැක් වූ බව නොරහසකි. එම නිසා එවැනි කණ්ඩායම් දිගින් දිගටම දිළිඳුබවේ විෂමවක්‍රයේ පාරම්පරික කොටස්කරුවන් ලෙස ජීවත්වීම  දක්නට ලැබිණ. මෙම දිළිඳුබව ආර්ථික උත්පාදනයට දායකත්වයක් නොදැක්වූවා පමණක් නොව යැපුම් ආර්ථිකයක තිරසර කොටස්කරුවන් වෙමින් සංවර්ධන ඉලක්කයන් වෙත ඍණාත්මක බලපෑමක් එල්ල කළේය.

මෙම තත්ත්වය තුරන් කිරීම අරමුණු කර ගනිමින් පුද්ගල කේන්ද්‍රීය සංවර්ධන ප්‍රෙවිශයෙන් ඔබ්බට ගොස් ප්‍රජා කේන්ද්‍රීය සංවර්ධනයක් අපේක්ෂාවෙන් ප්‍රජාශක්ති දිළිඳුබව තුරන් කිරීමේ ජාතික ක්‍රියාන්විතය මෙම වසරේ සිට රජය විසින් හඳුන්වා දෙන ලදි.

සුවිශේෂි උපාය මාර්ගයක් ලෙස හඳුන්වා දුන් මෙම ප්‍රජා ශක්ති ජාතික ව්‍යාපාරය සංකල්පීයමය වශයෙන් පුළුල් පරාසයක අර්ථකථනය කරනු ලබයි. සාධනීය සමාජ පරිවර්තනයක් දෘෂ්ඨිමය අපේක්ෂාව වන මෙම වැඩසටහන ප්‍රජා සහභාගීත්වය ශක්තිමත් වු ප්‍රවේශයක ක්‍රියාත්මක වේ. පවතින සමාජ තත්‍යන් තාක්ෂණිකව විශ්ලේෂණය කරමින් ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීම සඳහා සාමූහික ප්‍රයත්නයක් තුළ හඳුනා ගන්නා ග්‍රාමීය සංවර්ධන අවශ්‍යතාවයන් ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ කොට තිරසර ග්‍රාමීය සංවර්ධනයක් වෙත දිශාගත වේ.

කළමනාකරණ පද්ධති (MIS) සහ භූගෝලීය තොරතුරු පද්ධති (GIS) වැනි නවීන තාක්ෂණික ක්‍රමෝපායන් මෙම වැඩසටහනට ඒකාබද්ධ කරගැනීම තුළින් ක්‍රියාවලියේ විනිවිධභාවය මෙන්ම අධීක්ෂණය ද ශක්තිමත් කරයි. මේ සා අපේක්ෂිත මෙහෙයුම් ක්‍රියාවලියක නායකත්වය මෙම අමාත්‍යාංශය වෙත පැවරීමත් සමඟම  ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයට එහි අධ්‍යාන, පුහුණු සහ

පර්යේෂණ අවශ්‍යතාවය ඉටු කිරීමේ කර්තව්‍ය පූර්ණ වශයෙන් පැවරිණි. ඒ අනුව, විවිධ උපාය මාර්ග ඔස්සේ ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් ඇතුළු ප්‍රජා සංවර්ධන සභාවල ක්‍රියාකාරීන්හට අවශ්‍ය දැනුම කුසලතාවය සහ ශක්‍යතාවයන් ඔප්නැංවීමට ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය ක්‍රියාත්මක වේ. ඒ අතරින් ප්‍රශස්ථ ක්‍රියාකාරකම් අන්තර්ගත කරමින් නිර්මාණය වන මෙවැනි සඟරා එළිදැක්වීම තුළින් සමස්ථ ක්‍රියාවලිය ද ඒ හා සම්බන්ධවී සිටින සියලු පාර්ශවයන් ද අභිප්‍රේරණය කරයි. එමනිසා මෙවැනි මැදිහත්කරණයන් ප්‍රශංසනීයය.



සම්පත් මන්ත්‍රීනායක

ලේකම්,

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය.

# අධ්‍යක්ෂ පණිවිඩය.

"සංවර්ධනය ජනතාව වෙනුවෙන් නොව, ජනතාව සමඟ"

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI) විසින් නිකුත් කරනු ලබන ප්‍රජාශක්ති අර්ධ වාර්ෂික සඟරාවෙහි මෙම කලාපය ඔබ අතට පත් කිරීම මා ලැබූ භාග්‍යයක් ලෙස සලකමි.

වත්මන් රජය විසින් හඳුන්වා දී ඇති 'ප්‍රජාශක්ති' වැඩසටහන මගින් අප උත්සාහ කරන්නේ ජනතාවගේ යැපුම් මානසිකත්වය වෙනස් කර, ජනතාව ස්වයංපෝෂිත නිෂ්පාදකයින් සහ සංවර්ධනයේ සක්‍රීය කොටස්කරුවන් බවට පත් කිරීමටයි.

සංවර්ධනය යනු හුදෙක් ආධාර ලබාදීමක් නොව, ග්‍රාමීය ජනතාවගේ අභ්‍යන්තර ශක්තිය සහ ස්වයංපෝෂිතභාවය අවදි කිරීමක් බව අප වටහා ගත යුතුය. ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය හරහා ක්‍රියාත්මක වන ප්‍රජා සංවර්ධන සභා (CDC) මගින් සිදු කරන්නේ ගම් මට්ටමින් ජනතාවගේ ගැටලු හඳුනාගෙන, විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ විසඳුම් ලබා දීමයි.

මෙම සඟරාව තුළින් ඔබ වෙත ගෙන එන්නේ හුදෙක් වාර්තාමය තොරතුරු පමණක් නොව, ග්‍රාමීය මට්ටමේ සාර්ථකත්වය අත්පත් කරගත් පුරෝගාමීන්ගේ අත්දැකීම් සහ අපේක්ෂාවන්ය.

බහුමාන දරිද්‍රතාවයෙන් තොර, අභිමානවත් දේශයක් ගොඩනැගීම සඳහා අප සැම එකමුතු විය යුතුය.



තිලිණි සුරංගිකා කරස්නාගොඩ
අධ්‍යක්ෂ,
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

# සංස්කාරක සටහන

ග්‍රාම සංවර්ධනය වූ කලී ගමේ සංවර්ධනය සඳහා සිදු කරනු ලබන ක්‍රියාකාරකමෙහි තීව්‍ර ව්‍යායාමයකි.

එය ගම තුළ යටිතල පහසුකම් මෙන්ම ආධ්‍යාත්මික සහ සාමාජීය කෘත්‍ය භාගයක උත්සාහයක් වේ.

ගම සංවර්ධනය නම් නගරය පළාත හා ජාතික වශයෙන් ගත් කළ සමස්ත රටේ හා පුරවැසි ප්‍රජාවගේ මූලික අවශ්‍යතාවල අභිවෘද්ධිය සඳහා ආර්ථිකමය වශයෙන් සුභ සුද්ධියක පෙර නිමිත්තකි.

මෙම සකල ක්ෂේත්‍රයන් ආවරණය කරනු වස් අප අමාත්‍යාංශය විසින් මේ වන විට ක්‍රියාත්මක කරනු ලබන "ප්‍රජාශක්ති" නම් ජාතික සංවර්ධන වැඩසටහන සමස්ත ලාංකීය ප්‍රජාවගේ සියලු අවශ්‍යතා ඉටුකර ගැනීමට ගනු ලබන උත්තුංග උත්සාහයක් බව සඳහන් කළ යුතුය.

මෙම ව්‍යායාමය හුදෙක් සංවර්ධන කටයුත්තක්ම නොව දැවැන්ත ව්‍යාපෘතියක යෝධ පිම්මකි.

1948 නිදහසෙන් පසු සිදු කරනු ලැබූ සංවර්ධන වැඩසටහන් හා සංවර්ධන ව්‍යාපෘතිවල අත්දැකීම්වල ආභාෂය හා දැනට පවතින සමාජ වටපිටාවට අවනත ලෙස සකස් කරන ලද වැඩසටහනක් වේ.

ගමේ අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ සිට රාජ්‍ය හා රාජ්‍ය නොවන, ස්වේච්ඡා සංවිධානයන් නියෝජනය කරනු ලබන සැවොමගේ සහභාගිත්ව සංවර්ධනයක මුල පිරීමකි.

ප්‍රජාශක්ති ජාතික සංවර්ධන වැඩසටහනේ මුඛ්‍ය අරමුණ වන්නේ සංවර්ධන ක්‍රියාවලියෙන් ගිලිහී ගිය, මඟ හැරුණු, අත්හැරී ගිය හා අවතැනූ සියලූ ප්‍රජාවෝ එකම වේදිකාවකදී තම අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට මං පෙත් විවර කරන මැදිහත් ක්‍රියාවලියකි. සහභාගිත්ව මැදිහත්වීමකි.

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයෙන් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන "ප්‍රජාශක්ති" ශාස්ත්‍රීය සංග්‍රහයෙන් විවිධ අත්දැකීම්වලින් සංයුක්ත වූ විද්‍යාර්ථයෙන් හා සංවර්ධන වැඩකරුවන්ගේ ශාස්ත්‍රීය එළඹුමෙන් පෝෂණය වන සාහිත්‍ය මෙවලමකි. ඒ සඳහා ලාංකීය සංවර්ධන වැඩකරුවන්ට සංවර්ධන වේදීන් හා ඔබ සැමට මැදිහත් වන ලෙසට අප ආරාධනා කරමු.

.........................

සංස්කාරක මණ්ඩලය

# ලිපි දිග හැරුම...................

1. ප්‍රජාශක්ති: බහුමානික දරිද්‍රතාවය තුරන් කරමින් පොහොසත් රටක් කරා - ( 01- 06 )

2. ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාව තුරන් කිරීමට ප්‍රජාශක්ති ජාතික වැඩසටහනේ උපයෝගීතාව - ( 07 – 20 )

3. ග්‍රාමීය ප්‍රබෝධය උදෙසා චීන ආදර්ශ - ( 21 – 26 )

4. දරිද්‍රතාවයෙන් තොර දේශයක්: 'ප්‍රජාශක්ති' බහුමානීය ප්‍රවේශය, ප්‍රජා සවිබල ගැන්වීම සහ රැකවරණය - ( 27 – 33 )

5. Odyssey of Red Dragon's Conquest of Poverty - ( 34 – 45 )

6. ශ්‍රී ලංකාවේ ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ ලා ප්‍රජාශක්ති ව්‍යාපාරයේ සුවිශේෂී භූමිකාව - ( 46 – 52 )

7. வளர்ந்து வரும் நாடாகிய இலங்கையில்'பிரஜா சக்தி வேலைத்திட்டத்தின் முக்கியத்துவம் – ( 53 - 58 )

8. සමාජ සජීවීකරණය සහ ප්‍රජා සවිබලගැන්වීම - ( 59 – 67 )

9. වැඩ ඇරී... වැඩට යන "ඇය".... නිසා ලියමි... – ( 68 )

10. ප්‍රජා ශක්තිය ගොඩනඟන්නට......... - ( 69)

# 01. ප්‍රජාශක්ති: බහුමානික දරිද්‍රතාවය තුරන් කරමින් පොහොසත් රටක් කරා

අද වන විට ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝගයන් හමුවේ වඩාත් තිරසාර සහ ප්‍රායෝගික විසඳුමක් ලෙස 'ප්‍රජාශක්ති' ජාතික ව්‍යාපාරය පෙරට පැමිණ තිබේ. එහි මූලිකම දැක්ම වන්නේ ශ්‍රී ලංකාව තුළ පවතින බහුමානික දරිද්‍රතාවය මුලිනුපුටා දැමීමයි. හුදෙක් ආධාර ලබාදීමකින් ඔබ්බට ගොස්, ග්‍රාමීය මට්ටමින් ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සහ ඔවුන්ව ආර්ථික සංවර්ධනයේ සක්‍රිය කොටස්කරුවන් බවට පත් කිරීම මෙම ව්‍යාපාරයේ අරමුණයි.

## ප්‍රජා සංවර්ධන සභාව (CDC)

ප්‍රජාශක්ති ව්‍යාපාරයේ හදවත වන්නේ 'ප්‍රජා සංවර්ධන සභාව' (CDC) යි. ග්‍රාමීය මට්ටමින් සංවර්ධන යෝජනා හඳුනා ගැනීම, ඒවා ප්‍රමුඛතාගත කිරීම සහ රාජ්‍ය යාන්ත්‍රණය සමඟ සම්බන්ධීකරණය කිරීමේ වගකීම පැවරී ඇත්තේ මෙම සභා වෙතය.

සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටුවා ඇති මෙම ප්‍රජා සංවර්ධන සභාව (CDC) යනු හුදු කමිටුවක් නොව ගමේ සංවර්ධනයේ තීරණ ගන්නා බල මධ්‍යස්ථානයයි. මෙයට ප්‍රජා සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම සහ ධීවර නිලධාරීන් වැනි රාජ්‍ය නිලධාරීන් මෙන්ම, ගමේ වෙසෙන තරුණ නියෝජිතයින්, කාන්තා සංවිධාන, ව්‍යවසායකයින් සහ ප්‍රජා නායකයින් ඇතුළත් වේ. මෙහිදී කාන්තාවන්ගේ සහ තරුණයන්ගේ නියෝජනය අනිවාර්ය කර ඇත්තේ, සංවර්ධන ක්‍රියාවලියේදී සමාජයේ සියලුම පාර්ශ්වයන්ගේ හඬට අවස්ථාව ලබා දීම සඳහාය. මෙමඟින් "කිසිවෙකු අත් නොහැරීම" යන මූලධර්මය සාක්ෂාත් කර ගැනේ.

සෑම ප්‍රජා සංවර්ධන සභාවකම සාමාජිකයින්ට තම ප්‍රදේශයේ පවතින සැබෑ ගැටලු හඳුනා ගැනීමට විද්‍යාත්මක ක්‍රමවේද හුරු කරවීම ප්‍රජාශක්ති ව්‍යාපාරයේ සුවිශේෂී ලක්ෂණයකි. '5 Why' (ගැටලුවක මූලික හේතුව සෙවීම) සහ 'Problem Tree' (ගැටලු ගස) වැනි මෙවලම් භාවිතා කරමින්, හුදු ඉල්ලීම්වලින් ඔබ්බට ගොස් ගැටලුවල සැබෑ ස්වභාවය විශ්ලේෂණය කිරීමට ඔවුන්ට හැකියාව ලැබේ.

## බහුමානික දරිද්‍රතාවය තුරන් කිරීමේ ක්‍රියාවලිය

බහුමානික දරිද්‍රතාවය යනු හුදෙක් ආදායම් මට්ටම පමණක් නොව, සෞඛ්‍ය, අධ්‍යාපනය සහ ජීවන තත්ත්වය වැනි සාධක රාශියක එකතුවකි. ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය මගින් ප්‍රජා සංවර්ධන සභා හරහා පහත ආකාරයේ ක්‍රියාකාරකම් දියත් කෙරේ.

1. ග්‍රාමීය අවශ්‍යතා විශ්ලේෂණය: ප්‍රදේශයේ පවතින සම්පත් සහ අභියෝග SWOT විශ්ලේෂණයක් මගින් හඳුනා ගැනීම.
2. සම්පත් ප්‍රමුඛතාගත කිරීම: සීමිත සම්පත් භාවිතා කරමින් වඩාත්ම බලපෑමක් කළ හැකි සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.

3. රාජ්‍ය සම්බන්ධීකරණය: හඳුනාගත් යෝජනා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වෙත නිවැරදි ක්‍රමවේදයට අනුව ඉදිරිපත් කිරීම.

මෙමගින් ග්‍රාමීය ජනතාව තමන්ගේම සංවර්ධන සැලසුම්වල හිමිකරුවන් බවට පත්වන අතර, 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' යථාර්ථයක් කර ගැනීමට අවශ්‍ය පදනම ගමේ මට්ටමෙන්ම සකස් වේ.

## ප්‍රජාශක්ති මූලධර්ම

ප්‍රජාශක්ති ව්‍යාපාරය පදනම් වන මූලධර්ම හය යනු සංවර්ධනයේ ප්‍රායෝගික දර්ශනයයි:

- සමාජ සහයෝගිතාව: ගම්වැසියන් එකමුතුව පොදු අරමුණු වෙනුවෙන් කැපවීම.
- සමාජ සවිබලගැන්වීම: ජනතාව තමන්ගේ ගැටලු හඳුනාගෙන ඒවා විසඳා ගැනීමට අවශ්‍ය ශක්තිය ලබා දීම.
- ජීවන තත්ත්වය මූලික කරගත් සංවර්ධනය: ආදායම් මාර්ග පමණක් නොව සෞඛ්‍ය, අධ්‍යාපන සහ පාරිසරික යහපැවැත්ම ඉහළ නැංවීම.
- සමාජ සාධාරණත්වය: සම්පත් බෙදාහැරීමේදී වඩාත්ම අවශ්‍යතා ඇති පවුල්වලට ප්‍රමුඛතාවය දීම.
- සමාජ අන්තර්කරණය: සමාජයෙන් කොන් වී සිටින කණ්ඩායම් සංවර්ධන ක්‍රියාවලියට ඇතුළත් කර ගැනීම.
- සහභාගිත්ව ප්‍රවේශය: සැලසුම් කිරීමේ සිට අධීක්ෂණය දක්වා සෑම පියවරකදීම ප්‍රජාවේ සෘජු දායකත්වය ලබා ගැනීම.

මෙම මූලධර්ම මගින් බහුමානික දරිද්‍රතාවයට මුහුණ දෙන පවුල්වලට ස්ථිරසාර විසඳුම් ලැබෙන අතර, ඔවුන් සහනාධාර ලබන්නන්ගේ මානසිකත්වයෙන් මිදී ස්වයංපෝෂිත නිෂ්පාදකයින් බවට පත් වේ.

## අනාගත අපේක්ෂාව

ප්‍රජාශක්ති ව්‍යාපාරය යනු හුදෙක් තාවකාලික ව්‍යාපෘතියක් නොව, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ස්ථාවර වැඩපිළිවෙලකි. ප්‍රජා සංවර්ධන සහා සාමාජිකයින් සවිබල ගැන්වීම මගින් බිම් මට්ටමේ සිටම ජාතික සංවර්ධනයට දායක වීමේ අවස්ථාව ජනතාවට හිමි වී ඇත. ඉදිරියේදී මෙම වැඩපිළිවෙල තවදුරටත් පුළුල් කරමින්, ශ්‍රී ලංකාව තුළින් බහුමානික දරිද්‍රතාවය සම්පූර්ණයෙන්ම තුරන් කිරීමේ ඉලක්කය කරා ගමන් කිරීම අප සැමගේ වගකීමකි.

"ගම් දහසක වැඩ දහසක්"

ප්‍රජාශක්ති ව්‍යාපාරය හුදු කඩදාසි මත පමණක් නොව බිම් මට්ටමින් සක්‍රියව ක්‍රියාත්මක වේ. 2026 අයවැය මගින් වෙන් කරන ලද රුපියල් බිලියන 25ක ප්‍රතිපාදන භාවිත කරමින්, 2026 ජූනි 02 දින ආරම්භ කළ "ගම් දහසක වැඩ දහසක්" වැඩසටහන මෙහි මූලික ප්‍රායෝගික පියවරයි. සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකම ජීවනෝපාය සංවර්ධනය, නිෂ්පාදන ආර්ථිකය, මාර්ග සහ පානීය ජලය වැනි ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ව්‍යාපෘති රට පුරා ක්‍රියාත්මක කෙරේ.

මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වයට තවත් කදිම නිදසුනක් ලෙස, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අඹගස්පිටිය ග්‍රාම සේවා වසමේ ආරම්භ කළ 'පින්වල අමුණ' ප්‍රතිසංස්කරණ කටයුතු පෙන්වා දිය හැකිය. ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය ආචාර්ය උපාලි පන්නිල මහතාගේ ප්‍රධානත්වයෙන්, ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, පාර්ලිමේන්තු නියෝජ්‍ය කාරක සභා සභාපතිනි හේමාලි වීරසේකර මහත්මිය සහ අමාත්‍යාංශ ලේකම් සම්පත් මන්ත්‍රිනායක මහතා ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මෙම කටයුතු දියත් කෙරිණි.







අම්පාර දිස්ත්‍රික්කයේ දෙමටමල්පැලැස්ස ග්‍රාමයේ ක්‍රියාත්මක අපනයන කෘෂිකර්ම වගා ව්‍යාපෘතිය මෙන්ම, මහර පින්වල අමුණ ප්‍රතිසංස්කරණය වැනි වැඩසටහන් ද ප්‍රජා සංවර්ධන සභාවල (CDC) මූලිකත්වයෙන් සහ ජනතා දායකත්වයෙන් ඇරඹීම, හුදු සහනාධාර මත යැපෙන පවුල් ආර්ථිකයක් වෙනුවට නිෂ්පාදන ආර්ථිකයක් කරා ග්‍රාමීය ප්‍රජාව යොමු කිරීමේ 'ප්‍රජාශක්ති' දැක්ම මනාව පිළිබිඹු කරයි. මෙවැනි ව්‍යාපෘති මගින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනයට සහ ස්ථාවර ආදායම් මාර්ග නිර්මාණය කිරීමට 'ප්‍රජාශක්ති' වැඩපිළිවෙලෙහි ඇති හැකියාව මනාව තහවුරු වේ.




### දිළිඳුකම තුරන් කිරීමේ නව මානයක්

"ප්‍රජාශක්ති" යනු හුදෙක් සහනාධාර ලබාදීමේ වැඩසටහනක් නොව, තිරසාර සංවර්ධනය සහ බහුමාන දරිද්‍රතාවය තුරන් කිරීම උදෙසා ක්‍රියාත්මක වන ජාතික ව්‍යාපාරයකි. මෙහි මූලික වෙනස වන්නේ දිළිඳු ජනතාව ප්‍රතිලාභ ලබන්නන් ලෙස නොව, සංවර්ධනයේ තීරණ ගන්නන් සහ ක්‍රියාත්මක කරන්නන් ලෙස සැලකීමයි. "සංවර්ධනය ජනතාව වෙනුවෙන් නොව, ජනතාව සමඟ" යන උදාර සංකල්පය පෙරදැරිව, රාජ්‍යය, ප්‍රජාව සහ සංවර්ධන ආයතන අතර හවුල්කාරිත්වයක් ගොඩනැගීම මෙහි අපේක්ෂාවයි.

ප්‍රජාශක්ති වැඩසටහන සුවිශේෂී වන්නේ එහි පවතින විනිවිදභාවය සහ වගවීම හේතුවෙනි. ප්‍රජා සංවර්ධන සභාවලට කිසිදු කොන්ත්‍රාත් කටයුත්තක් ලබා නොදෙන අතර, ඔවුන්ගේ කාර්යභාරය සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම, යෝජනා ඉදිරිපත් කිරීම සහ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම දක්වා සීමා කර ඇත. මෙය අරමුදල් අවභාවිතය වැළැක්වීමට ගත් ප්‍රබල පියවරකි. ජනාධිපතිවරයා සභාපතිත්වය දරන 'ප්‍රජා ශක්ති ජාතික ප්‍රතිපත්ති සභාව' හරහා මෙහෙයවනු ලබන මෙම ජාතික ව්‍යුහය, ග්‍රාමීය මට්ටමේ සිට ඉහළම ප්‍රතිපත්ති තීරණ ගැනීමේ මට්ටම දක්වා ඒකාබද්ධ කර ඇත.

### ප්‍රජාශක්ති: ක්ෂේත්‍ර මට්ටමේ ක්‍රියාකාරී මැදිහත්වීම

ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරයේ ඇති ක්‍රියාකාරී බව මනාව පැහැදිලි වන එක් උදාහරණයක් ලෙස ජාතික ඩෙංගු මර්දන වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කළ විශේෂ ව්‍යාපෘතිය පෙන්වා දිය හැකිය. රට පුරා සීඝ්‍රයෙන් පැතිර යන ඩෙංගු උණ රෝගය පාලනය කිරීම උදෙසා රජය විසින් ගනු ලබන පියවරයන්ට සහයෝගය ලබා දෙමින්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය මෙම වැඩසටහන දියත් කළේය. ප්‍රජා සවිබල ගැන්වීමේ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (MOH) කාර්යාල සමඟ සම්බන්ධීකරණය වෙමින්, සෑම වසමකම ඩෙංගු මර්දන සැලසුම් සකස් කිරීම මෙම ව්‍යාපෘතියේ විශේෂත්වයයි. මෙවැනි වැඩසටහන් මගින් ප්‍රජාශක්ති ව්‍යාපාරය යනු ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍යාරක්ෂිතභාවය සහ යහපැවැත්ම උදෙසා නිරන්තරයෙන් ඇපකැප වී සිටින වැඩපිළිවෙලක් බව මනාව තහවුරු වේ.





ජාත්‍යන්තර පිළිගැනීම





අද වන විට ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝගයන් හමුවේ වඩාත් තිරසාර සහ ප්‍රායෝගික විසඳුමක් ලෙස 'ප්‍රජාශක්ති' ජාතික ව්‍යාපාරය පෙරට පැමිණ තිබේ. මෑතකදී ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ කැනේඩියානු මහ කොමසාරිස් ඉසබෙල් මාටින් මහත්මිය සහ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍ය ආචාර්ය උපාලි පන්නිල මහතා අතර පැවති නිල හමුව, මෙම වැඩසටහනේ ජාත්‍යන්තර පිළිගැනීම තහවුරු කළ අවස්ථාවක් විය. මෙම හමුවේදී ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීම, අඩු ආදායම්ලාභී පවුල් සවිබලගැන්වීම සහ සමාජ ආරක්ෂණ වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබාදීමට කැනේඩියානු රජය එකඟතාව පළ කිරීම, ප්‍රජාශක්ති ව්‍යාපාරයේ අනාගතයට නව ජවයක් එක් කරයි.



**තිළිණි සුරංගිකා කරස්නාගොඩ**

**අධ්‍යක්ෂ,**

**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.**

# 02. ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාව තුරන් කිරීමට ප්‍රජාශක්ති ජාතික වැඩසටහනේ උපයෝගීතාව

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික දේහය තුළ දශක ගණනාවක් පුරා මුල් බැසගත් ගැඹුරුතම සහ සංකීර්ණතම අර්බුදයක් ලෙස දරිද්‍රතාව, විශේෂයෙන්ම ග්‍රාමීය සහ වතුකරයේ දරිද්‍රතාව හඳුනාගත හැකිය. නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ විවිධාකාරයේ සුබසාධන සහ දරිද්‍රතාව පිටුදැකීමේ වැඩසටහන් ක්‍රියාත්මක වුවද, ඒවා බොහෝදුරට දේශපාලනීකරණය වූ, ඛණ්ඩනය වූ සහ කෙටිකාලීන සහනාධාර මත පදනම් වූ ව්‍යාපෘති බවට පත් විය. මෙම පසුබිම තුළ, 1977 න් පසු හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්ති සහ ව්‍යුහාත්මක ගැලපීම් හේතුවෙන් නාගරික සහ ග්‍රාමීය අංශ අතර ආදායම් සහ යටිතල පහසුකම් බෙදී යාමේ දැවැන්ත විෂමතාවක් නිර්මාණය විය. මෑත කාලීනව, විශේෂයෙන්ම 2022 වර්ෂයේදී රට මුහුණ දුන් ඓතිහාසික සාර්ව ආර්ථික බිඳවැටීමත් සමඟ, මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර අතට හැරුණු අතර, මිලියන සංඛ්‍යාත ග්‍රාමීය ජනතාවක් යළිත් වරක් දරිද්‍රතා රේඛාවෙන් පහළට ඇද වැටුණි. දළ දේශීය නිෂ්පාදිතයේ (GDP) වර්ධනයක් සංඛ්‍යාලේඛන මගින් ඇතැම්විට පෙන්නුම් කළද, එහි සැබෑ ප්‍රතිලාභ ග්‍රාමීය ප්‍රජාව වෙත සාධාරණව ගලා නොයාම හේතුවෙන් ජාතික ආර්ථික වර්ධනයේ සැබෑ අරුත ජනතාවට අත්විඳීමට නොහැකි වී ඇති බව ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් හඳුනාගෙන ඇත.

මෙවැනි ඓතිහාසික සහ ව්‍යුහාත්මක පසුබිමක් තුළ, සාම්ප්‍රදායික සුබසාධන ක්‍රමවේදයන්ගෙන් මුළුමනින්ම බැහැරව, ප්‍රජාව සක්‍රීය ආර්ථික කොටස්කරුවන් බවට පත් කිරීමේ පරමාර්ථයෙන් "ප්‍රජාශක්ති" ජාතික වැඩසටහන 2025 ජූලි මස 04 වන දින ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් නිල වශයෙන් හඳුන්වා දෙනු ලැබීය. මෙම වැඩසටහන ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීමේ උපායමාර්ගික සහ දාර්ශනික හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස සැලකිය හැකිය. විශේෂයෙන්ම, දිවයින පුරා විසිරී ඇති ග්‍රාම නිලධාරී වසම් 14,008 ක් ආවරණය වන පරිදි, රජයේ පරිපාලන යාන්ත්‍රණය, රාජ්‍ය නිලධාරීන් සහ සාමාන්‍ය පුරවැසියන් එකම අරමුණක් කරා ඒකාබද්ධ කරමින් ගොඩනගන ලද මෙම නව්‍ය ප්‍රවේශය, හුදු ආදායම් මත පදනම් වූ දිළිඳුකමෙන් ඔබ්බට ගොස් අධ්‍යාපනය, සෞඛ්‍යය, සහ ජීවන තත්ත්වය යන අංශයන්හි පවතින බහුමාන දරිද්‍රතාව (Multidimensional Poverty) සෘජුවම ආමන්ත්‍රණය කිරීම අරමුණු කරයි. "පොහොසත් රටක් - සුවබර දිවියක්" යන පුළුල් සහ යාවත්කාලීන රාජ්‍ය ප්‍රතිපත්තිය මත පදනම් වූ ප්‍රජාශක්ති වැඩසටහන, ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම සඳහා යෝජිත ප්‍රජා සහභාගීත්ව ආර්ථික සංවර්ධන මොඩලයේ කාර්යක්ෂමතාව, එහි ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය සහ ජාතික ආර්ථිකයට ඉන් සැලසෙන උපයෝගීතාව ශාස්ත්‍රීය වශයෙන් විමර්ශනය කිරීම මෙම පර්යේෂණ වාර්තාවේ මූලික අභිප්‍රාය වේ.

## අරමුණු

මෙම පර්යේෂණාත්මක වාර්තාවේ මූලික අරමුණු පහත පරිදි පෙළගැස්විය හැකිය:

1. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාවයේ ව්‍යුහාත්මක ස්වභාවය, ඊට බලපාන මූලික ආර්ථික හා සමාජීය හේතු සහ ඉන් උද්ගත වන බහුවිධ ගැටලු නූතන බහුමාන දරිද්‍රතා දර්ශකයන් (Multidimensional Poverty Index - MPI) ඇසුරින් විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීම.
2. ප්‍රජාශක්ති ජාතික වැඩසටහනේ දාර්ශනික පදනම, ආයතනික ව්‍යුහය, අරමුණු සහ එය සාම්ප්‍රදායික හා බණ්ඩනය වූ දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන්වලින් උපායමාර්ගිකව වෙනස් වන ආකාරය ගැඹුරින් අධ්‍යයනය කිරීම.
3. ප්‍රජා සංවර්ධන සභා (Community Development Councils) හරහා ග්‍රාමීය මට්ටමින් ගොඩනැගෙන ප්‍රජා සහභාගීත්ව ආර්ථික සංවර්ධන මොඩලයේ (Community Participatory Economic Development Model) ප්‍රායෝගික උපයෝගීතාව සහ සමාජ ප්‍රාග්ධනය ගොඩනැගීමේ ලා එහි කාර්යභාරය ඇගයීම.
4. "සංවර්ධිත ජාතියක්" සහ "පොහොසත් රටක් - සුවබර දිවියක්" යන සාර්ව ආර්ථික සහ සමාජීය ඉලක්ක සපුරා ගැනීම සඳහා මෙම නව යාන්ත්‍රණය මඟින් ලබාදෙන දායකත්වය සහ එහි තිරසරභාවය විමර්ශනය කිරීම.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණ වාර්තාව සම්පාදනය කිරීම සඳහා ද්විතියික දත්ත මූලාශ්‍ර මත පදනම් වූ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත ත්‍රිකෝණීකරණ ක්‍රමවේදයක් (Mixed-methods data triangulation approach) පුළුල් ලෙස භාවිත කර ඇත. ගුණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා ශ්‍රී ලංකා රජයේ නිල ප්‍රතිපත්ති ප්‍රකාශන, ප්‍රජාශක්ති ජාතික වැඩසටහනේ උපායමාර්ගික සැලසුම්, අමාත්‍ය මණ්ඩල තීරණ සහ ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් නිකුත් කරන ලද නිල වාර්තා ගැඹුරු අන්තර්ගත විශ්ලේෂණයකට (Content Analysis) ලක් කරන ලදී.

ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා, ලෝක බැංකුව (World Bank) විසින් නිකුත් කරන ලද සාර්ව ආර්ථික සහ දරිද්‍රතා යාවත්කාලීන වාර්තා (2024-2025) , එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතාව සහ මානව සංවර්ධන මූලපිරීම (OPHI) මඟින් සම්පාදනය කරන ලද ගෝලීය සහ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශක වාර්තා , මෙන්ම CGIAR ආයතනය විසින් මෙහෙයවන ලද BRIGHT (Building Resilience and Integrating Gender for Health and Transformation) ගෘහස්ථ සමීක්ෂණයේ (2024-2025) නවතම දත්ත පුළුල් ලෙස සමාලෝචනයට ලක් කර තිබේ. මෙම න්‍යායාත්මක සහ ආනුභවික (Empirical) දත්ත ඒකාබද්ධ කිරීම හරහා ග්‍රාමීය දරිද්‍රතාවයේ හේතු, ඵල සහ ප්‍රජාශක්ති වැඩසටහනේ ප්‍රතිපත්තිමය විසඳුම් අතර ඇති සහසම්බන්ධය විද්‍යාත්මකව සහ තර්කානුකූලව ගොඩනඟා ඇත.

සාකච්ඡාව

## 1. ග්‍රාමීය දුප්පත්කම නිර්වචනය

සාම්ප්‍රදායික ආර්ථික විද්‍යාත්මක කතිකාවත තුළ දරිද්‍රතාව නිර්වචනය කරනු ලැබුවේ පුද්ගලයෙකුගේ හෝ ගෘහයක දෛනික ආදායම නිශ්චිත දරිද්‍රතා රේඛාවකට (Poverty Line) වඩා අඩුවීම මත පදනම් වූ මූල්‍යමය හෝ පරිභෝජන දරිද්‍රතාවක් (Monetary or Consumption Poverty) ලෙසිනි. නිදසුනක් ලෙස, ලෝක බැංකු නිර්ණායක අනුව 2017 ගැනුම් බල සමානාත්මතාව (Purchasing Power Parity - PPP) පදනම් කරගනිමින් දිනකට ඇමරිකානු ඩොලර් 2.15 හෝ ඩොලර් 3.65 කට වඩා අඩුවෙන් උපයන පුද්ගලයින් මූල්‍යමය වශයෙන් අන්ත දිළිඳු ලෙස වර්ගීකරණය කෙරේ. එහෙත්, නූතන ශාස්ත්‍රීය සහ සමාජ විද්‍යාත්මක පර්යේෂණ තුළින් මෙම ද්විමය (Binary) ආදායම් වර්ගීකරණය ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල දරිද්‍රතාවයේ සැබෑ ගැඹුර මැනීමට ප්‍රමාණවත් නොවන බව තහවුරු කර ඇත. පුද්ගලයෙකුට දෛනිකව ඩොලර් 3.65 ක ආදායමක් ලැබුණද, එම පුද්ගලයාට නිසි සෞඛ්‍ය පහසුකම්, පිරිසිදු පානීය ජලය, හෝ ගුණාත්මක අධ්‍යාපනයක් නොමැති නම්, ඔහු සැබෑ අරුතින්ම දිළිඳුභාවයෙන් පෙළෙයි.

එබැවින්, වර්තමානයේ ග්‍රාමීය දිළිඳුකම වඩාත් යථාර්ථවාදීව නිර්වචනය කිරීම සඳහා 'බහුමාන දරිද්‍රතා දර්ශකය' (Multidimensional Poverty Index - MPI) ජාත්‍යන්තරව මෙන්ම ජාතිකව ද භාවිත කෙරේ. OPHI සහ UNDP ආයතන මගින් හඳුන්වා දුන් මෙම දර්ශකය, මූලික මාන (Dimensions) තුනක් යටතේ පුද්ගලයෙකු එදිනෙදා ජීවිතයේදී මුහුණ දෙන අතිච්ඡාදනය වන අහිමිවීම් (Overlapping deprivations) මනිනු ලබයි.

| මානය (Dimension) | දර්ශකය (Indicator) සහ බර තැබීම (Weight) | බහුමාන දරිද්‍රතාවට ලක්වීමේ නිර්ණායකය |
|---|---|---|
| **සෞඛ්‍යය (Health)** | පෝෂණය (1/6), ළමා මරණ (1/6) | පවුලේ සාමාජිකයෙකු මන්දපෝෂණයෙන් පෙළීම හෝ වසර 5ක් තුළ දරුවෙකු මිය ගොස් තිබීම. |
| **අධ්‍යාපනය (Education)** | පාසල් ගිය වසර ගණන (1/6), පාසල් පැමිණීම (1/6) | කිසිවෙකු වසර 6ක අධ්‍යාපනය ලබා නොතිබීම හෝ පාසල් වියේ දරුවෙකු පාසල් නොයාම. |
| **ජීවන තත්ත්වය (Living Standards)** | ඉවුම් පිහුම් ඉන්ධන, සනීපාරක්ෂාව, පානීය ජලය, | විදුලිය නොමැතිකම, අනාරක්ෂිත පානීය ජලය, |

| මානය (Dimension) | දර්ශකය (Indicator) සහ බර තැබීම (Weight) | බහුමාන දරිද්‍රතාවට ලක්වීමේ නිර්ණායකය |
|---|---|---|
| | විදුලිය, නිවාස, වත්කම් (එක් දර්ශකයකට 1/18 බැගින්) | දර/පොල්කටු භාවිතය, ප්‍රමාණවත් වත්කම් (ගුවන්විදුලි, රූපවාහිනී, ආදිය) නොමැතිකම. |

යම් ගෘහයක් මෙම සමස්ත දර්ශකවලින් තුනෙන් එකකට (1/3 හෝ 33.3%) වඩා අහිමිවීම්වලට ලක්ව ඇත්නම්, එම ගෘහය සහ එහි සියලුම සාමාජිකයින් බහුමාන වශයෙන් දරිද්‍රතාවයෙන් පෙළෙන බව (Multidimensionally poor) නිගමනය කෙරේ. මෙම දර්ශකයට අනුව ශ්‍රී ලංකාවේ වෙසෙන පුද්ගලයින්ගෙන් ආසන්න වශයෙන් හයෙන් එකක් (16.0%) බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙන අතර, ඉන් 80.9% ක්ම නියෝජනය කරන්නේ ග්‍රාමීය ජනගහනයයි. තවද, නූතන පර්යේෂණ මගින් දරිද්‍රතාව කාලීන මානයන් ඔස්සේ ද නිර්වචනය කරයි; එනම්, බාහිර කම්පන නිසා ඇතිවන තාවකාලික දරිද්‍රතාව (Transient poverty) සහ පරම්පරා ගණනාවක් පුරා පවතින නිදන්ගත දරිද්‍රතාව (Chronic poverty) වශයෙනි. විශේෂයෙන් ග්‍රාමීය ශ්‍රී ලංකාව තුළ මුල්බැස ඇත්තේ මෙම නිදන්ගත සහ බහුමාන දරිද්‍රතාව වන අතර, එය තනි අමාත්‍යාංශයකට හෝ තනි ව්‍යාපෘතියකට විසඳිය නොහැකි "සංකීර්ණ සහ බහුවිධ ගැටලුවක්" (Wicked Problem) ලෙස නූතන ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් නිර්වචනය කරනු ලබයි.

## 2. ලංකාවේ දුප්පත්කමට බලපෑ හේතු

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාව හුදකලා භූගෝලීය සංසිද්ධියක් නොව, ඓතිහාසික, ආර්ථික, දේශගුණික සහ ප්‍රතිපත්තිමය සාධක ගණනාවක සංකීර්ණ ජාලයක අන්තර්ක්‍රියාකාරිත්වයකි. මෙම හේතූන් ව්‍යුහාත්මකව සහ කාලීනව පහත පරිදි විශ්ලේෂණය කළ හැක.

**කෘෂිකර්මාන්තය මත පදනම් වූ ව්‍යුහාත්මක අසමානතාව:** ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනගහනය සමස්ත ජනගහනයෙන් 80-82% ක් පමණ වන අතර, රටේ භූමි ප්‍රමාණයෙන් අතිමහත් බහුතරයක් ග්‍රාමීය සහ කෘෂිකාර්මික කලාප ලෙස වර්ගීකරණය වේ. එහෙත්, ජාතික දළ දේශීය නිෂ්පාදිතයට (GDP) කෘෂිකාර්මික අංශයේ දායකත්වය 7% ක් පමණක් වන ඉතා පහළ අගයක් ගනී (මෙහි ධීවර අංශය 1.3% ක් සහ පශු සම්පත් 0.9% ක් වේ). ශ්‍රම බලකායෙන් 30% කට අධික පිරිසක් මෙම අංශයේ නියැළුණද, කෘෂිකාර්මික ගෘහ මූලිකයන් සිටින පවුල්වල දරිද්‍රතා අනුපාතය 40% ක් තරම් ඉහළ අගයක් ගනී. කුඩා හා ඛණ්ඩනය වූ ඉඩම් කට්ටි (Fragmented landholdings), පරිමාණ ආර්ථිකයන් නොමැතිකම (Poor economies of scale), දුර්වල මූල්‍ය සේවා හේතුවෙන් අඩු ආයෝජන මට්ටම් සහ නවීන තාක්ෂණය භාවිත නොකිරීම ග්‍රාමීය ගොවියා දරිද්‍රතාවයේ රඳවා තබන මූලික ව්‍යුහාත්මක හේතු

වේ. නාගරික ප්‍රදේශවල සාමාන්‍ය මාසික ආදායම රුපියල් 80,000 - 90,000 ක් පමණ වන විට, ඇතැම් ග්‍රාමීය පවුල්වල එය රුපියල් 10,000 ක් තරම් පහළ අගයක් ගැනීමෙන් මෙම ආර්ථික විෂමතාව මනාව පැහැදිලි වේ.

**සාර්ව ආර්ථික අර්බුද සහ ප්‍රතිපත්තිමය කම්පන:** 2019 වසරේ සිට 2022 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව මුහුණ දුන් සාර්ව ආර්ථික බිඳවැටීම ග්‍රාමීය දරිද්‍රතාව උග්‍ර කිරීමට දැඩිව බලපෑවේය. 2021 දී 13.1% ක්ව පැවති මූල්‍යමය දරිද්‍රතාව (ඩොලර් 3.65 ක රේඛාව යටතේ) 2022 වන විට 25.0% දක්වා දෙගුණ වූ අතර, එමගින් අලුතින් මිලියන 2.5 ක ජනතාවක් දරිද්‍රතා රේඛාවෙන් පහළට ඇද වැටුණි. 2022 දී උද්ධමනය 46% කින් ඉහළ යාම, කර්මාන්ත හා සේවා අංශයන්හි රැකියා කප්පාදුව හේතුවෙන් ශ්‍රමිකයින් අඩු ආදායම්ලාභී කෘෂිකාර්මික රැකියා වෙත තල්ලු වීම සහ විදේශ ප්‍රේෂණ පහත වැටීම මීට සෘජුවම බලපෑවේය. මීට අමතරව, 2021 වසරේ රජය විසින් හදිසියේ ගනු ලැබූ රසායනික පොහොර තහනම හේතුවෙන් ග්‍රාමීය කෘෂිකාර්මික ආදායම මුළුමනින්ම පාහේ කඩා වැටුණු අතර එය ග්‍රාමීය ආර්ථිකයට මාරාන්තික ප්‍රහාරයක් විය.

**අවකාශීය සහ භූගෝලීය විෂමතා (Spatial Inequalities):** ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය භූගෝලීය වශයෙන් අතිශයින් අසමාන වේ. බස්නාහිර පළාත සමස්ත පළාත් ආර්ථිකයෙන් 42% ක් නියෝජනය කරන අතර උතුරු පළාත නියෝජනය කරන්නේ 4.4% ක් පමණි. බස්නාහිර පළාතේ බහුමාන දරිද්‍රතාව 17% ක් වන විට, මධ්‍යම පළාතේ එය 38% ක් ද, වතුකරයේ 63% ක් ද වේ. තවද, උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනතාව පිළිවෙලින් 75% ක් සහ 65% ක් ලෙස ඉහළ බහුමාන අවදානමකට (Multidimensional vulnerability) ලක්ව ඇත. කොළඹ දිස්ත්‍රික්කයේ දරිද්‍රතාව 3.5% ක් වන විට නුවරඑළිය දිස්ත්‍රික්කයේ එය 44.2% ක් වීමෙන් මෙම භූගෝලීය ධ්‍රැවීකරණය මනාව තහවුරු වේ.

**දේශගුණික විපර්යාස සහ පාරිසරික කම්පන:** ග්‍රාමීය ආර්ථිකය සෘජුවම ස්වභාවධර්මය මත යැපෙන බැවින්, දේශගුණික විපර්යාස දරිද්‍රතාව වර්ධනය කරන ප්‍රධාන එන්ජිමක් බවට පත්ව ඇත. එල් නීනෝ (El Niño) වැනි දේශගුණික තත්ත්වයන් හේතුවෙන් ඇතිවන නියඟ සහ ගංවතුර තත්ත්වයන් ග්‍රාමීය කෘෂිකර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල කරයි. නිදසුනක් ලෙස, 2016-2017 වර්ෂවල ඇතිවූ එල් නීනෝ තත්ත්වය සහ මෑතකාලීන 'ඩිට්වා' (Ditwah) සුළි කුණාටුව හේතුවෙන් මිලියන ගණනක් ජනතාව පීඩාවට පත් වූ අතර, කෘෂිකාර්මික කන්න ගණනාවක් විනාශ වී ජල හිඟයක් නිර්මාණය විය. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 48.8% කට ආපදා පෙර සූදානමක් නොමැති අතර, ගෘහස්ථ ණය බරින් පසුව බහුමාන අවදානමට බලපාන ප්‍රධානතම සාධකය ලෙස ජල සුරක්ෂිතතාව නොමැතිකම (35.6% කට බලපායි) හඳුනාගෙන ඇත.

**ණයගැතිභාවය සහ මූල්‍ය අස්ථාවරත්වය:** නූතන ග්‍රාමීය දරිද්‍රතාවයේ අදෘශ්‍යමාන එහෙත් ප්‍රබලතම සාධකය වන්නේ ඵලදායී නොවන ණය (Unproductive debt) ලබා ගැනීමයි. විශේෂයෙන්ම ග්‍රාමීය කාන්තාවන් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල (Microfinance institutions) අධික පොලී අනුපාත සහ සූරාකෑමේ ණය කොන්දේසි හේතුවෙන් ග්‍රාමීය ගෘහස්ථයන්

දැඩි ණය උගුලකට හිර වී ඇත. යැපුම් වියදම් පියවා ගැනීම සඳහා නිරන්තරයෙන් ණය ලබා ගැනීම හේතුවෙන් ඔවුන්ගේ ආර්ථික සංචලතාව (Economic mobility) මුළුමනින්ම අඩාල වී තිබේ.

### 3. දුප්පත්කම නිසා ඇතිවන ගැටලු

ග්‍රාමීය දරිද්‍රතාව හුදෙක් ආර්ථික ඌනතාවක් පමණක් නොවන අතර, එය සමස්ත සමාජ දේහය පුරා විහිදෙන සහ පරම්පරාගතව පැවතෙන ගැටලු රාශියක් නිර්මාණය කරයි.

**ආහාර අනාරක්ෂිතතාව සහ මන්දපෝෂණය:** BRIGHT (2024-2025) සමීක්ෂණ දත්ත පෙන්වා දෙන පරිදි ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමින් 33% ක් සහ ග්‍රාමීය ජනගහනයෙන් 31% ක් දරුණු ආහාර අනාරක්ෂිතතාවයෙන් (Food insecurity) පෙළෙති. ආදායම් මාර්ග කඩා වැටීම හමුවේ ගෘහස්ථයන් සිය ආහාර පරිභෝජන රටාවන් වෙනස් කිරීම නිසා, විශේෂයෙන්ම ළමා පෝෂණය බරපතල තර්ජනයකට ලක්ව ඇත. 2021 දී 7.4% ක්ව පැවති වයස අවුරුදු පහට අඩු දරුවන්ගේ මන්දපෝෂණ සහ මිටි වීමේ තත්ත්වය (Wasting and Stunting) 2022 වන විට 9.4% දක්වා ඉහළ ගොස් ඇත. වඩාත් ඛේදනීය තත්ත්වය වන්නේ අවුරුදු 0-4 අතර දරුවන්ගෙන් 33.4% ක් බහුමාන දරිද්‍රතාවයෙන් මෙන්ම මන්දපෝෂණයෙන් ද පෙළීමයි. මෙය අනාගත මානව ප්‍රාග්ධනය කායිකව සහ මානසිකව දුර්වල කිරීමකි.

**සෞඛ්‍ය සහ සනීපාරක්ෂක අර්බුද:** ආදායම් අහිමි වීමත් සමඟ ග්‍රාමීය පවුල් සෞඛ්‍ය සහ අධ්‍යාපනය සඳහා කරන වියදම් කප්පාදු කිරීම සෘණාත්මක අනුවර්තන යාන්ත්‍රණයක් (Negative coping mechanism) බවට පත් කරගෙන ඇත. ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන වැඩිහිටියන් අතර බෝනොවන රෝග ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. දියවැඩියාව 13.5% ක්, අධි රුධිර පීඩනය 16.7% ක්, සහ අධික තරබාරුව 28.2% ක් ලෙස වාර්තා වන අතර, වකුගඩු රෝගය (CKDu) ප්‍රධාන සෞඛ්‍ය ගැටලුවක් බවට පත්ව ඇත. පිරිසිදු පානීය ජලය නොමැතිකම මීට සෘජුවම බලපා ඇත. මීට අමතරව, ග්‍රාමීය පවුල්වලින් 61% කට ශීතකරණයක් නොමැති වීම, 72% ක් කසළ විවෘතව පිළිස්සීම, සර්ප දෂ්ට කිරීම් (15.5%) සහ සුනඛ සපා කෑම් (9.7%) වැනි ගැටලු ද ඔවුන්ගේ එදිනෙදා ජීවන තත්ත්වය අවදානමට ලක් කර ඇත. මානසික පීඩනය හේතුවෙන් සියදිවි නසාගැනීම් හෝ ඒ සඳහා උත්සාහ කිරීම් 3.0% ක් දක්වා වර්ධනය වී තිබීම අතිශය කණගාටුදායක තත්ත්වයකි.

**මානව ප්‍රාග්ධනය ඛාදනය වීම සහ සමාජ පරිහානිය:** ඉන්ධන හිඟය, ප්‍රවාහන අර්බුද සහ මූල්‍ය අපහසුතා හේතුවෙන් ග්‍රාමීය පාසල් දරුවන්ගේ අධ්‍යාපනය දැඩි ලෙස කඩාකප්පල් වී ඇත. විශේෂයෙන්ම 5 වන ශ්‍රේණියෙන් පසු පාසල් හැරයාමේ අනුපාතය ග්‍රාමීය අංශයේ ඉහළ අගයක් ගනී. නිසි අධ්‍යාපනයක් නොලැබීම හේතුවෙන් ග්‍රාමීය තරුණ ප්‍රජාව විරැකියාවට ලක්වන අතර, විශේෂයෙන් ග්‍රාමීය කාන්තාවන්ගේ විරැකියා අනුපාතය 76% ක් තරම් ඉහළ අගයක් ගෙන ඇත (පිරිමි විරැකියාව 25% කි). මෙම අසහනකාරී තත්ත්වය මත තරුණ ප්‍රජාව මත්ද්‍රව්‍ය භාවිතයට (පිරිමින්ගෙන් 22.1% ක් දුම්පානයට සහ 12.3% ක් මත්පැන් භාවිතයට ඇබ්බැහි වී ඇත) සහ විවිධ අපරාධවලට

යොමු වීමේ ප්‍රවණතාවක් නිර්මාණය වී ඇති අතර, එය සමස්ත ප්‍රජාවේම සමාජ ආරක්ෂාව අනතුරේ හෙළයි.

### 4. දුප්පත්කම නිම කිරීමේ අවශ්‍යතාව

දරිද්‍රතාව පිටුදැකීම හුදෙක් මානුෂීය සහ කාරුණික වගකීමක් පමණක් නොව, එය රටක සාර්ව ආර්ථික ස්ථාවරත්වය, ජාතික ආරක්ෂාව සහ සමාජ සාධාරණත්වය සඳහා වන අනිවාර්ය පූර්ව අවශ්‍යතාවකි (Prerequisite). ලෝක බැංකුවේ දත්තවලට අනුව, 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 5% ක අපේක්ෂිත වර්ධනයක් අත්පත් කර ගත්තද, ආර්ථික වර්ධන අනුපාත සංඛ්‍යාලේඛනවලින් කෙතරම් ඉහළ ගියත්, රටේ ජනගහනයෙන් 80% කට ආසන්න ග්‍රාමීය අංශය එම වර්ධනයේ සෘජු ප්‍රතිලාභීන් හෝ සක්‍රීය කොටස්කරුවන් බවට පත් නොවන්නේ නම් එම සංවර්ධනය අර්ථශූන්‍ය බව ජනාධිපතිවරයා පවා අවධාරණය කර ඇත.

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals - SDGs) අතුරින් ප්‍රමුඛතම සහ පළමුවන ඉලක්කය වන්නේ "සියලු ස්වරූපයේ දරිද්‍රතාව සෑම තැනකින්ම තුරන් කිරීමයි" (Goal 1: No Poverty). රටක සමස්ත නිෂ්පාදන ධාරිතාව (Productive capacity) පුළුල් කිරීම සඳහා ග්‍රාමීය මානව ප්‍රාග්ධනය පූර්ණ වශයෙන් උපයෝගී කරගත යුතුය. වර්තමානයේ ග්‍රාමීය ශ්‍රී ලංකාවේ යැපුම් අනුපාතය (Dependency ratio) 50% ක් තරම් ඉහළ අගයක් ගන්නා අතර, වැඩිහිටි ජනගහනය (වයස අවුරුදු 65 ට වැඩි) මෙරට දුප්පත්ම සමාජ ස්තරය (17.9% ක දරිද්‍රතා අනුපාතයක් සහිතව) බවට පත්ව ඇත. දරිද්‍රතාව හේතුවෙන් අධ්‍යාපනය සහ සෞඛ්‍ය පිරිහීම යනු අනාගත ශ්‍රම බලකායේ ගුණාත්මකභාවය සෘජුවම පිරිහීමයි. එමනිසා, සමාජ අසමානතා සහ ධ්‍රැවීකරණය අවම කර, සමාජ සාධාරණත්වය ස්ථාපිත කරමින් තිරසර හා අන්තර්ගත ආර්ථික වර්ධනයක් (Inclusive sustainable economic growth) සහතික කිරීම සඳහා දරිද්‍රතාව නිම කිරීම ප්‍රතිපත්තිමය වශයෙන් අත්‍යවශ්‍ය වේ.

### 5. ප්‍රජා ශක්ති වැඩසටහන හැඳින්වීම

මෙම සියලු ව්‍යුහාත්මක අර්බුදයන්ට පිළියමක් ලෙස සහ ශ්‍රී ලංකා රජයේ කේන්ද්‍රීය ප්‍රතිපත්තිමය මුලපිරීමක් ලෙස 2025 ජූලි 04 වන දින "ප්‍රජාශක්ති" (Praja Shakthi) ජාතික වැඩසටහන නිල වශයෙන් කොළඹ අරලියගහ මන්දිරයේදී දියත් කරන ලදී. සාම්ප්‍රදායිකව දේශපාලන හිතවත්කම් මත බෙදා දෙන ලද සුබසාධනවාදී සහ සහනාධාර ක්‍රමවේදයන්ගෙන් මුළුමනින්ම බැහැර වන මෙම වැඩසටහන, "ප්‍රජාව සවිබල ගැන්වීම සහ පුරවැසි සහභාගීත්වය" පදනම් කරගත් දැවැන්ත ව්‍යුහාත්මක සහ දේශපාලනික ප්‍රතිසංස්කරණයකි.

ප්‍රජාශක්ති වැඩසටහන මගින් ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරී වසම් 14,008 ම ආවරණය වන පරිදි රජයේ අමාත්‍යාංශ සහ ආයතන ඒකාබද්ධ කරමින් රුපියල් බිලියන 180 ක දැවැන්ත ප්‍රතිපාදනයක් ග්‍රාමීය ආර්ථිකය සහ සමාජ සවිබලගැන්වීම වෙනුවෙන් වෙන් කර ඇත. මෙම වැඩසටහනේ සුවිශේෂත්වය

වන්නේ එය හුදෙක් මූල්‍යමය දිළිඳුකම පමණක් ආමන්ත්‍රණය කිරීම වෙනුවට, සෞඛ්‍ය, අධ්‍යාපන, පෝෂණ, ප්‍රවාහන සහ යටිතල පහසුකම් යන අංශයන්හි පවතින "බහුමාන දරිද්‍රතාව" ඒකාබද්ධ ප්‍රවේශයක් (Integrated approach) හරහා ආමන්ත්‍රණය කිරීමයි. ඓතිහාසිකව ප්‍රථම වතාවට, දරිද්‍රතාව පිටුදැකීමේ වැඩසටහනක් තුළ "අධ්‍යාපනය" මූලික සහ හරයාත්මක අංගයක් ලෙස විධිමත්ව හඳුනාගෙන ඇත.

ප්‍රජාශක්ති ව්‍යාපාරය දරිද්‍රතාව හඳුනාගන්නේ සරල, තනි හේතුවක් මත පදනම් වූ ගැටලුවක් ලෙස නොව, අඛණ්ඩ පාලනයක් සහ අනුවර්තනයක් අවශ්‍ය වන "සංකීර්ණ සහ බහුවිධ ගැටලුවක්" (Wicked Problem) ලෙසයි. රජය, රාජ්‍ය නිලධාරීන් සහ සාමාන්‍ය පුරවැසියන් අතර පවතින පරතරය (Government-People Gap) අවම කරමින්, ඔවුන් සියල්ලන්ම එකම ඒකාබද්ධ රාමුවකට ගෙන ඒම මෙහි මූලික අරමුණයි. පරිපාලනමය වශයෙන්, මෙය දේශපාලනඥයින්, නිලධාරීන් සහ පුරවැසියන් එකිනෙකාට වගකියන "ත්‍රිකෝණාකාර වගවීම් පද්ධතියක්" (Triangular accountability system) හඳුන්වා දී ඇති අතර, ඉහළ සිට පහළට විධාන දෙනවා වෙනුවට, පුරවැසි හඬට සවන් දෙන 'ශ්‍රවණ පද්ධතියක්' (Listening system) ලෙස ක්‍රියාත්මක වේ.

### 6. ප්‍රජා සංවර්ධන සභාවල කාර්යභාරය

ප්‍රජාශක්ති වැඩසටහනේ හදවත බඳු ක්‍රියාකාරී ඒකකය වන්නේ දිවයින පුරා සෑම ග්‍රාම නිලධාරී වසමකම (වසම් 14,008 තුළම) පිහිටුවනු ලබන 'ප්‍රජා සංවර්ධන සභා' (Community Development Councils - CDC) ය. ඉහළ නිලධාරීන් සහ දේශපාලඥයින් විසින් කොළඹ කේන්ද්‍රීයව තීරණ ගෙන පහළට ක්‍රියාත්මක කරන (Top-down) සාම්ප්‍රදායික නිලධාරිවාදී රාමුව බිඳ දමමින්, ග්‍රාමීය ප්‍රජාවට තමන්ගේ සංවර්ධනය පිළිබඳ තීරණ ගැනීමේ බලය ලබා දෙන ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයක් (Democratic innovation) මෙම සභා මගින් නිර්මාණය කර ඇත.

ප්‍රජා සංවර්ධන සභාවක සභාපතිවරයා ප්‍රාදේශීය සංවර්ධන කමිටුව මගින් පත්කරනු ලබන අතර, එහි ලේකම්වරයා ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු කටයුතු කරයි. මෙම සභාවල නියෝජනය අතිශයින් පුළුල් වන අතර, ඊට විද්වතුන්, ව්‍යවසායකයින්, ව්‍යාපාරිකයින්, කර්මාන්තකරුවන්, කාන්තාවන්, තරුණ නියෝජිතයින් සහ රාජ්‍ය සේවකයින් ඇතුළත් වේ.

ප්‍රජා සංවර්ධන සභාවල මූලික කාර්යභාරයන් සහ යාන්ත්‍රණය පහත පරිදි වේ:

1. **ග්‍රාමීය අවශ්‍යතා සහ අවදානම් කණ්ඩායම් හඳුනාගැනීම:** තම ගම්මානයේ සැබෑ අවශ්‍යතා සහ බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙන, සමාජ ආරක්ෂණ ජාලයන් අවශ්‍ය කරන අවදානම් සහිත කණ්ඩායම් (උදා: වැඩිහිටියන්, මන්දපෝෂිත දරුවන්, විරැකියා තරුණයින්) හඳුනාගැනීම.
2. **දත්ත වලංගුකරණය සහ ප්‍රාථමික දත්ත සැකසීම (Village Baseline):** ගම්මානය සතු සම්පත් සහ අභිමිවීම් සම්බන්ධයෙන් වන ප්‍රාථමික දත්ත, ඉහළින් පනවන සමීක්ෂණයක් හරහා නොව, ප්‍රජා සාකච්ඡා සහ සාමූහික පරාවර්තනය (Collective reflection) හරහා රැස් කිරීම සහ වලංගු

කිරීම. මෙම දත්ත ගම්මානයේම දේපළක් බවට පත්වේ.

3. **ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සැලසුම් (IVDPs):** මෙම ප්‍රාථමික දත්ත මත පදනම්ව, ගම්මානයට ගැළපෙන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ඒවා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හරහා අනුමත කරවා ගැනීම.
4. **ද්විත්ව නිරීක්ෂණ යාන්ත්‍රණය (Dual Monitoring System):** ව්‍යාපෘතිවල ප්‍රගතිය පුරවැසියන් විසින් ඩිජිටල් උපකරණ (Scorecards) හරහා නිරීක්ෂණය කරන අතරම, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් එය විද්‍යාත්මකව ද නිරීක්ෂණය කරනු ලබයි.

මෙම සභාවන් මගින් ප්‍රජාව තුළ සැඟවී ඇති ස්වේච්ඡාභාවය (Voluntary spirit) සහ සමාජ සහජීවනය වර්ධනය කරමින් තිරසර සංවර්ධනයක් කරා ගම්මානය මෙහෙයවනු ලබයි.

## 7. ප්‍රජා සහභාගීත්ව ආර්ථික සංවර්ධන මොඩලය

ප්‍රජාශක්ති වැඩසටහන විසින් ගොඩනඟන 'ප්‍රජා සහභාගීත්ව ආර්ථික සංවර්ධන මොඩලය' (Community Participatory Economic Development Model) යනු පුරවැසියන් රජයේ සේවාවන්හි හුදු නිෂ්ක්‍රීය ප්‍රතිලාභීන් (Passive beneficiaries) යන තත්ත්වයෙන් මුදාගෙන, ඔවුන් සමාජ-ආර්ථික සහ දේශපාලන ක්‍රියාවලියේ සක්‍රීය නියමුවන් බවට පත් කිරීමේ විප්ලවීය ආකෘතියකි. ප්‍රභූවාදය (Elitism) පෝෂණය වන්නේ ජනතාවගේ නිෂ්ක්‍රීයභාවය මත බව හඳුනාගෙන ඇති රජය, මෙම මොඩලය හරහා ග්‍රාමීය පුරවැසියා ආර්ථිකයේ සැබෑ කොටස්කරුවෙකු බවට පරිවර්තනය කරයි.

මෙම මොඩලයේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දේශපාලන බලපෑම්වලින් තොර 'ප්‍රජාශක්ති සමායෝජකයින්' (Praja Shakthi Coordinators) පත් කරනු ලැබේ. ඔවුන්ගේ ප්‍රධාන වගකීම වන්නේ ග්‍රාමීය මට්ටමින් සුබසාධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම, කාන්තා සහ තරුණ සමිති පිහිටුවා ඒවා හරහා ස්වේච්ඡා සේවාවන් සංවිධානය කිරීම, සෞඛ්‍ය සහ අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම් සිදු කිරීම සහ ජනතාවගේ ප්‍රතිචාර (Public feedback) සෘජුවම පරිපාලන යාන්ත්‍රණය වෙත ලබා දීමයි.

මෙම ආකෘතිය මූලික වශයෙන් සමුපකාර ක්‍රමවේදයන් (Cooperative models) සහ පොදු අයිතිය මත පදනම් වේ. මේ සඳහා සාර්ථක පූර්වාදර්ශයන් රැසක් මේ වන විටත් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සභා මට්ටමින් දැකගත හැකිය. නිදසුනක් ලෙස, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කළ 'කටුපත්වැව' ජල සම්පාදන ව්‍යාපෘතිය හරහා ග්‍රාමීය ප්‍රජාවගේ සක්‍රීය දායකත්වයෙන් ඔවුන්ට පැය 24 පුරා පිරිසිදු ජලය ලබා ගැනීමේ පහසුකම උදා කර දීම දැක්විය හැක. එසේම, යාපනය දිස්ත්‍රික්කයේ වලිගාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ සභායෙන් ක්‍රියාත්මක වන 'චංකානෙයි' (Chankanai) ආහාර මධ්‍යස්ථානය හරහා ග්‍රාමීය කාන්තාවන් 16 දෙනෙකුට ස්ථාවර ආදායම් මාර්ගයක් සකසා දීමත්, නැගෙනහිර පළාතේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ කාන්තාවන් 60 කට ආසන්න පිරිසකට පාවහන් සහ බෑග් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ඔස්සේ රැකියා උත්පාදනය

කිරීමත් මෙම ප්‍රජා සහභාගීත්ව මොඩලයේ සැබෑ ප්‍රායෝගික සාර්ථකත්වයන් ය. මෙමගින් ග්‍රාමීය සමාජය තුළ 'සමාජ ප්‍රාග්ධනය' (Social Capital) සහ සාකච්ඡාමය තීරණ ගැනීමේ හැකියාව (Deliberative decision making) වර්ධනය වේ.

## 8. ප්‍රජාව සවිබලගැන්වීමෙන් දරිද්‍රතාව නිමාවීමට අදාළ ව්‍යාපෘති

ප්‍රජාශක්ති වැඩසටහන ග්‍රාමීය දරිද්‍රතාව තුරන් කිරීම සඳහා හුදකලා ව්‍යාපෘති වෙනුවට එකිනෙකට සම්බන්ධිත මූලික කුළුණු 06 ක් (Six Pillars) මත පදනම් වූ සංවර්ධන ප්‍රවේශයක් අනුගමනය කරයි. 2026 වර්ෂය සඳහා පමණක් මෙම කුළුණු හය යටතේ ප්‍රජා සංවර්ධන සභා මගින් යෝජනා කරන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රජය විසින් රුපියල් බිලියන 25 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

| මූලික කුළුණ (Pillar) | අදාළ ව්‍යාපෘති සහ අරමුණු |
|---|---|
| **1. සමාජ පරිසරය (Social Environment)** | සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම, මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික මෙහෙයුම්, කාන්තා සහ ළමා අපයෝජන වැළැක්වීමේ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ස්වේච්ඡා ප්‍රජා ජාල ගොඩනැගීම. |
| **2. ආහාර සුරක්ෂිතතාව (Food Security)** | දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන කෘෂිකාර්මික පිළිවෙත් (Climate-smart agriculture) හඳුන්වා දීම, ඉපැරණි වැව් ආශ්‍රිත ජල කළමනාකරණ පද්ධති නවීකරණය කිරීම (උදා: CRIWMP ව්‍යාපෘතිය) සහ පෝෂණ වැඩසටහන්. |
| **3. සැපයුම් දාම කළමනාකරණය (Supply Chain Management)** | ග්‍රාමීය කෘෂිකාර්මික හා අත්කම් නිෂ්පාදකයින් අතරමැදියන්ගේ ග්‍රහණයෙන් මුදාගෙන සෘජුවම වෙළෙඳපොළ සහ ගැනුම්කරුවන් වෙත සම්බන්ධ කිරීම සඳහා ඩිජිටල් වේදිකා සහ ප්‍රවාහන පහසුකම් දියුණු කිරීම. |
| **4. මානව ප්‍රාග්ධන සංවර්ධනය (Human Capital Development)** | පාසල් හැරයාම වැළැක්වීම, වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම, සහ තෙවන පාර්ශවීය මැදිහත්වීම් (උදා: Third Space Learning වැනි කෘතිම බුද්ධිය ආශ්‍රිත අධ්‍යාපන වේදිකා) හරහා ග්‍රාමීය දරුවන්ගේ අධ්‍යාපන පරතරය පියවීම. |
| **5. ආරක්ෂාව (Protection)** | වඩාත් අවදානමට ලක්විය හැකි පිරිස් (වැඩිහිටියන්, ආබාධිතයින්, සහ නිදන්ගත රෝගීන්) සඳහා විධිමත් සමාජ ආරක්ෂණ ජාල (Social safety nets) ක්‍රියාත්මක කිරීම සහ අස්වැසුම වැනි සුබසාධන යෝජනා ක්‍රම දේශපාලන බලපෑම්වලින් තොරව සැබෑ |

| මූලික කුළුණ (Pillar) | අදාළ ව්‍යාපෘති සහ අරමුණු |
|---|---|
| | අවශ්‍යතා ඇති අයට ඉලක්කගතව ලබා දීම. |
| **6. නිෂ්පාදන ආර්ථිකය (The Production Economy)** | සාම්ප්‍රදායික යැපුම් කෘෂිකර්මාන්තයෙන් මිදී ඵලදායී, කාර්යක්ෂම සහ ලාභදායී ව්‍යවසායකත්වයක් කරා ග්‍රාමීය ආර්ථිකය පරිවර්තනය කිරීම. සමුපකාර පදනමින් කර්මාන්ත ශාලා සහ වටිනාකම් එකතු කිරීමේ මධ්‍යස්ථාන ආරම්භ කිරීම. |

**නව්‍ය තාක්ෂණික සහ පරිපාලනමය මැදිහත්වීම:** මෙම ව්‍යාපෘති ඉලක්කගතව ක්‍රියාත්මක කිරීම සඳහා Prajashakthi Management Information System (MIS) නමින් නවීන පාලන පද්ධතියක් හඳුන්වා දී ඇත. මෙහි ඇති සුවිශේෂීම අංගය වන්නේ භූගෝලීය තොරතුරු පද්ධති (GIS) තාක්ෂණය භාවිතයෙන් අවකාශීය පාලනයක් (Spatial Governance) සිදු කිරීමයි. මේ හරහා ග්‍රාමීය මට්ටමේ දරිද්‍රතාව බහුල කලාප, යටිතල පහසුකම්වල අඩුපාඩු පවතින ස්ථාන සහ රෝගාබාධ බහුල ප්‍රදේශ ඩිජිටල් සිතියම් මත නිරූපණය කෙරේ. මේ අනුව, හුදු දේශපාලනඥයාගේ අභිමතය පරිදි නොව, විද්‍යාත්මක දත්ත මත පදනම්ව 'මෙහෙයුම් කේන්ද්‍රීය' (Mission-oriented) ව්‍යාපෘති අදාළ ප්‍රදේශ වෙත යොමු කිරීම සහතික කෙරේ. 'තුලා අරුන්දතී න්‍යාය' (Thula Arundhati Nyaya) අනුගමනය කරමින්, ඉතා සරල වලාකුළු තාක්ෂණික (Cloud-based) පෝරම භාවිතයෙන් ඩිජිටල් සාක්ෂරතාව අඩු ග්‍රාමීය ජනතාවට පවා මෙම පද්ධතිය සමඟ පහසුවෙන් ගනුදෙනු කිරීමට පහසුකම් සලසා තිබේ.

## 9. සංවර්ධිත ජාතියක්

ග්‍රාමීය ජනතාව නිරන්තරයෙන්ම රජයේ සහනාධාර මත යැපෙන, යැපුම් මානසිකත්වයකින් යුත් සමාජයක් ලෙස පවතින තාක් කල් ශ්‍රී ලංකාවට කිසිදිනෙක සංවර්ධිත ජාතියක් ලෙස ලෝකය ඉදිරියේ නැගී සිටිය නොහැක. ප්‍රජාශක්ති වැඩසටහන හරහා රජය මූලිකවම අපේක්ෂා කරන්නේ ශ්‍රී ලංකාව සහනාධාර ලබන ආර්ථිකයක සිට දියුණු 'නිෂ්පාදන ආර්ථිකයක්' (Production Economy) කරා පරිවර්තනය කිරීමයි. දේශීය ස්වභාවික සම්පත්, ඛනිජ සම්පත්, සාගර සම්පත් මෙන්ම තොරතුරු හා මෘදුකාංග තාක්ෂණය ද සම්මිශ්‍රණය කරමින් ග්‍රාමීය ආර්ථිකය නවීකරණය කිරීම මෙහිදී අත්‍යවශ්‍ය වේ.

සංවර්ධිත ජාතියක් යනු හුදෙක් ඉහළ දළ දේශීය නිෂ්පාදිතයක් (GDP) හෝ ඒක පුද්ගල ආදායමක් ඇති රටක් පමණක් නොවේ; එය මානව ගෞරවය, සමානාත්මතාව, නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් තහවුරු වූ සමාජයකි. ප්‍රජාශක්ති MIS පද්ධතිය හරහා පුරවැසියන්ට රජයේ ව්‍යාපෘති සඳහා අනුමැතිය ලැබී ඇති ආකාරය, ඒවායේ ප්‍රගතිය සහ සිදුවන ප්‍රමාදයන් විනිවිදභාවයකින් යුතුව නිරීක්ෂණය කිරීමට ඉඩ සලසා දීමෙන් ප්‍රායෝගික ප්‍රජාතන්ත්‍රවාදය සහ රාජ්‍ය පරිපාලනයේ

වගවීම තහවුරු කර ඇත. ජාතික ඩිජිටල් ආර්ථිකයක් නිර්මාණය කිරීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා පහළම පරිපාලන ඒකකය වන ග්‍රාම නිලධාරී වසමේ සිටම සියලුම රාජ්‍ය සේවා ඩිජිටල්කරණය කිරීම (Digitization) ප්‍රජාශක්ති වැඩසටහන ඔස්සේ සිදුවන අතර, එමගින් කාර්යක්ෂම සහ දූෂණයෙන් තොර රාජ්‍ය සේවාවක් ජනතාවට සමීප කරනු ලබයි. මෙම පරිවර්තනය ග්‍රාමීය ජනතාව ජාතික ආර්ථිකයේ සැබෑ කොටස්කරුවන් බවට පත් කරන අතරම, ජාතියේ සමස්ත ඵලදායිතාව ස්ථාවරව ඉහළ නැංවීමට මූලික අඩිතාලම දමයි.

## 10. පොහොසත් රටක් - සුවබර දිවියක්

"පොහොසත් රටක් - සුවබර දිවියක්" (A Thriving Nation - A Secure/Beautiful Life) යනු හුදෙක් මැතිවරණ දේශපාලන උද්ඝෝෂණයක් පමණක් නොව, එය වර්තමාන රජයේ සමස්ත ප්‍රතිපත්ති රාමුව හැඩගස්වන දාර්ශනික පදනම සහ සංවර්ධන මාලිමාව වේ. මෙහි "පොහොසත් රටක්" යන්නෙන් අදහස් කරන්නේ භෞතික සම්පත්වලින් සහ නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වූ, ගෝලීය වශයෙන් තරගකාරී ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැගීමයි. අනෙක් අතට "සුවබර දිවියක්" යන්නෙන් ගම්‍ය වන්නේ එම භෞතික සහ ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ සීමිත ප්‍රභූ පැලැන්තියකට හෝ නාගරික කේන්ද්‍රයකට පමණක් සීමා නොවී, සමාජයේ පහළම ස්තරය දක්වා සමාන සහ සාධාරණ ව්‍යාප්තියක් (Equitable distribution) සහතික කිරීමයි.

මෙතෙක් කල් සංවර්ධනය නාමයෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල ප්‍රතිලාභ අත්පත් කරගනු ලැබුවේ දූෂිත දේශපාලන සහ නිලධාරී ජාලයන් විසිනි. ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය යනු මෙම අසාධාරණ ක්‍රමය වෙනස් කරමින්, "පොහොසත් රටක් - සුවබර දිවියක්" යන දර්ශනය භූමිය මත යථාර්ථයක් බවට පත් කරන ප්‍රායෝගික යන්ත්‍රණයයි. මිනිසා පොළොවේ අයිතිකරුවා නොව, ස්වභාවධර්මයේ එක් අංගයක් පමණක්ය යන දාර්ශනික සංකල්පය මත පිහිටා, පරිසර හිතකාමී සහ දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන තිරසර සංවර්ධනයක් උදෙසා කටයුතු කිරීම මෙම ප්‍රතිපත්තියේ මූලිකාංගයකි. සෞඛ්‍ය සම්පන්න, නිසි අධ්‍යාපනයක් ලැබූ, ආර්ථික වශයෙන් ස්වාධීන සහ සමාජීය වශයෙන් වගකීම් සහගත ග්‍රාමීය පුරවැසියෙකු නිර්මාණය කිරීම ඔස්සේ, අවසාන වශයෙන් ජාතික මට්ටමේ සමාජ සුරක්ෂිතතාව සහ සුවබර ජීවන තත්ත්වයක් සෑම පුරවැසියෙකුටම ළඟා කර දීම ප්‍රජාශක්ති වැඩසටහනේ අවසන් පරමාර්ථය වේ.

## සමාලෝචනය

මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය මගින් තහවුරු වන ප්‍රධානතම කරුණ නම්, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාව යනු ආදායම් නොමැතිකමට පමණක් සීමා වූ සරල මූල්‍යමය ගැටලුවක් නොව, අධ්‍යාපනය, සෞඛ්‍යය, යටිතල පහසුකම් සහ දේශපාලන ක්‍රියාවලිය වෙත ප්‍රවේශය අහිමි වීම මත පදනම් වූ අතිශය සංකීර්ණ බහුමාන අර්බුදයක් (Wicked problem) බවයි. දශක ගණනාවක් පුරා විවිධ රජයන් විසින් හඳුන්වා දුන් ඛණ්ඩනය වූ සහනාධාර සහ සුබසාධන ව්‍යාපෘති මගින් ග්‍රාමීය ජනතාවගේ යැපුම්

මානසිකත්වය පෝෂණය කළා මිස, ඔවුන් දරිද්‍රතා චක්‍රයෙන් සහ ණය උගුලෙන් සදාකාලිකව මුදවා ගැනීමට සමත් වූයේ නැත.

එවන් පසුබිමක් තුළ, "ප්‍රජාශක්ති" ජාතික වැඩසටහන ශ්‍රී ලාංකේය සංවර්ධන ගමන්මඟෙහි සුවිශේෂී ආදර්ශ විතැන්වීමක් (Paradigm shift) නිරූපණය කරයි. එය රජය විසින් ජනතාවට ඉහළ සිට පහළට සහනාධාර බෙදා දෙන ඒකපාර්ශ්වික නිලධාරිවාදී ක්‍රියාවලියක සිට, ප්‍රජා සංවර්ධන සභා හරහා පුරවැසියන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධ කරගන්නා ප්‍රජා සහභාගීත්ව ආකෘතියක් දක්වා වූ ගැඹුරු පරිවර්තනයකි. නවීන ඩිජිටල් තාක්ෂණය (MIS සහ GIS) භාවිතයෙන් දත්ත මත පදනම් වූ (Data-driven) විනිවිදභාවයෙන් යුත් පරිපාලන ව්‍යුහයක් ගොඩනැගීමත්, සෞඛ්‍යය හා අධ්‍යාපනය දරිද්‍රතාව පිටුදැකීමේ මූලික මෙවලම් ලෙස ප්‍රතිපත්තිමය වශයෙන් ඒකාබද්ධ කිරීමත් මෙම වැඩසටහනේ අනාගත සාර්ථකත්වයට හේතු වන ප්‍රබල ධනාත්මක සාධක වේ.

කෙසේ වෙතත්, ප්‍රතිපත්තිමය වශයෙන් කෙතරම් ශක්තිමත් වුවද, මෙම වැඩසටහනේ සැබෑ උපයෝගීතාව රඳා පවතින්නේ අදාළ සැලසුම් කෙතරම් දුරට ප්‍රායෝගිකව සහ දේශපාලන මැදිහත්වීම්වලින් තොරව බිම් මට්ටමේ ක්‍රියාත්මක වන්නේද යන්න මතය. ප්‍රජාශක්ති සමායෝජකයින්ගේ (Coordinators) අපක්ෂපාතීත්වය, අරමුදල් බෙදාහැරීමේ විනිවිදභාවය සහ රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව මෙහිදී තීරණාත්මක වනු ඇත. අඛණ්ඩ ස්වාධීන නිරීක්ෂණය, තාක්ෂණික යාවත්කාලීන කිරීම් සහ සැබෑ ප්‍රජා සවිබලගැන්වීමක් සහතික කිරීම තුළින්, ප්‍රජාශක්ති ජාතික වැඩසටහනට ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාව සඳහටම තුරන් කරමින් "පොහොසත් රටක් - සුවබර දිවියක්" යන ජාතික අභිලාෂය හුදු සිහිනයක් නොව ප්‍රායෝගික යථාර්ථයක් බවට පත් කිරීමට ප්‍රබල හැකියාවක් ඇති බව මෙම පර්යේෂණය මඟින් නිගමනය කළ හැක.

## ආශ්‍රිත ග්‍රන්ථ

1. ජාතික ජන බලවේගය (2024). පොහොසත් රටක් - සුවබර දිවියක්: ප්‍රතිපත්ති ප්‍රකාශනය.
2. ශ්‍රී ලංකා ජනාධිපති මාධ්‍ය අංශය (2025). ප්‍රජාශක්ති ජාතික වැඩසටහන දියත් කිරීම සහ අරමුණු.
3. ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය (2026). ජාතික උපායමාර්ගික සැලැස්ම (National Strategic Plan) 2026-2028.
4. Stifel, D., et al. (2025). BRIGHT Sri Lanka Project Note No. 1: Key findings and policy implications. CGIAR.
5. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතාව සහ මානව සංවර්ධන මූලපිරීම (OPHI) (2025). ගෝලීය බහුමාන දරිද්‍රතා දර්ශකය 2025: ශ්‍රී ලංකාව.
6. ලෝක බැංකුව (World Bank) (2025). ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික යාවත්කාලීන කිරීම් සහ දරිද්‍රතා දර්ශක (Global POVEQ).

7. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2025/2026). ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් සහ ජාතික දරිද්‍රතා සංඛ්‍යාලේඛන.
8. 8. Gonsalkorale, R. (2025). A multi-dimensional approach to lift the status of the rural sector – Praja Shakthi program in context. LankaWeb.
9. Ceylon Public Affairs (2026). Praja Shakthi: Empowering Sri Lankan Communities Through Citizen Participation.
10. 10. Sri Lanka Brief (2026). Sri Lanka's Newest Poverty Eradication Plan: Prajashakthi National Movement.
11. Senarath, U., et al. (2019). Health in rural Sri Lanka: A cross-sectional survey of three rural districts. Ceylon Medical Journal.
12. ලෝක බැංකුව (World Bank) (2025). Five ways Sri Lanka's local authorities are empowering communities from the ground up.



**ආචාර්ය නන්දන මිල්ලගල**

**පාර්ලිමේන්තු මන්ත්‍රී,**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**

**(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, හිටපු අංශාධිපති,**

**මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.**

## 03. ග්‍රාමීය ප්‍රබෝධය උදෙසා චීන ආදර්ශ

ග්‍රාමීය සංවර්ධනය යනු හුදෙක් බාහිරින් ලැබෙන සම්පත් බෙදාදීමක් හෝ යටිතල පහසුකම් සැපයීමක් පමණක් නොව, ග්‍රාමීය ජනතාවගේ අභ්‍යන්තර ශක්තිය සහ ස්වයංපෝෂිතභාවය අවදි කිරීමකි. මා විසින් මෑතකදී චීනයේ සිදු කළ අධ්‍යයන චාරිකාව තුළින් ග්‍රාමීය පුනර්ජීවනය සහ දරිද්‍රතාව පිටුදැකීම සම්බන්ධයෙන් ලද අත්දැකීම් ඉතා අගනේය. චීනය සිය දරිද්‍රතා තුරන් කිරීමේ ක්‍රියාවලිය තුළින් ලොවටම දායාද කළ "ජනතාව කේන්ද්‍ර කරගත්" සංවර්ධන දර්ශනය සහ එය ක්‍රියාත්මක කළ ආකාරය, ශ්‍රී ලංකාවේ අපගේ ප්‍රජාශක්ති ගමනට නව මානයක් එක් කරන බව නොඅනුමානය.

චීනයේ ග්‍රාමීය පුනර්ජීවන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට හේතු වූ ප්‍රධාන සාධකයක් වන්නේ දරිද්‍රතාව පිටුදැකීම හුදෙක් කෙටි කාලීන ඉලක්කයක් නොව, එය දශක ගණනාවක් පුරා ක්‍රියාත්මක වූ දිගුකාලීන සැලසුමක් වීමයි. මෙහිදී දරිද්‍රතාව පිටුදැකීමේ මූලික පියවර වූයේ ඉලක්කගත දරිද්‍රතා තුරන් කිරීමේ (Targeted Poverty Alleviation - TPA) උපායමාර්ගයයි. ඒ අනුව, දරිද්‍රතාවට ලක් වී සිටින එක් එක් පවුලට ගැලපෙන අයුරින් විසඳුම් සෙවීම, දත්ත පදනම් කරගත් තීරණ ගැනීම සහ ඔවුන් ස්වයංරැකියාවකට හෝ නිෂ්පාදන ක්‍රියාවලියකට යොමු කිරීමේ ක්‍රමවේදය අතිශය සාර්ථක විය. ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය තුළින් ද අප අරමුණු කරන්නේ එක් එක් ග්‍රාමීය ප්‍රජාවේ විශේෂතා හඳුනාගෙන, ඔවුන් සතුව පවතින සම්පත් උපයෝගී කරගනිමින්, ජනතාවගේ පූර්ණ සහභාගීත්වයෙන් යුත් ආර්ථික සවිබල ගැන්වීමක් සිදු කිරීමයි.



2013 වසරේ හූනාන් පළාතේ හුවායුවාන් ප්‍රාන්තයේ, ෂිබාඩොං ගම්මානයට කළ සංචාරයකදී, සැබෑ තත්ත්වය සොයා බලා (සත්‍යය පදනම් කරගෙන), ප්‍රාදේශීය තත්ත්වයන්ට ගැලපෙන පරිදි, එක් එක් ප්‍රදේශයට අනන්‍ය වූ මඟ පෙන්වීම් ලබා දෙමින්, දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වූ ඉලක්කගත ප්‍රවේශයක් (Targeted Poverty Alleviation) අනුගමනය කළ යුතු බව ජනාධිපති ෂී ජින්පින් මහතා විසින් ප්‍රථම වරට යෝජනා කරන ලදී.



එහි සරල අර්ථය වන්නේ: "ගැටලුවල ප්‍රදේශයේ පවතින සුවිශේෂී තත්ත්වයන්ට අනුකූලව, එක් එක් ප්‍රදේශයට ගැලපෙන අයුරින් දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි."

චීනයේදී නිරීක්ෂණය කළ පරිදි, සංවර්ධනය යනු හුදෙක් ආධාර ලබාදීමක් නොව, ග්‍රාමීය ජනතාවගේ අභ්‍යන්තර හැකියාවන් 'සම්පත්' බවට පත් කරමින් ඔවුන් සංවර්ධනයේ සක්‍රීය දායකයින් බවට පත් කිරීමේ ක්‍රියාවලියකි. මෙම අත්දැකීම ප්‍රජාශක්ති ව්‍යාපාරයේ දර්ශනය සමඟ ඉතා සමීපව බැඳී පවතින අතර, චීනයේ පවතින පුද්ගල කේන්ද්‍රීය සංවර්ධන ආකෘතිය අපගේ ග්‍රාමීය ප්‍රජාවන් සවිබල ගැන්වීමට ඉතා හොඳ ආදර්ශයක් වේ.

### තාක්ෂණය සහ නවෝත්පාදනය - ග්‍රාමීය සංවර්ධනයට නව පණක්

චීනයේ ග්‍රාමීය පුනර්ජීවන සාර්ථකත්වය පිටුපස ඇති ප්‍රබලම සාධකයක් වන්නේ කෘෂිකර්මාන්තයට නවීන තාක්ෂණය බද්ධ කිරීමයි. විශේෂයෙන්ම, කෘතිම බුද්ධිය (AI) සහ SMART කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය මගින් ග්‍රාමීය නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ නංවා ඇති ආකාරය අපගේ අවධානයට ලක් විය. උදාහරණයක් ලෙස, රෝග හඳුනාගැනීමේ ජංගම දුරකථන යෙදවුම් (Snap-based disease identification tools) භාවිතයෙන්, විශේෂිත රසායනාගාර පහසුකම් නොමැති දුෂ්කර ගම්මානවල පවා ගොවීන්ට තමන්ගේ භෝගවල රෝග ඉතා ඉක්මනින් හඳුනාගෙන ඒවා පාලනය කිරීමට හැකිවී තිබේ.

තවද, විද්‍යාඥයින්ගේ මැදිහත්වීමෙන් (Academician-led teams) සිදු කළ ප්‍රායෝගික පර්යේෂණ තුළින් අස්වැන්න බෙහෙවින් වැඩි කර ගැනීමට ඔවුන් සමත්ව ඇත. පර්යේෂකයන් කෙලින්ම ගම්මානවලට ගොස් ගොවීන් සමඟ එක්ව වැඩ කරමින් ඔවුන්ට නව වගා ක්‍රම (උදා: ශීත සෘතු අර්තාපල් වගාව) හඳුන්වා දීම තුළින් වගා නොකළ ඉඩම් ආර්ථික වටිනාකමක් සහිත ඉඩම් බවට පත් කර ඇත. මෙම තාක්ෂණික නවෝත්පාදනයන් ප්‍රජාශක්ති ව්‍යාපාරයේදී අපටත් උකහා ගත හැකි ප්‍රධාන අත්දැකීමකි; එනම්, විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ අත්වැල් බැඳගනිමින් දේශීය කෘෂි ගැටලුවලට තාක්ෂණික විසඳුම් සෙවීමයි.

## වෙළඳ නාමකරණය - අගය එකතු කළ දේශීය නිෂ්පාදන






මූලික ක්‍රමවේදය: නිජබිම, ගොවීන් සහ සංස්කෘතිය පිළිබඳ ආකර්ෂණීය කතාන්දර පැවසීම.

කතාන්දරය: "එක් කිවි පලතුරක් (Kiwi fruit), පුජියන් වැසියන් පරම්පරා තුනක්"

අලෙවිකරණය (Marketing): ගොවීන් ලවා කෙටි වීඩියෝ පට නිර්මාණය කරවා ගනිමින් ඔවුන්ගේ වගා අත්දැකීම් ප්‍රචාරණය කිරීම.

ප්‍රතිඵලය: 2023 වසරේදී පුජියන් කිවි (Pujiang kiwifruit) අන්තර්ජාලය හරහා සිදුකළ අලෙවිය චීන යුවාන් බිලියන 3 ඉක්මවා ඇත

චීනයේ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමට බෙහෙවින් උපකාරී වූ තවත් ප්‍රබල උපායමාර්ගයක් වන්නේ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා පොදු වෙළඳ නාමයක් (Public Agricultural Brand) නිර්මාණය කිරීමයි. සාම්ප්‍රදායිකව අප බොහෝ විට සිදුකරන්නේ අමුද්‍රව්‍ය ලෙස නිෂ්පාදන අලෙවි කිරීමයි. නමුත් චීනය පෙන්වා දෙන්නේ නිෂ්පාදනයකට ඉහළ මිලක් ලැබෙන්නේ එය නිසි වෙළඳ නාමයක් යටතේ ඉදිරිපත් කළ විට බවයි. මෙමඟින් හුදෙක් නිෂ්පාදනයක් විකිණීමට වඩා, එම නිෂ්පාදනයට අදාළ කලාපීය අනන්‍යතාව සහ ගුණාත්මකභාවය පාරිභෝගිකයාට සහතික කෙරේ.

ප්‍රාදේශීය පොදු වෙළඳ නාමයක් නිර්මාණය කිරීමේදී ප්‍රධාන පියවර කිහිපයක් අනුගමනය කළ යුතු බව චීන අත්දැකීම් පෙන්වා දෙයි. පළමුව, එම කලාපයට පමණක් ආවේණික වූ සුවිශේෂී භූගෝලීය, සංස්කෘතික හෝ ගුණාත්මක සාධක හඳුනාගත යුතුය. දෙවනුව, එම නිෂ්පාදනය සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැළපෙන දැඩි තත්ත්ව පාලන ක්‍රමවේද (Standardization) හඳුන්වා දිය යුතුය. උදාහරණයක් ලෙස, මිනුම් දඬු, ඇසුරුම් කිරීමේ ක්‍රම සහ ප්‍රවාහන පහසුකම් වැනි ක්ෂේත්‍රවල පවතින

ප්‍රමිතීන් ඉහළ නැංවීම තුළින් පාරිභෝගික විශ්වාසය ගොඩනැගේ. තෙවනුව, පාරිභෝගිකයා සමඟ චිත්තවේගීය බැඳීමක් ඇති කරන ආකාරයේ කතන්දරයක් (Storytelling) නිෂ්පාදනයට එක් කිරීමයි. එනම්, එම භෝගය වගා කරන ගොවියාගේ වෙහෙස, එම කලාපයේ පවතින සම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රමවේද සහ එහි ඇති සුවිශේෂී ගුණය පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කිරීමයි.

ප්‍රජාශක්ති ව්‍යාපාරයේදී මෙම ප්‍රවේශය අතිශයින් වැදගත් වන්නේ, අපේ ග්‍රාමීය නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් ඇති කර ගැනීමට එමගින් හැකිවන බැවිනි. ව්‍යාපාරයක් ලෙස අපට නිශ්චිත කලාපීය නිෂ්පාදන (උදා: කුළුබඩු, දේශීය සහල් වර්ග හෝ ශිල්පීය නිර්මාණ) තෝරාගෙන, ඒවා අදාළ කලාපීය අනන්‍යතාවයෙන් යුත් පොදු වෙළඳ නාමයකින් වෙළඳපොළට හඳුන්වා දිය හැක. මෙයින් පාරිභෝගිකයාට ලැබෙන නිෂ්පාදනයේ ගුණාත්මකභාවය සහතික වන අතර, නිෂ්පාදකයා වන අපේ ග්‍රාමීය ගොවියාට හෝ ශිල්පියාට සිය නිෂ්පාදනය සඳහා සාධාරණ සහ ඉහළ මිලක් ලබා ගැනීමට අවස්ථාව උදාවේ.

ඇත්ත වශයෙන්ම වෙළඳ නාමකරණය යනු හුදෙක් අලෙවිකරණ මෙවලමක් නොව, නිෂ්පාදනයේ අගය තහවුරු කරන ප්‍රබල ආර්ථික මෙවලමකි. චීනයේ සාර්ථකත්වය මඟින් අපට පෙන්වා දෙන්නේ, නියමිත ප්‍රමිතියකින් සහ ආකර්ෂණීය වෙළඳ නාමයකින් යුතුව දේශීය නිෂ්පාදන වෙළඳපොළට යොමු කිරීම ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට ඇති කෙටිම මාර්ගය බවයි.

### ග්‍රාමීය මානව සම්පත් සංවර්ධනය

සැබෑ සංවර්ධනයක් උදෙසා තාක්ෂණය සහ බ්‍රෑන්ඩ් පමණක් ප්‍රමාණවත් නොවන බව අප චීන අත්දැකීම්වලින් ඉගෙන ගතිමු. ඒ සඳහා ග්‍රාමීය ප්‍රජාවේ මානව සම්පත් සංවර්ධනය අත්‍යවශ්‍ය වේ. මානව සම්පත ග්‍රාමීය පුනර්ජීවනයේ හදවත බව චීනය ඔප්පු කර ඇත. ඒ අනුව, චීනය සිය ග්‍රාමීය පුනර්ජීවනය උදෙසා දැනුම, කුසලතා සහ සෞඛ්‍යය යන ත්‍රිවිධ අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

චීනයේදී නිරීක්ෂණය කළ ප්‍රධාන සාධකයක් වන්නේ, කුසලතා පුහුණුව යනු හුදෙක් පන්ති කාමරයක උගන්වන න්‍යායක් නොව, ක්ෂේත්‍රයේ අවශ්‍යතාව අනුව සකස් කළ කුසලතා (Skill-based training) වීමයි. එනම්, වෙළඳපොළට අවශ්‍ය වන්නේ කුමන කුසලතාද, එම කුසලතා ගොවියාට ලබා දීමයි. විශේෂයෙන්ම, ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන දේශීය නායකයින් බිහි කිරීම සහ ඔවුන් තුළ ව්‍යවසායකත්ව ආකල්ප දිරිමත් කිරීම තුළින් ගම තුළම ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැගිය හැකි බව චීන අත්දැකීම් සාක්ෂි දරයි.

### පාරිසරික අගයන් ආර්ථිකයට බද්ධ කිරීම

සෑම ගම්මානයකටම ස්වභාවිකව උරුම වූ පාරිසරික අගයක් (Ecological products) පවතී. ජලය, පිරිසිදු වාතය, දර්ශනීය කඳු හෝ වන සම්පත් ලෙස අප දකින මෙම දේ සැබවින්ම ආර්ථික වටිනාකමක් සහිත නිෂ්පාදන වේ. චීනය සිය ග්‍රාමීය සංවර්ධනය තුළදී පාරිසරික නිෂ්පාදනවල

වටිනාකම (Ecological product value realization) තක්සේරු කර, ඒවා ආරක්ෂා කරමින්ම ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ ක්‍රමවේද අනුගමනය කරයි.

නිදසුනක් ලෙස, පරිසරය විනාශ නොකර එම පරිසරයම සංචාරක ආකර්ෂණයක් ලෙස හෝ ස්වභාවික නිෂ්පාදන මූලාශ්‍රයක් ලෙස භාවිත කිරීමේ ක්‍රමවේද අපට හඳුන්වා දිය හැක. අපේ ගම්මානවල පවතින පාරිසරික සම්පත් පිරිහීමට ඉඩ නොදී, ඒවා අනාගත පරපුරටත් ප්‍රයෝජනවත් වන අයුරින් තිරසර ලෙස කළමනාකරණය කිරීමටත්, ඒ තුළින් ප්‍රජාවට ආර්ථික ප්‍රතිලාභ අත්කර දීමටත් අපට හැකි විය යුතුයි.

### ප්‍රජාශක්ති ව්‍යාපාරය හරහා නව පිබිදීමක්

සමස්තයක් ලෙස ගත් කල, චීන සංචාරය තුළින් අප ලද අත්දැකීම් සනාථ කරන්නේ ග්‍රාමීය පුනර්ජීවනය යනු හුදෙක් ආර්ථික අභිවෘද්ධිය පමණක් නොව, එය සමාජීය, සංස්කෘතික සහ පාරිසරික අන්තර්සම්බන්ධතාවක් බවයි. චීනය සිය දරිද්‍රතා තුරන් කිරීමේ ක්‍රියාවලියේදී අනුගමනය කළේ ජනතාවගේ දැත්වලින්ම ඔවුන්ගේ ඉරණම වෙනස් කිරීමේ උපායමාර්ගයයි. අප ද අපගේ ප්‍රජාශක්ති ව්‍යාපාරය තුළින් උත්සාහ කරන්නේ සහභාගීත්ව ප්‍රවේශය හරහා ගමේ පවතින සම්පත්, ගමේම ජනතාවගේ ශ්‍රමය, බුද්ධිය සහ කැපවීම තුළින්ම අර්ථවත් ආර්ථිකයක් නිර්මාණය කිරීමටයි.

ප්‍රජාශක්ති ව්‍යාපාරය තුළින් මතුපිටින් පෙනෙන සහනාධාර සංස්කෘතිය වෙනුවට, ජනතාවගේ අභ්‍යන්තර ශක්තිය අවදි කරන ස්වයංපෝෂිත ප්‍රජාවක් බිහි කිරීම අපගේ අපේක්ෂාවයි. සමාජ සාධාරණත්වය සහ "කිසිවෙකු අත්නොහැරීම" යන මූලධර්ම මත පිහිටා, චීනය සනාථ කර ඇත්තේ නියමිත ඉලක්කයක් සහිතව, විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම ග්‍රාමීය මට්ටමටම රැගෙන ගිය විට, අපේක්ෂිත සාර්ථකත්වය ඉතා කෙටි කාලයකදී අත්පත් කරගත හැකි බවයි. අපගේ ගම්මානවල පවතින අද්විතීය නිෂ්පාදන, සුවිශේෂී සංස්කෘතික උරුමයන් සහ පාරිසරික අගයන් ප්‍රජාශක්ති ව්‍යාපාරය හරහා නිවැරදි වෙළඳ නාමකරණයකට සහ තිරසර කළමනාකරණයකට ලක් කළහොත්, අපේ ගොවියාගේ සහ ශිල්පියාගේ ආර්ථික ශක්තිය හෙට දින අනිවාර්යයෙන්ම ඉහළ යනු ඇත.



ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පුනර්ජීවනය සඳහා අවශ්‍ය වන්නේ රජයේ මඟපෙන්වීම සහ ප්‍රජා සහභාගීත්වය පමණක් නොව, ග්‍රාමීය ජනතාවගේ අභිමානය සහ දියුණුව උදෙසා ඔවුන් සතු දායකත්වයයි. චීන ජාතිකයින්ගේ ධනාත්මක ආකල්ප සහ රට වෙනුවෙන් ඔවුන් තුළ ඇති දැඩි කැපවීම අපට විශිෂ්ට ආදර්ශයකි.



**තිලිණි සුරංගිකා කරස්නාගොඩ**

**අධ්‍යක්ෂ,**

**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.**

# 04. දරිද්‍රතාවයෙන් තොර දේශයක්: 'ප්‍රජාශක්ති' බහුමානීය ප්‍රවේශය, ප්‍රජා සවිබල ගැන්වීම සහ රැකවරණය

## 1. හැඳින්වීම

දරිද්‍රතාවය යනු ඕනෑම සමාජයක් මුහුණ දෙන වඩාත් සංකීර්ණ සහ අභියෝගාත්මක ගැටලුවකි. එය හුදෙක් මුදල් නොමැතිකම පිළිබඳ ප්‍රශ්නයක් ලෙස අතීතයේ හැඳින්වුවද, නූතන විග්‍රහයට අනුව එය පුද්ගලයෙකුගේ හෝ පවුලක සමස්ත ජීවන තත්ත්වයේ බිඳ වැටීමකි. දරිද්‍රතාවය යනු පුද්ගලයෙකුට ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය මූලික මිනිස් අයිතිවාසිකම් සහ අවස්ථාවන් අහිමි වීමෙන් නිර්මාණය වන බහුමානීය (Multidimensional) අසමත්කමකි.

'ප්‍රජාශක්ති' දිළිඳුවබ තුරන් කිරීම සඳහා වන ජාතික ව්‍යාපාරය සැලසුම් කර ඇත්තේ මෙම දරිද්‍රතාවය එහි සම්පූර්ණ අර්ථයෙන් අවබෝධ කරගෙන, ජනතාවගේ ආදායම ඉහළ නැංවීමට අමතරව ඔවුන්ගේ ආකල්පමය වෙනසක් ඇති කරමින් අවශ්‍ය යටිතල පහසුකම් සහ අවස්ථාවන් (Infrastructures and Opportunities) නිර්මාණය කරමින් සියලුම ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහාය.

## 2. දරිද්‍රතාවය යනු කුමක්ද? (අර්ථ දැක්වීම)

දරිද්‍රතාවය යනු පුද්ගලයෙකුට හෝ පවුලකට තමන්ගේ කායික, මානසික සහ සමාජීය යහපැවැත්ම තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය වන මූලික අවශ්‍යතා වන ආහාර, නිවාස, සෞඛ්‍ය සහ අධ්‍යාපනය සපුරා ගැනීමට නොහැකි වීමයි. එමෙන්ම, සමාජයේ පොදු ක්‍රියාවලියට සක්‍රියව දායක වීමට ඇති අවස්ථාවන් සහ තේරීම් අහිමි වීම නිසා ඇතිවන අසරණභාවය ද මෙයට ඇතුළත් වේ.

නූතන අර්ථකථනයට අනුව දරිද්‍රතාවය ප්‍රධාන අංශ 3ක් ඔස්සේ විග්‍රහ කළ හැකිය:

- **සම්පත් අහිමි වීම:** පෝෂදායී ආහාර, පිරිසිදු පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම් සහ ආරක්ෂිත නිවසක් නොමැති වීම.
- **අවස්ථා අහිමි වීම:** ගුණාත්මක අධ්‍යාපනයක්, වෘත්තීය නිපුණතාවක් සහ සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති ඉඩකඩ ඇහිරීම.
- **සමාජීය සහ දේශපාලනික කොන්වීම:** තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමට ඇති ඉඩකඩ ඇහිරීම සහ තමන්ගේ අනාගතය පිළිබඳ ස්වාධීන තීරණ ගැනීමට ඇති බලය (Empowerment) අහිමි වීම.

කෙටියෙන් කිවහොත්, දරිද්‍රතාවය යනු මනුෂ්‍ය විභවතාවන් (Human Potential) උපරිමයෙන් භාවිත කිරීමට ඇති බාධාවයි.

### 3. දරිද්‍රතාවයේ විවිධ ස්වරූප

දරිද්‍රතාවය විවිධ මුහුණුවරින් සමාජය තුළ ක්‍රියාත්මක වේ. 'ප්‍රජාශක්ති' වැඩසටහන සාර්ථක වීමට නම් මෙම එක් එක් ආකාරය වෙන් වෙන්ව හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ.

### 3.1 මූල්‍ය දරිද්‍රතාව (Monetary Poverty)

පුද්ගලයෙකුට හෝ පවුලකට තම මූලික අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් ආදායමක් හෝ පරිභෝජන වියදමක් නොමැති තත්ත්වය මූල්‍ය දරිද්‍රතාවයයි. සරලව පවසන්නේ නම්, ජීවත් වීමට අවශ්‍ය අවම ආදායම් මට්ටමට (Poverty Line) පහළින් ජීවත්වීම මෙයට අයත් වේ. මෙහි ප්‍රධාන ලක්ෂණ වන්නේ අඩු ආදායම , ඉතිරිකිරීම් නොමැතිකම සහ ආර්ථික අවදානම්වලට වැඩි ලෙස ගොදුරු වීමයි.

ලෝක බැංකුවේ (World Bank) වත්මන් ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාවට අනුව, යම් පුද්ගලයෙකු දිනකට **ඇමරිකානු ඩොලර් 2.15 කට (USD 2.15)** වඩා අඩු ආදායමකින් ජීවත් වන්නේ නම්, ඔහු අන්ත දරිද්‍රතාවයෙන් පෙළෙන අයෙකු ලෙස වර්ගීකරණය කෙරේ. (මෙය 2017 මිලදී ගැනීමේ ශක්ති සමානතාවය - PPP මත පදනම්ව යාවත්කාලීන කරන ලද අගයයි).

ආර්ථික අතින් ශක්තිමත් නැති පවුල්වල ආදායම් මාර්ග ස්ථාවර කිරීම සඳහා අවශ්‍ය වෘත්තීය පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම. ස්වයං රැකියා ආරම්භ කිරීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය ලබා ගැනීමට අදාල පාර්ශවයන්  සමඟ ජනතාව සම්බන්ධ කිරීම සහ කාන්තාවන් සඳහා නිවසේ සිටම අතිරේක ආදායම් උත්පාදනය කළ හැකි ක්‍රම හඳුන්වා දීම වැනි ක්‍රම මගින් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති මේ සඳහා දායක විය යුතුය.

### 3.2 අස්ථිර දරිද්‍රතාව (Transient Poverty)

මෙය තාවකාලිකව හෝ කාලාන්තරිකව ඇතිවන දරිද්‍රතාවයයි. වියළි කාලගුණය නිසා ගොවියෙකුගේ ආදායම අඩුවීම , හදිසි රැකියා අහිමිවීම් හෝ ස්වභාවික ආපදා මෙයට හේතු වේ. නිසි ආරක්ෂණ ජාල (Social Protection) මඟින් මෙම පිරිස නැවතත් යථා තත්ත්වයට පත් කළ හැකිය.

ප්‍රධාන වශයෙන්, පවුලක් හදිසි ආර්ථික කම්පනයකට ලක්වී දරිද්‍රතාවයට ඇද වැටීම වැළැක්වීම සඳහා අන්‍යෝන්‍ය ආධාර ක්‍රම සහ ප්‍රජා අරමුදල් වැනි ප්‍රාදේශීය ආරක්ෂක දැලක් (social protection) නිර්මාණය කිරීම CDC මඟින් සිදු කළ හැකිය. එමෙන්ම, අස්ථිර ආදායම් ලබන ගොවීන් වැනි පිරිස් වෙත පවතින ව්‍යුහාත්මක බාධක හඳුනාගෙන, ඔවුන්ට අවශ්‍ය තාක්ෂණය සහ වෙළඳපොළ සම්බන්ධතා ගොඩනැගීමට සහාය වීම වැදගත් වේ.

මීට අමතරව, ආදායම් අහිමි වූ කාලසීමාවන්හිදී රජයේ දීමනා සහ සහන කඩිනමින් ලබා දීමට මැදිහත් වීමත්, පවුල්වල ඔරොත්තු දීමේ හැකියාව (resilience) වර්ධනය කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දීමත් හරහා අස්ථිර දරිද්‍රතාවයෙන් පෙළෙන පිරිස් ඉන් මුදා ගැනීමට ප්‍රජා සංවර්ධන සභාවලට හැකියාව පවතී.

### 3.3 නිදන්ගත දරිද්‍රතාව (Chronic Poverty)

මෙය පරම්පරා ගණනාවක් පුරා පවතින ගැඹුරු සහ ව්‍යුහාත්මක දරිද්‍රතාවයි. අධ්‍යාපන අවස්ථා හිඟය සහ අඩු වත්කම් නිසා මෙම පිරිසට දරිද්‍රතාවයෙන් මිදීමට ඇති හැකියාව ඉතා අඩුය. උදාහරණයක් ලෙස, පරම්පරා ගණනාවක් ඉඩම් රහිතව සිටින පවුල් මෙයට අයත් වේ.

ප්‍රජා සංවර්ධන සභා මගින් මෙම පවුල්වල දරිද්‍රතා විෂම චක්‍රය බිඳ දැමීම සඳහා අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය. නිදසුනක් ලෙස, අධ්‍යාපනය සහ අවස්ථා හිඟය නිසා පීඩා විඳින දක්ෂ දරුවන් හඳුනාගෙන ඔවුන්ට අවශ්‍ය මාර්ගෝපදේශනය ලබා දිය හැකි ගුරුවරුන් හා වෘත්තිකයන් වැනි සබඳතා ජාලයන් වෙත එම පවුල් සම්බන්ධ කිරීම අත්‍යවශ්‍ය වේ. එසේම දරුවන්ගේ  දක්ෂතා හඳුනාගෙන ශිෂ්‍යත්ව ලබා දිය හැකි පිරිස් සම්බන්ධකර දිම ද සිදු කල හැක.

එසේම, පරම්පරාගතව දේපළ හෝ ඉඩම් නොමැති පිරිස් හඳනාගෙන ඒවා නිරාකරණය කිරීම සඳහා අදාල අංශ සම්බනධිකරණය කිරීමත්, ස්වයං රැකියා සඳහා ප්‍රාග්ධනය ලබා ගැනීමට බැංකු හෝ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් ඔවුන්ගේ ආර්ථික ශක්තිය ගොඩනැගීමට මැදිහත් විය හැකිය. ජනතාව හුදෙක් ආධාර ලබන්නන් නොව සංවර්ධන හවුල්කරුවන් කර ගනිමින්, ඔවුන්ගේ තීරණ ගැනීමේ බලය (Empowerment) ඉහළ නැංවීම හරහා නිදන්ගත දරිද්‍රතාවයේ මානසිකත්වයෙන් ඔවුන් මුදා ගැනීමට CDC වෙත හැකියාව පවතී.

### 3.4 සාපේක්ෂ දරිද්‍රතාව (Relative Poverty)

සමාජයේ සාමාන්‍ය ජීවන මට්ටමට වඩා පහළ මට්ටමක ජීවත්වීම සාපේක්ෂ දරිද්‍රතාවයයි. මෙහිදී මූලික අවශ්‍යතා තිබුණද, සමාජයේ බහුතරය භුක්ති විඳින අන්තර්ජාල ප්‍රවේශය හෝ උසස් ඉගෙනීමේ අවස්ථා වැනි දෑ අහිමි විය හැකිය.

සමාජයේ සාමාන්‍ය ජීවන තත්වයන් හා සසඳන විට දරිද්‍රතාව සඳහා නිදසුනක් වශයෙන්, නාගරික අඩු ආදායම්ලාභී පවුල්වලට ආහාර සුරක්ෂිතතාව තිබිය හැකි නමුත් ප්‍රමාණවත් නිවාස, අන්තර්ජාල ප්‍රවේශය හෝ ඉගෙනීමේ අවස්ථා නොමැති වීම නිසා, සම වයසේ මිතුරන් විසින් භුක්ති විඳින අවස්ථාවන් දරුවන් වෙතින් බැහැර වීම.

ප්‍රධාන වශයෙන්, සමාජයේ අනෙකුත් පිරිස් භුක්ති විඳින නමුත් සාපේක්ෂව දිළිඳු පවුල්වලට අහිමි වී ඇති අන්තර්ජාල ප්‍රවේශය, ගුණාත්මක අධ්‍යාපන අවස්ථා සහ වෘත්තීය පුහුණුව වැනි ඉඩකඩ ලබා දීමට CDC මැදිහත් විය යුතුය. එම පවුල්වල දක්ෂ දරුවන්ට තම සිහින ජය ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශනය සහ වෘත්තිකයන් සමඟ සබඳතා ගොඩනැගීම මෙහිදී තීරණාත්මක වේ.

එසේම, සාපේක්ෂ දරිද්‍රතාවයෙන් පෙළෙන පිරිස් සමාජීය වශයෙන් කොන්වීම වැළැක්වීම සඳහා ඔවුන්ව සමිති සමාගම්වල සක්‍රිය සාමාජිකයන් කර ගනිමින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී කරවා ගත යුතුය

**3.5 සම්බන්ධතා දරිද්‍රතාව (Relational Poverty)**

පුද්ගලයෙකුට අසීරු අවස්ථාවකදී පිහිට වීමට හෝ උපදෙස් ලබා දීමට අවශ්‍ය ගුණාත්මක සමාජ සබඳතා ජාලයක් (Social Capital) නොමැති වීම මින් අදහස් වේ. මුදල් තිබුණද හුදෙකලා වූ අයෙකු සම්බන්ධතා දරිද්‍රතාවයෙන් පෙළෙන්නෙකු විය හැකිය. ප්‍රජාශක්ති වැඩසටහන මඟින් සිදු කරන්නේ මෙම සම්බන්ධතා ජාලය ශක්තිමත් කිරීමයි.

ප්‍රධාන වශයෙන්, ජනතාව සමිති සමාගම් ලෙස සංවිධානය කිරීම මඟින් ඔවුන් අතර අන්‍යෝන්‍ය සහයෝගීතාවය සහ "ප්‍රජා බැඳීමක්" නිර්මාණය කළ හැකිය. හදිසි ආපදාවකදී හෝ අසනීපයකදී පවුලක් අසරණ වීම වැළැක්වීමට අන්‍යෝන්‍ය ආධාර ක්‍රම (උදා: අවමංගල්‍යාධාර සමිති) ක්‍රියාත්මක කිරීම මෙයට අයත් වේ. එමෙන්ම, අඩු ආදායම්ලාභී පවුල්වල දක්ෂ දරුවන්ට අවශ්‍ය මාර්ගෝපදේශනය ලබා දිය හැකි ගුරුවරුන් හා වෘත්තිකයන් වැනි සබඳතා ජාලයන් ගොඩනැගීමට ද සභාවට මැදිහත් විය හැකිය.

මීට අමතරව, නිලධාරීන් සහ ප්‍රජාව අතර පවතින දුරස්ථභාවය අවම කර ඔවුන්ව රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ කිරීම ද CDC හි වගකීමකි.

**4. බහුමාන දරිද්‍රතා දර්ශකය (MPI)**

දරිද්‍රතාවය මැනීමේදී හුදෙක් ආදායම පමණක් නොව පුද්ගලයා අත්විඳින විවිධ අහිමිවීම් (Deprivations) සමූහයක් මෙහිදී සලකා බලයි. ප්‍රධාන වශයෙන් අංශ තුනක් කෙරෙහි අවධානය යොමු කරයි:

1. **අධ්‍යාපනය:** පවුලේ දරුවන් පාසල් නොයාම.
2. **සෞඛ්‍යය:** මන්දපෝෂණය සහ සෞඛ්‍ය පහසුකම් හිඟකම.
3. **ජීවන තත්ත්වය:** පිරිසිදු පානීය ජලය, සනීපාරක්ෂක (වැසිකිළි) පහසුකම්, විදුලිය. ඉඩම් සහ නිසි නිවසක් නොමැතිකම.

යම් පුද්ගලයෙකුට මුදල් තිබුණද, ඔහුට මෙම පහසුකම් අහිමි නම් ඔහු බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙන්නෙකි. රජයකට හුදෙක් මුදල් ලබා දීමෙන් පමණක් මෙය විසඳිය නොහැකි අතර අධ්‍යාපනය සහ සෞඛ්‍යය දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ.

## 5. දරිද්‍රතාවය දෙස බලන වෙනත් දෘෂ්ටිකෝණ

### 5.1 ස්ත්‍රී පුරුෂ භාවය සහ දරිද්‍රතාව

කාන්තාවන් දරිද්‍රතාවයට පත්වීමට ඇති වැඩි නැඹුරුව "දරිද්‍රතාවය ස්ත්‍රීකරණය වීම" (Feminization of Poverty) ලෙස හැඳින්වේ. මෙයට හේතු වන්නේ මුදල් නොගෙවන සත්කාරක සේවය , පිරිමින්ට සාපේක්ෂව අඩු වැටුප් (වේතන පරතරය) සහ සම්පත් පරිහරණයට (ඉඩම්, ණය) ඇති බාධාවන්ය.

### 5.2 පාරිසරික දරිද්‍රතාව

පිරිසිදු හා ආරක්ෂිත ස්වභාවික සම්පත් පද්ධතියක් අහිමි වීම පාරිසරික දරිද්‍රතාවයයි. ලිං ජලය දූෂණය වීම , නායයෑම් හෝ ගංවතුර අවදානම්වලට නිරාවරණය වීම සහ පස නිසරු වීම නිසා ජීවනෝපාය අහිමි වීම මින් අදහස් වේ.

## 6. ලාංකීය සන්දර්භය: නාගරික, ග්‍රාමීය සහ වතු අංශය

ලංකාවේ දරිද්‍රතාවය භූගෝලීය වශයෙන් විවිධ ස්වරූප ගනී:

- **වතු අංශය:** ලංකාවේ වැඩිම බහුමාන දරිද්‍රතාවක් පවතින්නේ මෙහිය. ලයින් කාමර ක්‍රමය නිසා පෞද්ගලිකත්වය සහ සනීපාරක්ෂාව අහිමි වීමත්, මන්දපෝෂණයත් මෙහි ප්‍රධාන ගැටලු වේ.
- **ග්‍රාමීය අංශය:** මෙහි දරිද්‍රතාවය ජීවනෝපාය මත පදනම් වේ. වෙළඳපොළ හිඟකම සහ ණය බර නිසා ගොවි ජනතාවට ආදායම් අස්ථාවරත්වයක් පවතී.
- **නාගරික අංශය:** පැල්පත් නිවාසවල ජනගහන ඝනත්වය, මත්ද්‍රව්‍ය උවදුර සහ අධික ජීවන වියදම මෙහි ප්‍රධාන අභියෝගයි.

## 7. බාධක බිඳ ජය ගැනිම සඳහා පද්ධති චින්තන ප්‍රවේශය (Systems Thinking Approach)

දරිද්‍රතාවය යනු හුදෙකලා සිදුවීමක් නොව එකිනෙකට සම්බන්ධ වූ සාධක සමූහයක සංකීර්ණ ප්‍රතිඵලයකි. පද්ධති චින්තනයට අනුව, එක තැනක සිදුකරන වෙනසක් මුළු පද්ධතියටම බලපායි. උදාහරණයක් ලෙස, ගමේ පාරක් සංවර්ධනය කිරීමෙන් ගොවියාට වෙළඳපොළටත් දරුවාට

පාසලටත් යා හැකි වේ. 'ප්‍රජාශක්ති' වැඩසටහන මඟින් අධ්‍යාපනය, සෞඛ්‍යය, ජීවනෝපායන් සහ යටිතල පහසුකම් යන සියල්ල එකට විසඳීමට උත්සාහ කරන්නේ එබැවිනි.

**8. ජීවන චක්‍ර ප්‍රවේශය (Life Cycle Approach)**

පුද්ගලයෙකු තම උපතේ සිට මරණය දක්වා ගෙවන විවිධ අවධීන්හිදී (ළමා කාලය, තරුණ විය, මහලු විය) දරිද්‍රතාවය විවිධ අයුරින් අත්විඳියි. ළමා වියේ පෝෂණය අහිමි වීම මහලු වියේ සෞඛ්‍ය ගැටලුවලට බලපායි.

ප්‍රජා සංවර්ධන සභාවට (CDC) මෙම චක්‍රය බිඳ දැමීමට සුවිශේෂී කාර්යභාරයක් ඇත:

- **ළමා අවධිය:** පෙරපාසල් දරුවන්ගේ පෝෂණය අධීක්ෂණය සහ පාසල් හැර යන දරුවන් නැවත අධ්‍යාපනයට යොමු කිරීම.
- **තරුණ/වැඩිහිටි අවධිය:** වෘත්තීය පුහුණුව සහ ස්වයං රැකියා සඳහා මූලික ප්‍රාග්ධනය ලබා දීමට සම්බන්ධීකරණය කිරීම.
- **මහලු අවධිය:** වැඩිහිටි දීමනා සහ සෞඛ්‍ය පහසුකම් ලබා දීම.

**9. දරිද්‍රතාවයේ සංස්කෘතිය සහ වත්මන් විමසුම**

අතීතයේදී ඔස්කාර් ලුවිස් විසින් දරිද්‍රතාවයේ සංස්කෘතිය (Culture of Poverty) ඉදිරිපත් කළ අතර , එහිදී පවසා ඇත්තේ දිළිඳු ජනතාවට තමන්ගේ තත්ත්වය වෙනස් කළ නොහැකි බවට ඇති විශ්වාසය (Sense of Resignation) නිසා දරිද්‍රතාවය පවතින බවයි.

කෙසේ වෙතත්, නූතන විද්‍යාඥයින් පෙන්වා දෙන්නේ මෙය "වින්දිතයාටම දොස් පැවරීමක්" (Blaming the Victim) බවයි. දරිද්‍රතාවයට සැබෑ හේතුව අසාධාරණ ආර්ථික ක්‍රමය සහ ව්‍යුහාත්මක බාධාවන් මිස පුද්ගල ආකල්ප නොවේ. දිළිඳු ජනතාව යනු ආධාර ලබන්නන් නොව, සංවර්ධනයේ හවුල්කරුවන් (Partners) ලෙස සැලකීම නූතන පිළිගැනීමයි.

**10. සාරාංශය**

'ප්‍රජාශක්ති' වැඩසටහන හරහා අප බලාපොරොත්තු වන්නේ පුද්ගලයෙකු සතු මනුෂ්‍ය විභවතාවන් (Human Potential) උපරිමයෙන් භාවිත කිරීමට ඇති බාධක ඉවත් කිරීමයි. දරිද්‍රතාවය තුරන් කිරීම යනු හුදෙක් මුදල් බෙදා දීමක් නොවේ. එය අධ්‍යාපනය, සෞඛ්‍යය, යටිතල පහසුකම් සහ සමාජ ආරක්ෂාව යන සියල්ල එකවර විසඳිය යුතු සර්වග්‍රාහී ක්‍රියාවලියකි. ප්‍රජා සංවර්ධන සභා හරහා ජනතාව සංවිධානය කිරීම, ඔවුන්ව රාජ්‍ය නිලධාරීන් හා අනෙකුත් පාර්ශවයන් සමඟ සම්බන්ධ කිරීම සහ

එකිනෙකාට උදව් කරන ශක්තිමත් "ප්‍රජා බැඳීමක්" නිර්මාණය කිරීම තුළින් අපට දරිද්‍රතාවයෙන් තොර ශක්තිමත් හෙටක් ගොඩනැගිය හැකිය.



**ප්‍රසාද් කෝරළගේ**

**අධ්‍යක්ෂ, (ක්‍රම සම්පාදන)**

**ජනාධිපති ලේකම් කාර්යාලය.**

# 05. Odyssey of Red Dragon's Conquest of Poverty

(This article is based on both practical and theoretical studies of China's poverty alleviation program. China's targeted poverty alleviation initiative has been recognized by the United Nations as one of the most successful programs in the world today. This article, authored by the writer, was also published in a journal of Peking University, China.)

## Odyssey of Red Dragon's Conquest of Poverty

"China has remained dedicated to this SDG, 6 among others – like access to quality education, zero hunger, good health and well-being, clean water and more. China's firm dedication to the uplifting of its people and the global community resulted in the United Nations Secretary-General António Guterres calling China a "major pillar of international cooperation" and thanking China for its role in "shaping and implementing the Sustainable Development Goals… by its strong commitment and significant progress to eradicate poverty in all forms and dimensions" …

On a bright day in 2020, addressing the United Nations, Secretary-General António Guterres made a significant statement about China, often referred to as the Red Dragon. He highlighted China's exemplary battle against poverty, led by President Xi Jinping. In February 2021, President Xi Jinping declared victory in this monumental struggle. The steadfast and visionary leadership of the Communist Party of China, under President Xi's guidance, played a crucial role in this epic journey of China's Battle against poverty. Poverty is a chronic affiliation of human society and a common challenge faced by the whole world. Poverty and its associated problems, including hunger, diseases and social conflicts all serious impediments to people's pursuit of a better life. So the eradication of poverty has always been a wish to be fulfilled. The history of human kind is the history of relentless struggle against poverty.

To create a peaceful and philanthropic society in any country, eradicating poverty is essential. This principle is not unique to China; it is a universal doctrine that affects the entire world equally.

With a population of roughly 1.4 billion, China comprises one-fifth of the world's population. As the largest developing country in the world, China has faced various challenges throughout its history and achieved numerous triumphs. Throughout human civilization, China has made many significant contributions to the world, including the invention of paper, gunpowder, banknotes, and the magnetic compass.

Despite its number of remarkable achievements, China is a country that has suffered greatly from poverty and the social disparities that have arisen in connection with it. Especially the rural people of China, as well as the rural people in remote and isolated areas from the capital, were constantly hit by poverty. Socio-economic and political problems such as low education, insufficient facilities, low capital, poor road system, minimal health facilities, minimal gender equality, unemployment, etc. were commonly seen in China throughout history. All these problems are rooted in poverty, and it is this social disparity, intertwined with poverty, that ultimately led to the Chinese revolution under the leadership of Chairman Mao Zedong.

The Chinese revolution, which turned the social, economic, and political structure of the country upside down, led the Chinese people to a new path. From the first 5 year plan under Mao's leadership in 1950, to the current 14th five-year plan, a major part of every economic plan was devoted to identifying and implementing strategies to lift the Chinese people out of poverty.

The best book to point out the nature of poverty in China before the victory of the Chinese revolution under the leadership of Chairman Mao, is the book “Fanshen” ( A tale of revolution in a rural village)  written by the American writer William H. Hinton. The labor of the farmers and hereditary slaves is subjected to extreme exploitation by the nobles. For an instance, the toilets of the barren landlords were built in front of the houses of the landlords. The poor should use the toilet system in front of the houses of hereditary slaves. The waste collected in the toilets is used by the nobles to fertilize their fields. According to Hinton, this was the nature of poverty in China before the Chinese Revolution. However, the 1949 revolution, led by Chairman Mao Zedong, opened a new path of development for the poor people of the country.

The most radical action taken by the People's Republic of China to alleviate poverty after the 1949 Chinese Revolution was the "Chinese Land Reform policy." The core principle of this policy was "Land to the tiller." Under the leadership of the Chinese Communist Party, millions of hectares of land owned by landlords were confiscated and transformed into collective farms. These farms were then handed over to peasants for cultivation. This land reform campaign, orchestrated by the unity of the state and CPC, was primarily aimed at eradicating poverty in China.

However, even after the Chinese revolution, under the leadership of the Chinese Communist Party, it was difficult for China to free its people from poverty. But during the period from 1949 to 1978, even with the People's Republic of China’s various strategies, the country could lift only a limited number of its population out of poverty. During this period, it was believed by the Chinese republic that agricultural reforms were the key to eradicate poverty. A turning point was the land reform movement introduced under the leadership of the Communist Party. As part of the poverty alleviation program, the People's Republic of China sought to eliminate the root causes of poverty.

The “Land Reform Act” in 1950 and the “Land Agriculture Reform Act” in 1953 were introduced in China under the leadership of the CPC to make land reform campaigns successful. These reform acts were very important in transferring the ownership of the land owned by the landlords to the landless people. It sought to modernize the agricultural sector and eradicate poverty in rural areas by increasing the productivity of the sector.

Building upon the agrarian reforms, the period from 1958 to 1978 witnessed the consolidation of agricultural production through collectivization and the establishment of rural communes. The Great Leap Forward, launched in 1958, aimed to accelerate agricultural and industrial development through the formation of people's communes. While this initiative faced criticism for its overly ambitious targets and implementation flaws, it nonetheless contributed to significant gains in agricultural productivity and rural infrastructure development. The commune system, characterized by collective farming and shared resources, played a pivotal role in mobilizing rural labor and promoting agricultural mechanization.

In addition to agrarian reforms, the Chinese government implemented various social welfare programs to address the needs of vulnerable populations. The establishment of the "Iron Rice Bowl" system provided basic social security guarantees, including healthcare, education, and housing, to urban workers and their families. Similarly, rural cooperative medical schemes were introduced to extend healthcare coverage to rural areas, thereby improving access to essential services for impoverished rural populations. These social welfare programs played a crucial role in reducing the impact of poverty and enhancing social equity across different regions of China.

Furthermore, recognizing the importance of education in breaking the cycle of poverty, the Chinese government prioritized investments in human capital development during the period under review. The expansion of educational infrastructure, coupled with policies promoting universal primary education and vocational training, facilitated greater access to education for millions of Chinese citizens. By investing in human capital, China not only empowered individuals to escape poverty but also fueled economic growth and innovation, laying the groundwork for future prosperity.

A new chapter in the People's Republic of China began with the economic reforms introduced by President Deng Xiaoping in 1978. Instead of the closed economic system that had existed in China until then, President Deng Xiaoping presented a series of new economic reforms to the Eleventh Congress of the CPC held in December 1978. There, he stated, “Poverty is not socialism; socialism is about eliminating poverty.” These reforms, introduced by President Deng Xiaoping, were designed to permeate China's social and economic structures. The core of these reforms was to lead to rapid development in China while eradicating rural poverty. The ultimate goal of these reforms was to achieve a prosperous life for the entire Chinese population before the beginning of the twenty-first century. Deng Xiaoping introduced two main strategies: modernizing agriculture in rural areas and implementing a well-planned and well-organized national program for poverty alleviation.

There were two strategies introduced by President Deng Xiao pin, namely; the modernization of agriculture in rural areas and the introduction of a well-planned and well-organized national program to eradicate poverty. There, the household economic process and cooperative management were integrated and efforts were made to strengthen the rural economy. Also, urban development was accelerated and efforts were made to alleviate the

poverty of the urban people. The end result of all that was China moving towards a very rapid economic development. As a result, by 1990, remarkable progress in China's poverty alleviation programs became evident.

However, during the same period, an unexpected problem emerged in China: poverty remained widespread in specific areas and among certain population groups. In response, China introduced a new poverty alleviation program spanning from 1994 to 2000. Over these seven years, the program significantly improved the standard of living for eighty million people in China. Providing sufficient food, clothing, and housing to these individuals stands as one of the greatest achievements of the People's Republic of China and the Chinese Communist Party.

At the dawn of the twenty-first century, in 2000, China's poverty alleviation program embarked on a new journey. This shift marked a transition from a "subsidy approach" to a "developmental approach." The primary aim of this new initiative was to cultivate a developed socialist rural economy, fostering a peaceful and prosperous society. Western and Central China were identified as priority regions, with the development of one hundred and fifty thousand impoverished villages selected as the central objective. Under this program, agricultural taxes imposed on rural residents were abolished, and efforts were made to elevate unskilled rural laborers to skilled positions. Consequently, the doors of China's factories swung open to welcome these newly skilled workers.

The most important chapter of e China’s epic journey about the poverty alleviation of the Red Dragon begins in the year 2012 at the 18th Congress of CPC. It was another opening to lead the Chinese people to a more prosperous era. This new chapter started in the People's Republic of China by introducing a new poverty alleviation program to China under the concept of “battle against poverty” by President Xijin ping at the 18th Congress of the Communist Party of China. This new poverty alleviation program was introduced by President Xi as "Targeted poverty alleviation program". It took a different approach from all the poverty alleviation programs implemented in China until then. It was modeled after the successes and failures of the previous poverty alleviation programs.

Up to this point, the core of poverty alleviation programs, not only in China but worldwide, involved adopting common strategies for every poor people. Despite the diverse reasons

affecting each citizen's poverty, little special attention was given to individual circumstances. This approach was similar to attack a multi barrel rocket launcher or engaging in a shotgun fight—sometimes successful, but often resulting in wasted resources. Recognizing these shortcomings, President Xi introduced the "*Targeted Poverty Alleviation Program*" in China. This initiative aimed to create a more effective and successful poverty alleviation strategy. President Xijin ping articulated that the primary objective of this program was to illuminate China's brighter side during the period of 2012-2020.

Introducing this program, President Xijin ping outlined several main stages it should include. The first phase focused on the identification of individuals, areas, and specific ethnic groups in need of poverty alleviation as a top priority. President Xi stressed the importance of studying the identified areas and the underlying reasons for poverty affecting those citizens.

The next aspect of the Targeted Poverty Alleviation Program involved identifying the root causes of poverty in the chosen areas through a carefully laid study. This included locating the areas, assessing infrastructure, identifying deficiencies in the road system, considering weather, and accounting for geographical factors—all pivotal tasks in the process. President Xi emphasized the importance of this comprehensive study to uncover the underlying reasons for poverty in these regions. It was a significant yet challenging task, requiring close attention to detail in identifying the locations, infrastructure, road system deficiencies, weather patterns, and geographical features.

President Xi also stated that the factors that affected people suffering from poverty should be found out. Under this, it was to be analyzed the core reason for their poverty; whether it was due to the deficiency in their education and insufficient technical skills or because of some other reason.

The second factor considered in the "*Targeted Poverty Alleviation*" program was resettlement. If the areas where impoverished people lived could not be sufficiently developed, or if significant expenses were required for such development, the focus shifted to relocating these individuals to more viable areas. The president believed that this approach would offer a more comfortable life to those affected. He emphasized the importance of swiftly relocating people from these areas to regions with better facilities, where they could settle and lead better lives.

The third point proposed by the President Xi was the creation of new job opportunities. He believed that alleviating poverty among the Chinese people could be achieved by providing greater educational opportunities to underprivileged children. President Xi Jinping emphasized prioritizing poor children for the new job opportunities generated through accelerated industrialization. He stressed that offering quality education to these children was the first step toward this goal. The president held a strong conviction that this approach would play a major role in eradicating poverty across China.

Fourthly, President Xi Jinping emphasized the prioritization of education in the fight against poverty. He advised for the acceleration of both formal and non-formal education opportunities, aimed at overcoming poverty in urban areas. Additionally, the president stressed the importance of expanding vocational training opportunities for under privileged children in rural areas. He underscored the need to allocate budgetary resources toward uplifting the country's education sector, with priority given in budget documents.
Finally, under the leadership of the Chinese Communist Party, President Xi Jin ping emphasized the need to improve social security services in China. Addressing a conference, he proposed enhancing welfare assistance for those unable to participate in economic activities. The president's poverty alleviation proposal, presented at the 18th Congress of the Communist Party, outlined the introduction of special social welfare facilities, health services, and rural insurance for residents in impoverished areas.

In 2012, the implementation of the "*Targeted Poverty Alleviation*" program, introduced by President Xi Jin ping, commenced in rural areas across the People's Republic of China. The Chinese Communist Party and its mechanisms spearheaded this initiative, while all institutions of higher education in the country actively contributed to its success. Every government organization and institution in the People's Republic of China stepped forward to support this challenging journey.

The "Targeted Poverty Alleviation" program sparked another revolutionary change in the history of the People's Republic of China, initiating in a transformative era for Chinese society. By addressing poverty, the greatest threat to people's lives, this program brought about prosperity in all aspects of life. Through this initiative, China achieved the goals of the 21st century through a uniquely Chinese socialist model. This landmark program not only

ensured the eradication of poverty but also elevated thousands of years of Chinese history to a new status, turning a new leaf in the country's economy.

In the implementation of these programs, China encountered numerous challenges. Among these are the task of identifying the truly impoverished, both in rural and urban settings. Limited data on rural poverty made this a challenging task to complete. Furthermore, establishing precise criteria for defining poverty was a significant obstacle as well. Poverty determinants varied across regions, complicating the assessment of poverty levels. What constituted poverty in one socio-economic context might not hold true in another, adding to the complexity.

Addressing these challenges was crucial in the "Targeted Poverty Alleviation" program. China navigated these challengers through numerous studies and research efforts.
Another challenge emerged during program execution: the risk of individuals liberated from poverty slipping back into destitution. Ensuring the sustainability of programs aimed at uplifting individuals demanded increased attention. Through careful studies and social monitoring, China successfully dealt with the indifference of certain individuals and impoverished families.

Engaging these families in the poverty alleviation program proved challenging, requiring close supervision and support. Without such oversight, there was a notable risk of these households reverting to poverty swiftly. However, China successfully managed to surmount this challenge by closely monitoring and supporting these identified families.
Despite these challenges, President Xi's targeted poverty alleviation programs were successfully implemented throughout China. Areas affected by poverty were identified meticulously, including regions inhabited by minority groups such as Tibet, Ningxia, Inner Mongolia, Guangxi, and Xinjiang, where the program showed notably positive results. Each province's impoverished population was accurately pinpointed, with the underlying causes of poverty identified through thorough studies. The support extended by Chinese universities and higher education institutions played a crucial role in this mission. With unshaken determination, the Chinese government and the Communist Party were able to overcome various obstacles.

Subsequently, a dedicated "helper" was assigned to each family, thoroughly trained in poverty alleviation techniques. Their primary responsibility was to assist households in addressing the root causes of poverty systematically. These appointed "helpers" executed their duties, contributing significantly to the program's success.

Then, as per President Xi's plan, populations residing in geographically challenging areas had to be relocated to more accessible regions. New cities were constructed, offering improved facilities for those resettled from rural areas. Adequate housing was provided to meet their needs, thereby bridging the gap in resource distribution between villages and urban centers.

Industries traditionally confined to urban settings were decentralized and moved to rural areas, with entrepreneurs incentivized to lead this transition. The government offered special support to these entrepreneurs, facilitating the establishment of industries in rural regions and providing essential infrastructure. Consequently, a variety new job opportunities emerged in rural areas, offering a support system to those struggling with poverty. This job market was highly appreciated by the rural community, as contributed massively to their economic status.

President Xi also achieved success in his third objective by prioritizing education as a means of empowerment. Compulsory education was extended to nine years, with free education mandated for impoverished children up to the grade nine. Scholarship programs and educational loans were introduced to support academically talented students. As a result, educational opportunities were accessible to impoverished children, motivating them to pursue higher education and explore new career avenues. This shift enabled them to break free from the shackles of poverty and lead more prosperous lives. Furthermore, it should be noted that, under the theme of "*Education for All*", vocational education opportunities were expanded alongside traditional education, further enriching the educational landscape.

Accordingly, vocational education institutes aimed at providing professional qualifications were established in many remote areas, with a primary focus on the children of rural families. These institutes offered vocational education opportunities in fields such as Hotel Management, Culinary Arts, Hospitality Management, Motor Mechanics, and the Garment Industry. The children of rural families enrolled in these institutions, seizing the chance to acquire valuable skills.

Simultaneously, various factories began to emerge in rural areas, generating numerous job opportunities. These factories provided ample employment opportunities for those who had completed vocational training, effectively curbing unemployment among the children of impoverished families. This strategy proved remarkably successful in lifting both these children and their families out of poverty, thereby achieving yet another goal of President Xi’s Battle of poverty campaign.

In addition to these efforts, the leadership of the Chinese Communist Party introduced socioeconomic assistance programs for individuals who remained trapped in poverty despite the above-mentioned strategies. Social security programs were introduced to support citizens afflicted by chronic, incurable illnesses and lacking any form of support. President Xi Jin ping underscored the government's responsibility to care for these individuals, even if they were unable to engage in productive economic activities.

In this comprehensive manner, President Xi Jin ping's "Targeted Poverty Alleviation" program continued to combat poverty on multiple fronts in China. This initiative not only served as a beacon of hope for impoverished communities within China but also set a shining example for other developing nations worldwide.

Under the “Battle Against Poverty” program introduced by President Xi Jin ping, the poverty levels in China began to decrease rapidly. The income of the people increased significantly, with the per capita income rising from 6,076 RMB in 2013 to 12,598 RMB by 2020. In rural areas, income increased by 2.3%, and expenditure on goods and services also grew proportionally. China's overall economic growth reached an impressive annual rate of 11.6% during 2012-2020.

A special feature of this program was the emphasis on the determination and dedication of the Chinese people themselves. The Chinese Communist Party provided the necessary facilities, but it was the people's own efforts that allowed them to break free from poverty. This self-reliance is a source of pride for the Chinese people.

The program also had a significant impact on China's autonomous regions, such as Tibet, Inner Mongolia, Guangxi, Ningxia and Xinjiang where the number of poor people decreased by 15.6 million. The targeted poverty alleviation program successfully reduced extreme poverty across all population groups.

By 2020, the Battle against Poverty program had ensured that all extremely poor people in China had access to shelter, sufficient quality food and drinking water, and necessary clothing. The program also focused on the crucial need for clean drinking water, benefiting 382 million people in rural areas. By 2020, 83% of the rural population had access to sufficient drinking water facilities Quality education opportunities were also made available for the children of these families, paving the way for a better future. By the year 2020, China had made remarkable strides in improving the quality of life for its citizens through the Battle Against Poverty program. Quality healthcare became accessible for families suffering from poverty, leading to a significant reduction in chronic diseases and major illnesses. An impressive 99.9% of the rural population received health insurance coverage.

Alongside these improvements, a new highway system was constructed to connect rural and urban areas, facilitating the integration of poverty-stricken villages with cities. Communication facilities in rural areas were also expanded.

These comprehensive efforts were able to lift 800 million people out of poverty, accounting for 70% of the world's reduction in poverty. President Xi Jin ping's targeted poverty alleviation program thus ended extreme poverty in China, setting a global example. In January 2021, President Xi Jin ping announced to the public that China had completely eradicated extreme poverty.

Next, we need to discuss whether the rest of the world's developing countries can try to reach the victory achieved by China. People's China succeeded in its Battle against Poverty program for several reasons, primarily due to the visionary and strong leadership of President Xi Jin ping. Such leadership is often absent in many developing countries. As President Xi said, "Our main goal is not to govern the people; our main goal is to save the people." If philanthropic leadership can be cultivated in these countries, they too might successfully implement poverty eradication programs, following China’s example.

Another key factor in the success of China's targeted poverty alleviation program was its system of governance. Since the Chinese Revolution in 1949, the strong and disciplined regime established under the Chinese Communist Party has been instrumental in the fight against poverty. Most developing countries lack the kind of socialist regime that exists in

China. Governments in these countries often change frequently, leading to shifts in policy with each new administration. This instability makes it challenging for other developing countries to wage a successful war against poverty as China did.

However, as Napoleon Bonaparte once said, President Xi Jin ping has proven that "China is a sleeping giant." The targeted poverty alleviation program, implemented under the theme of the Battle against Poverty, has been successful. It stands as another triumphant sociological achievement introduced to the world by our beloved Red Dragon.



**Dammika Muthugala**
**Director General,**
**Department of Samurdhi Development.**

# 06. ශ්‍රී ලංකාවේ ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ ලා ප්‍රජාශක්ති ව්‍යාපාරයේ සුවිශේෂී භූමිකාව

**සමාජසවිබලගැන්වීම, න්‍යායාත්මක ප්‍රවේශයන් සහ තිරසාර විසඳුම් පිළිබඳ විමර්ශනාත්මක විශ්ලේෂණය**

## 1. හැඳින්වීම සහ පසුබිම

ගෘහස්ථ හිංසනය යනු පවුල් පද්ධතිය තුළ සිදු වන්නා වූ ශාරීරික, මානසික, ලිංගික සහ ආර්ථික අතවරයන්ගෙන් සමන්විත සංකීර්ණ සහ බහු-මානීය සමාජ ගැටලුවකි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වර්ගීකරණයට අනුව, කාන්තාවන්ට සහ දරුවන්ට එරෙහිව සිදු වන හිංසනය ගෝලීය මහජන සෞඛ්‍යය මෙන්ම මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලබයි. ශ්‍රී ලංකාව වැනි සංස්කෘතික පසුබිමක් සහිත රටක, මෙම ගැටලුව බොහෝ විට සෘජු ව සමාජය හමුවට නො පැමිණෙන, පවුල් පවුරට මුවා වී සැඟවුණු අර්බුදයක් ලෙස ක්‍රියාත්මක වේ.
සම්ප්‍රදායික පුරුෂ මූලික සමාජ ව්‍යුහයන් සහ "පවුලේ රහස් පිටතට නො දීමේ" සාම්ප්‍රදායික මානසිකත්වය හේතුවෙන් ගෘහස්ථ හිංසනය අඛණ්ඩව වර්ධනය වෙමින් පවතී. මෙවැනි වටපිටාවක, හුදෙක් නීතිමය ප්‍රතිපාදන හෝ දඬුවම් මගින් පමණක් මෙම අර්බුදය මුලිනුපුටා දැමිය නො හැක. ඒ සඳහා ප්‍රජා මට්ටමෙන් ක්‍රියාත්මක වන, බිම් මට්ටමේ සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන "ප්‍රජාශක්ති" ව්‍යාපාරය මෙම කාර්ය ඉටු කිරීම සඳහා ඇති සාර්ථක ම සහ තිරසාර යාන්ත්‍රණයක් ලෙස හඳුනා ගත හැකිය.

## 2. සාහිත්‍ය විමර්ශනය

ජාත්‍යන්තර සාහිත්‍යයට අනුව, ගෘහස්ථ හිංසනය යනු හුදෙක් එක් රටකට පමණක් සීමා වූවක් නොව, ගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ මානව හිමිකම් සහ මහජන සෞඛ්‍ය අර්බුදයක් වන අතර, ලෝකය පුරා විවිධ රටවල් මෙම ගැටලුවට විසඳුම් සෙවීම සඳහා නීතිමය ප්‍රතිසංස්කරණවල සිට ප්‍රජා-මූලික මැදිහත් වීම් දක්වා විවිධ ප්‍රවේශයන් අත්හදා බලා ඇත. ජාත්‍යන්තර මට්ටමින් ගෘහස්ථ හිංසනය වැළැක්වීම සඳහා වූ මූලික පදනම වැටුණේ ගෝලීය සම්මුතීන් සහ මානව හිමිකම් ප්‍රකාශන හරහා වන අතර, ඒ අතරින් 1979 දී ඇති කර ගත් CEDAW සම්මුතිය (කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය) මගින් ගෘහස්ථ හිංසනය කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී (United Nations General Assembly [UNGA], 1979). මීට අමතරව, යුරෝපීය කවුන්සිලය විසින් 2011 දී ඇති කර ගත් "ඉස්තාන්බුල් සම්මුතිය" ජාත්‍යන්තර සාහිත්‍යය තුළ සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස

සැලකෙන්නේ, එමගින් ගෘහස්ථ හිංසනය වැළැක්වීම, වින්දිතයන් ආරක්ෂා කිරීම සහ වැරදි කරුවන්ට දඬුවම් පැමිණ වීම සඳහා වන විස්තීර්ණ නීතිමය රාමුව ලෝකයට හඳුන්වා දුන් බැවිනි.
විවිධ රටවල් ගෘහස්ථ හිංසනය පාලනය කිරීම සඳහා සාර්ථක ආකෘති කිහිපයක් නිර්මාණය කර ඇති අතර, සාහිත්‍ය විමර්ශන මගින් ඒවා ප්‍රධාන ක්ෂේත්‍ර 3ක් යටතේ වර්ගීකරණය කරයි. ඉන් පළමුවැන්න වන ඇමරිකා එක්සත් ජනපදයේ මිනසෝටා හි 1980 ගණන්වල ආරම්භ වූ "Duluth ආකෘතිය" ජාත්‍යන්තර ව වඩාත් ම ප්‍රසිද්ධ ප්‍රවේශයක් වන අතර, එහි දී "බලය සහ පාලනය" පිළිබඳ සංකල්පය මත පදනම්ව හිංසනය සිදු කරන පුද්ගලයන්ගේ ආකල්ප වෙනස් කිරීම සඳහා අධ්‍යාපනික සහ මනෝවිද්‍යාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කරමින් වැරදිකරුවන් පුනරුත්ථාපනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරිණි (Domestic Abuse Intervention Project [DAIP], 2011). දෙවනුව, එක්සත් රාජධානිය (UK) සහ යුරෝපීය රටවල් තුළ බිහි වූ MARAC (Multi-Agency Risk Assessment Conferences) වැනි "බහු-ආයතනික සම්බන්ධීකරණ ප්‍රවේශය" හරහා පොලීසිය, සෞඛ්‍ය අංශ, සමාජ සේවකයන් සහ නිවාස අධිකාරීන් එක්ව, ඇඩි අවදානමක සිටින වින්දිතයන් ආරක්ෂා කිරීම සඳහා ඒකාබද්ධ සැලසුම් සකස් කරනු ලබයි (SafeLives, 2014). තෙවනුව, දකුණු ආසියාව සහ අප්‍රිකාව කේන්ද්‍ර කර ගත් "ප්‍රජා-මූලික සහ ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රවේශයන්" පිළිබඳ පර්යේෂණවලට අනුව කාන්තාවන්ගේ ආර්ථික පරාධීනත්වය හිංසනයට සෘජුව ම බලපාන බව හඳුනාගෙන ඇති අතර, බංග්ලාදේශයේ BRAC සහ Grameen Bank වැනි ආයතන හරහා කාන්තාවන්ට ක්ෂුද්‍ර ණය (Microfinance) සහ සේවා නියුක්තික/ස්වයං රැකියා පුහුණුව ලබා දීම මගින් පවුල් තුළ ඔවුන්ගේ තීරණ ගැනීමේ බලය වැඩි වී ගෘහස්ථ හිංසනයට ලක් වීමේ ප්‍රවණතාව සැලකිය යුතු ලෙස අඩු වූ බව Hashemi et al., 1996 පෙන්වා දෙයි.

ජාත්‍යන්තර පර්යේෂණ පත්‍රිකා සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තා අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන ප්‍රධාන සොයා ගැනීම් කිහිපයක් පවතී. එහි දී හුදෙක් නීතියෙන් පමණක් හිංසනය නැවැත්විය නො හැකි බව තහවුරු වී ඇති අතර, ඇඩි නීති රීති සහ සිරදඬුවම් පැවති රටවල පවා සමාජ ආකල්ප වෙනස් නො කිරීම නිසා ගෘහස්ථ හිංසන අනුපාතයන් අඩු නොවන බව පර්යේෂණ (Dutton, 2015) පෙන්වා දෙයි. එසේම, ගෘහස්ථ හිංසනය නිසා රටක දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 1% සිට 2% දක්වා ප්‍රමාණයක් සෞඛ්‍ය වියදම් සහ සේවා නියුක්තිය අහිමි වීම හේතුවෙන් අදාළ රටවලට අහිමි වන බව ලෝක බැංකු දත්ත මගින් සනාථ කර ඇත. මෙම කරුණු අනුව, වඩාත්ම සාර්ථක ප්‍රතිඵල වාර්තා වී ඇත්තේ රාජ්‍ය නිලධාරීන්ට වඩා, ගමේ හෝ ප්‍රජාවේම නායකයන් සහ ස්වේච්ඡා කණ්ඩායම් මැදිහත් වී ප්‍රජා මට්ටමෙන් විසඳුම් සෙවූ ප්‍රජා මැදිහත් වීමේ වැදගත්කම (Community Ownership) මත පදනම් වූ "Bottom-up" ප්‍රවේශයන් තුළිනි (Chambers, 1994; Wallerstein, 2006).

ලෝකයේ විවිධ රටවල් ලබාගත් මෙම අත්දැකීම් දෙස බැලීමේ දී, ශ්‍රී ලංකාවේ ගෘහස්ථ හිංසනය වැළැක්වීම සඳහා ප්‍රජාශක්ති ව්‍යාපාරය යනු ජාත්‍යන්තරව පිළිගත් සාර්ථක ම උපායමාර්ගයක් ලෙස යොදා ගත හැකිය. එය ජාත්‍යන්තරව සාර්ථක වූ කාන්තා ආර්ථික සවි බල ගැන්වීමේ ආකෘතිය

(Micro-enterprise models) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සෘජුව ම ක්‍රියාත්මක කරන යාන්ත්‍රණයකි. එමෙන්ම, එක්සත් රාජධානියේ MARAC ආකෘතිය සිහි ගන්වමින්, ලංකාවේ පොලිසිය, සෞඛ්‍ය අංශ (පවුල් සෞඛ්‍ය සේවිකාවන්) සහ සමාජ සේවා එක ම ජාලයකට සම්බන්ධ කරන බහු-ආයතනික සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ලෙස ද ප්‍රජාශක්ති ව්‍යාපාරය ක්‍රියා කරනු ලබයි. අවසාන වශයෙන්, ප්‍රජා විද්‍යාත්මක න්‍යායන්ට අනුව, බාහිරින් පැමිණෙන බලපෑම්වලට වඩා දේශීය සංස්කෘතියට ගැළපෙන පරිදි ග්‍රාමීය කාන්තා සමිති සහ ප්‍රජා නායකයන් හරහා හිංසනය වැළැක්වීමට කටයුතු කිරීම නිසා, ප්‍රජාශක්ති ව්‍යාපාරය ලංකාව තුළ ක්‍රියාත්මක කළ හැකි තිරසාර සහ ජාත්‍යන්තර ප්‍රමිතියේ ප්‍රවේශය ලෙස හඳුනා ගත හැකිය.

### 3.ශ්‍රී ලංකාවේ ගෘහස්ථ හිංසනය

ශ්‍රී ලංකාව තුළ සිදු කර ඇති විවිධ විද්‍යාත්මක පර්යේෂණ සහ දත්ත පද්ධති මගින් ගෘහස්ථ හිංසනයේ බරපතලකම සහ එහි ව්‍යාප්තිය මනාව තහවුරු කර ඇති අතර, විශේෂයෙන්ම සමාජයේ වඩාත් අවදානමට ලක් විය හැකි කණ්ඩායම් මෙහි ගොදුරු බවට පත්වන බව දත්ත මගින් පෙන්වා දෙයි. ගර්භණී කාන්තාවන් පිළිබඳ සිදු කළ අධ්‍යයනයකට අනුව, ශ්‍රී ලංකාවේ ගර්භණී කාන්තාවන්ගෙන් සියයට 38.6 ක් තම ජීවිත කාලය තුළ කිසියම් හෝ ආකාරයක ගෘහස්ථ හිංසනයකට ලක්ව ඇති අතර, සියයට 15.9 ක් ගර්භණී සමයේ දී ද වර්තමානයේ එම අමිහිරි අත්දැකීමට මුහුණ දෙමින් සිටින අතර විශේෂයෙන්ම වතු ක්ෂේත්‍රය සහ ආන්තිකකරණය වූ ග්‍රාමීය ප්‍රජාවන් තුළ මෙම අගයන් තවදුරටත් ඉහළ යයි(Guruge, S. et al., 2018). කෙසේ වුව ද, උපකාර ලබාගැනීමේ පවතින බාධා පිළිබඳ පර්යේෂණ පෙන්වා දෙන්නේ පවුල් ඒකකය තුළ සිදු වන හිංසනයන් බහුතරයක් නීතිය හමුවට හෝ සෞඛ්‍ය අංශ වෙත වාර්තා නොවන බවත්; භීතිය, ලැජ්ජාව, සමාජ අපහාසයට ඇති බිය, ආර්ථික පරාධීනත්වය සහ නීතිමය ක්‍රියාවලිය පිළිබඳ ඇති අවිශ්වාසය මීට ප්‍රධාන හේතු වන බවත් ය (Haj-Yahia, M. et al., 2022). මෙම තත්ත්වය වින්දිතයන්ගේ මානසික සෞඛ්‍යයට දැඩි ලෙස බලපාන අතර, BMJ Open (2025) හි පළ වූ නවතම අධ්‍යයනයකට අනුව ගෘහස්ථ හිංසනය සහ ස්වයං හානිකරණය , විශේෂයෙන්ම වස පානය කිරීම් අතර සෘජු ධන සබඳතාවක් පවතින බවත්, දිගු කාලීන පීඩනය දරා ගත නො හැකි තැන වින්දිතයන් මෙවැනි අවාසනාවන්ත තීරණ වෙත යොමු වන බවත් ය. මීට අමතරව, පවුල තුළ පවතින මෙම තර්ජනය දරුවන්ට ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයන්ට (Journal of Interpersonal Violence, 2025) අනුව, ගෘහස්ථ හිංසනය නිතර දකින සහ එය අත්විඳින දරුවන්ගේ ඥානාන්විත වර්ධනය, හැසිරීම් රටා, අධ්‍යාපනය සහ සමාජීය කුසලතා බරපතළ ලෙස කඩා වැටෙන බව තහවුරු වේ.

## 4. ගෘහස්ථ හිංසනයේ ප්‍රධාන ආකාර සහ එහි ස්වභාවය

ගෘහස්ථ හිංසනය යනු හුදෙක් කායික රිදවීමක් පමණක් නොවේ. එය "හිංසනයේ චක්‍රය" (Cycle of Violence) ලෙස හඳුන්වන තර්ජනය, පීඩනය තීව්‍ර වීම, හිංසනය සිදු වීම, පසුව සමාව අයැදීම සහ නැවතත් හිංසනයට අවතීර්ණ වීම යන අදියරයන්ගෙන් සමන්විත වේ. මෙහි ප්‍රධාන ප්‍රකාශන ආකාර හතරක් හඳුනා ගත හැකිය:

| හිංසන ආකාරය | ප්‍රධාන ලක්ෂණ සහ ක්‍රියාකාරකම් | සමාජීය සහ මානසික ප්‍රතිඵලය |
|---|---|---|
| **කායික හිංසනය** | පහර දීම, තල්ලු කිරීම්, සීරීම්, ආයුධ හෝ ද්‍රව්‍ය මගින් දේපළ හා ශරීරයට හානි කිරීම. | තේරුම් ගත හැකි බාහිර තුවාල, සෞඛ්‍ය පිරිහීම, ජීවිත අවදානම. |
| **මානසික/භාවාත්මක** | නින්දා කිරීම, වාචික අපහාස, තර්ජනය කිරීම, පවුලේ අයගෙන් සහ සමාජයෙන් හුදකලා කිරීම. | විශාදය, කාංසාව, ආත්ම අභිමානය සම්පූර්ණයෙන්ම බිඳ වැටීම. |
| **ලිංගික හිංසනය** | කැමැත්තකින් තොර ව බලහත්කාරයෙන් ලිංගික සබඳතා සඳහා පොලඹවා ගැනීම හෝ බල කිරීම. | ගැඹුරු මානසික කැළැල්, ලිංගික සෞඛ්‍ය ගැටලු. |
| **ආර්ථික හිංසනය** | පවුලේ මුදල් පරිහරණය සම්පූර්ණයෙන් පාලනය, රැකියා කිරීමට අවස්ථාව අහුරා තැබීම, මූල්‍යමය වශයෙන් අසරණ කිරීම. | වෘත්තීය දියුණුව ඇණ හිටීම, මූල්‍යමය යැපීම හේතුවෙන් හිංසනය ඉවසීමට සිදු වීම. |

## 5. ප්‍රජාශක්ති ව්‍යාපාරය – සමාජ පරිවර්තනීය නව ප්‍රවේශයක්

ප්‍රජාශක්ති ව්‍යාපාරය යනු ශ්‍රී ලංකාවේ දිළිඳු භාවය පිටුදැකීම සහ ප්‍රජාව මූලික කර ගත් සමාජ සවි බල ගැන්වීම අරමුණු කර ගනිමින් රාජ්‍ය සහ සිවිල් මැදිහත් වීමෙන් ක්‍රියාත්මක වන ජාතික වැඩසටහනකි. ග්‍රාම නිලධාරි වසම් මට්ටමේ සිට ව්‍යුහගත වී ඇති මෙම වැඩසටහන, සාම්ප්‍රදායික ඉහළ සිට පහළට ගලා යන පාලන ක්‍රමවේදයන් වෙනුවට, බිම් මට්ටමේ සිට ඉහළට යන සහභාගිත්ව ප්‍රවේශයක් අනුගමනය කරයි. මෙම ලක්ෂණය නිසාම ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ හොඳම බලවේගය බවට ප්‍රජාශක්ති ව්‍යාපාරය හඳුනා ගත හැක.

## 6. ගෘහස්ථ හිංසනය පිටුදැකීමේ ලා ප්‍රජාශක්ති ව්‍යාපාරයේ උපායමාර්ගික දායකත්වය ලබා දිය හැකි ආකාරය

- **සමාජ දැනුවත් කිරීම සහ මනෝභාව පාලනය:** ගෘහස්ථ හිංසනය යනු හුදෙක් පවුලේ පෞද්ගලික ප්‍රශ්නයක් හෝ සාමාන්‍ය දෙයක් නොවන බව තහවුරු කිරීමට ගම් මට්ටමින් වැඩමුළු, ප්‍රජා

සාකච්ඡා සහ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. එමගින් ප්‍රජාව සතු වැරදි ආකල්ප පරිවර්තනයකට ලක් කිරීම.

- **කාන්තාවන්ගේ ආර්ථික සවි බල ගැන්වීම:** පර්යේෂණ සාක්ෂි අනුව ආර්ථික පරාධීනත්වය හිංසනය ඉවසීමට සිදු වන ප්‍රධාන සාධකයකි. ප්‍රජාශක්ති ව්‍යාපාරය මගින් වින්දිත කාන්තාවන්ට වෘත්තීය පුහුණු, සුළු පරිමාණ ව්‍යාපාර උපදේශන සහ සහනදායී ණය පහසුකම් ලබා දෙමින් ඔවුන් මූල්‍යමය වශයෙන් ස්වාධීන පුද්ගලයන් බවට පත් කිරීම.
- **ප්‍රජා ජාල සහ නායකත්වය ශක්තිමත් කිරීම:** ග්‍රාමීය කමිටු, කාන්තා සමිති සහ දේශීය ප්‍රජා නායකයන් සක්‍රීය කිරීම මගින් හිංසනයන් මුල් අවස්ථාවේදීම හඳුනා ගැනීමට සහ වාර්තා කිරීමට ඇති බිය තුරන් කිරීමට සුරක්ෂිත සමාජ වටපිටාවක් ගොඩ නැගීම.
- **බහු-පාර්ශවීය සේවා සම්බන්ධීකරණය:** ප්‍රජාශක්ති CDC ආයතනය විසින් ශ්‍රී ලංකා පොලීසිය (ළමා හා කාන්තා කාර්යාංශය), සෞඛ්‍ය අංශ (පවුල් සෞඛ්‍ය සේවිකාවන්, රෝහල්), සමාජ සේවා නිලධාරීන් සහ පවත්නා නීතිමය ආයතන එකම ජාලයකට සම්බන්ධීකරණය කරමින් වින්දිතයාට කඩිනම් සහන සලසා දීම.
- **නීතිමය සහාය සහ ආරක්ෂාව සැපයීම:** 2005 අංක 34 දරන ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත යටතේ ආරක්ෂණ නියෝග ලබා ගැනීමටත්, නොමිලේ නීති උපදෙස් සහ උපදේශන සේවා ලබා ගැනීමටත් වින්දිතයන්ට මගපෙන්වීම් සිදු කරනු ලබයි.

## 7.පවතින අභියෝග සහ බාධක

ප්‍රජාශක්ති ව්‍යාපාරය සාර්ථකව ක්‍රියාත්මක වුව ද, බිම් මට්ටමේ දී අභියෝග රැසකට මුහුණ දීමට සිදු වේ. "පවුලේ රහස් පිටතට නොයා යුතු ය" යන දැඩි සාම්ප්‍රදායික සංස්කෘතික විශ්වාසයන් සහ පුරුෂ ආධිපත්‍යය තවමත් ප්‍රබල බාධාවකි. එසේම, වින්දිතයන් මුහුණ දෙන සමාජ අපකීර්තිය (Stigma) හේතුවෙන් සිදුවීම් වාර්තා නො කිරීමේ ප්‍රවණතාව තවමත් ඉහළ මට්ටමක පවතී (Gunawardhena, 2018). මීට අමතරව, සමහර ග්‍රාමීය මධ්‍යස්ථාන සතු මූල්‍ය ප්‍රතිපාදන සීමිත වීම සහ කාර්ය මණ්ඩලයට හිංසන කළමනාකරණය පිළිබඳ පවතින විශේෂිත පුහුණු අවස්ථාවන්හි හිඟකම ද මෙහි ප්‍රගතියට බාධා පමුණුවයි (Centre for Women's Research [CENWOR], 2019).

## 8. ඉදිරි උපායමාර්ගික ප්‍රතිපත්ති නිර්දේශ

ප්‍රජාශක්ති ව්‍යාපාරයේ සේවාවන් තවදුරටත් ශක්තිමත් කරමින් ගෘහස්ථ හිංසනය පිටුදැකීමේ ලාංකීය ප්‍රමුඛතම ආයතනය ලෙස මෙම ව්‍යුහය යොදා ගැනීමට පහත ප්‍රතිපත්තිමය පියවර නිර්දේශ කෙරේ:

- **විශේෂිත ගෘහස්ථ හිංසන නිවාරණ ඒකක :** සෑම ප්‍රජා සංවර්ධන සභාවක් තුළ ම රහස්‍යභාවය සුරකින, මේ සඳහා ම වෙන් වූ ඒකක පුහුණු උපදේශකවරයන් සහිත ව ස්ථාපිත කිරීම.
- **ආර්ථික වැඩසටහන් පුළුල් කිරීම:** හිංසනයට ලක් වූ කාන්තාවන් ඉලක්ක කර ගනිමින් විශේෂිත ස්වයං රැකියා ජාල සහ වෙළඳපළ සම්බන්ධීකරණ සපයා දීම.

- **පාසල් මට්ටමේ දැනුවත් කිරීම්:** ප්‍රජාශක්ති දායකත්වයෙන් පාසල් දරුවන් සහ යෞවන යෞවනියන් තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ අන්‍යෝන්‍ය ගෞරවය පිළිබඳ ආකල්ප වර්ධනය කිරීම.
- **දත්ත කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම :** බිම් මට්ටමේ සිදුවීම් සහ ප්‍රවණතා නිවැරදිව විශ්ලේෂණය කිරීම සඳහා රහස්‍ය දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම.
- **ආයතනික සම්බන්ධතා පුළුල් කිරීම:** රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සංවිධාන සමඟ පවතින සහයෝගිතාව තවදුරටත් පුළුල් කිරීම.

## 8. නිගමනය

ගෘහස්ථ හිංසනය යනු ශ්‍රී ලංකාවේ පවුල් සංස්ථාව මෙන්ම සමස්ත මානව ප්‍රාග්ධනය විනාශ කරන බරපතළ නිහඬ අර්බුදයක් වන අතර, ඒ සඳහා හුදෙක් නීතිමය රාමු සහ අධිකරණමය ක්‍රියාමාර්ග පමණක් ප්‍රමාණවත් නොවේ. සමාජ ව්‍යුහය තුළින් ම සහ ප්‍රජාව ගේ සක්‍රීය දායකත්වයෙන් මේ සඳහා තිරසාර විසඳුම් සෙවිය යුතු ය. ප්‍රජාශක්ති ව්‍යාපාරය සතු බිම් මට්ටම දක්වා ව්‍යාප්ත වූ ආයතන ව්‍යුහය, සහභාගිත්ව සංවර්ධන න්‍යායාත්මක ප්‍රවේශය සහ බහු-ආයතනික සම්බන්ධීකරණ හැකියාව නිසා, ශ්‍රී ලංකාව තුළ ගෘහස්ථ හිංසනය වැළැක්වීම සඳහා ක්‍රියාත්මක කළ හැකි සහ දැනට පවතින විශිෂ්ටතම මෙන්ම වඩාත් ප්‍රායෝගික යාන්ත්‍රණය ලෙස අවධාරණය කළ හැකිය.

## 9. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (References - APA Style)


- BMJ Open. (2025). The socio-economic impact of domestic violence and its correlation with self-harm and poisoning trends in South Asia: A Sri Lankan perspective. BMJ Journals.
- Haj-Yahia, M., & de Zoysa, P. (2022). Barriers to help-seeking among women victims of domestic violence in rural and urban Sri Lanka. BMC Public Health, 22, 1102.
- Hashemi, S. M., Schuler, S. R., & Riley, A. P. (1996). Rural credit programs and women's empowerment in Bangladesh. World Development, 24(4), 635–653. https://doi.org/10.1016/0305-750X(95)00159-A
- United Nations General Assembly. (1979). Convention on the Elimination of All Forms of Discrimination against Women. United Nations, Treaty Series, vol. 1249, p. 13.https://www.ohchr.org/en/instruments-mechanisms/instruments/convention-elimination-all-forms-discrimination-against-women

- Council of Europe. (2011). Council of Europe Convention on preventing and combating violence against women and domestic violence (Council of Europe Treaty Series - No. 210). https://rm.coe.int/168008482e
- Domestic Abuse Intervention Project. (2011). The Duluth Model: Changing attitudes and behaviors in domestic abuse. https://www.theduluthmodel.org/
- SafeLives. (2014). Multi-Agency Risk Assessment Conferences (MARAC) implementation guide. https://safelives.org.uk/
- Dutton, D. G. (2015). The domestic assault of women: Psychological and criminal justice perspectives. UBC Press. (International Literature Data)
- Journal of Interpersonal Violence. (2025). The psychological toll of witnessing domestic abuse: A longitudinal study on Sri Lankan children and adolescents. JIV Research.
- Gunawardhena, N. (2018). Cultural barriers and underreporting of domestic violence in Sri Lanka. Sri Lanka Journal of Social Sciences, 41(2), 85–97. https://doi.org/10.4038/sljss.v41i2.7700
- Centre for Women's Research. (2019). Challenges in community-based interventions for gender-based violence in rural Sri Lanka (Policy Brief No. 4). CENWOR.
- Chambers, R. (1994). The origins and practice of participatory rural appraisal. World Development, 22(7), 953–969. https://doi.org/10.1016/0305-750X(94)90141-4
- Wallerstein, N. B. (2006). What is the evidence on effectiveness of empowerment to improve health? (Health Evidence Network Report). World Health Organization Regional Office for Europe. https://apps.who.int/iris/handle/10665/107740




**ආචාර්ය ඩබ්ලිව්. එම්. නිරංජලා හුළුගල්ල**

**අධ්‍යක්ෂ, (සංවර්ධන, මූල්‍ය හා අභ්‍යන්තර කටයුතු)**

**ප්‍රජාශක්ති ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා ජනාධිපති ලේකම් කාර්යාලය**

# 07. வளர்ந்து வரும் நாடாகிய இலங்கையில் ’பிரஜா சக்தி’ வேலைத்திட்டத்தின் முக்கியத்துவம்

**சுருக்கம்**

ஒரு நாட்டின் உண்மையான அபிவிருத்தி பொருளாதார அபிவிருத்தியால் மட்டும் அளவிடப்படுவதில்லை; ஒவ்வொரு குடிமகனும் கண்ணியமான வாழ்க்கை வாழ்வதற்கான வாய்ப்பைப் பெறுவதே உண்மையான அபிவிருத்தியாகும். இலங்கையில் அறிமுகப்படுத்தப்பட்டுள்ள ’பிரஜா சக்தி’ தேசிய வறுமை ஒழிப்பு இயக்கம், வறுமையை பன்முக அணுகுமுறையின் மூலம் எதிர்கொண்டு, சமூக அதிகாரமளித்தலை மையமாகக் கொண்ட புதிய அபிவிருத்தி மாதிரியை முன்வைக்கிறது. இக்கட்டுரை பிரஜா சக்தி வேலைத்திட்டத்தின் தத்துவம், அமைப்பு, ஆறு தூண்கள், சமூக அபிவிருத்திச் சபைகளின் பங்கு, நிர்வாகப் பரிமாணம் மற்றும் தேசிய அபிவிருத்தி இலக்குகளுடனான தொடர்பை சுருக்கமாக ஆராய்கிறது.

**முக்கிய சொற்கள்**

பிரஜா சக்தி, பன்முக வறுமை, சமூக வலுவூட்டல் , கிராமிய அபிவிருத்தி, சமூக அபிவிருத்திச் சபை, நிலையான அபிவிருத்தி.

## 1. அறிமுகம்

இருபத்தொன்றாம் நூற்றாண்டில் உலகநாடுகள் பல்வேறு துறைகளில் வேகமாக முன்னேறியிருந்தாலும், வறுமை இன்னும் மனிதகுலத்தின் மிகப்பெரிய சவாலாகவே உள்ளது. இலங்கை மனிதவளத் திறனில் முன்னேறியிருந்தாலும் வளர்ந்து வரும் நாடாகவே வகைப்படுத்தப்படுகிறது. சமீபத்திய பொருளாதார நெருக்கடி, கொவிட்-19 பெருந்தொற்று, விலை உயர்வு மற்றும் வேலைவாய்ப்புக் குறைவு போன்ற காரணிகள் பல குடும்பங்களை மீண்டும் வறுமைக் கோட்டிற்குக் கீழ் தள்ளின. குறுகியகால நிதியுதவி மட்டும் போதுமான தீர்வாக அமையாது என்பது தெளிவானது.

கடந்த காலங்களில் பணம், வீடு, உதவித்தொகை போன்றவை வழங்கப்பட்டாலும், தொழில் திறன், நிலையான வருமானம் மற்றும் சமூகத் தலைமைத்துவம் உருவாக்கப்படாததால் பல குடும்பங்கள் அரசு உதவியைச் சார்ந்த வாழ்க்கை முறையில் சிக்கின. இந்த அனுபவங்களிலிருந்து கற்றுக்கொண்டு, "உதவி" (Welfare) என்ற அணுகுமுறையிலிருந்து "வலுவூட்டல்" (Empowerment) என்ற அணுகுமுறைக்கு மாறியதன் வெளிப்பாடே பிரஜா சக்தி.

இதன் மையக் கருத்து: "வறுமையை ஒழிப்பது அரசாங்கத்தின் பொறுப்பு மட்டுமல்ல; சமூகங்களே தங்களது அபிவிருத்தியின் தலைமைப் பொறுப்பை ஏற்க வேண்டும்." இதன் தொலைநோக்கு "வளமான நாடு — அழகான வாழ்க்கை" என்ற தேசிய இலட்சியமாகும்.

### 2. பன்முக வறுமை மற்றும் இலங்கையின் தற்போதைய நிலை

வறுமை என்பது வருமானக் குறைபாடு மட்டுமல்ல; உலக வங்கியும் ஐக்கிய நாடுகள் சபையும் அதை கல்வி, சுகாதாரம், பாதுகாப்பு, சேவைகள் மற்றும் மனித கண்ணியத்திற்கான வாய்ப்புகளை மறுக்கும் நிலையாக விளக்குகின்றன. காலப்போக்கில் வறுமை பற்றிய புரிதல் வருமான அடிப்படையிலிருந்து அடிப்படைத் தேவைகள், மனித அபிவிருத்திக் குறியீடு (HDI) என்று கடந்து, இன்று கல்வி, உடல்நலம் மற்றும் வாழ்வாதாரத் தரம் ஆகிய மூன்று பரிமாணங்களை அடிப்படையாகக் கொண்ட பன்முக வறுமை (Multidimensional Poverty) என்ற அணுகுமுறையை எட்டியுள்ளது.

இலங்கையில் கிராமப்புறங்கள், தோட்டத் துறை, மீனவ சமூகங்கள், வறண்ட மண்டலங்கள், பெண்கள் தலைமையிலான குடும்பங்கள், மாற்றுத்திறனாளிகள் மற்றும் முதியவர்கள் அதிகளவில் பாதிக்கப்படுகின்றனர். பொருளாதார நெருக்கடிக்குப் பின்னர் உணவுப் பாதுகாப்பு, சேமிப்பு மற்றும் வேலைவாய்ப்பு குறைந்து, பாடசாலை விலகல்களும் கடன் சுமையும் அதிகரித்துள்ளன. இதனால் ஒரு குடும்பத்திற்கு பண உதவி வழங்கினாலும், தொழில் திறன், சாலை, குடிநீர் அல்லது மருத்துவ சேவை இல்லையெனில் அக்குடும்பம் உண்மையில் வறுமையிலிருந்து விடுபட முடியாது. இதுவே பிரஜா சக்தி ஒவ்வொரு குடும்பத்திற்கும் தனிப்பட்ட, பன்முகத் தேவை மதிப்பீட்டின் அடிப்படையிலான அபிவிருத்தித் திட்டத்தை வடிவமைக்கக் காரணமாகும்.

### 3. பிரஜா சக்தியின் தோற்றம், தத்துவம் மற்றும் நோக்கம்

பிரஜா சக்தி வெறும் நலன்புரித் திட்டமல்ல; அது ஒரு தேசிய சமூக மாற்ற இயக்கம். இது உலகளவில் ஏற்றுக்கொள்ளப்பட்ட Community Driven Development (CDD) மற்றும் Participatory Development கோட்பாடுகளுடன் ஒத்துப்போகிறது. இதன் தொலைநோக்கு, சமூக அதிகாரமளித்தலின் மூலம் வறுமையற்ற, தன்னிறைவு பெற்ற இலங்கையை உருவாக்குவதாகும்; பணி என்பது சமூகத் தலைவர்களை உருவாக்கி, வாழ்வாதார வாய்ப்புகளையும் வெளிப்படையான நிர்வாகத்தையும் வளர்ப்பதாகும். மக்கள் பங்கேற்பு, சமூக வலுவூட்டல், சமத்துவம் மற்றும் வெளிப்படைத்தன்மை ஆகியவை இதன் அடிப்படைத் தத்துவங்களாகும்.

பழைய அணுகுமுறையில் அரசாங்கம் உதவி வழங்க, மக்கள் அதைப் பெறும் சார்பு மனப்பான்மை உருவானது. புதிய அணுகுமுறையில் சமூகங்களே பிரச்சினைகளை அடையாளம் கண்டு, தீர்வுகளை வடிவமைத்து, அரசு வசதிகளை ஏற்படுத்த, சமூகங்கள் செயல்படுத்தும் வகையில் நிலையான அபிவிருத்தி உருவாகிறது. இந்த மாற்றமே பிரஜா சக்தியை சாதாரண நலன்புரித் திட்டத்திலிருந்து சமூக மாற்ற இயக்கமாக உயர்த்துகிறது.

## 4. பிரஜா சக்தியின் ஆறு தூண்கள்

வருமானத்தை மட்டும் அதிகரிப்பது வறுமையை ஒழிக்காது; சமூகத்தின் ஒவ்வொரு துறையும் சமநிலையுடன் வளர வேண்டும் என்ற கொள்கையின் அடிப்படையில் பிரஜா சக்தி ஆறு தூண்களாக வடிவமைக்கப்பட்டுள்ளது:

- சமூகச் சூழல் — பாதுகாப்பான வீடு, தூய குடிநீர், மின்சாரம், கழிவகற்றல் மற்றும் இணைய வசதி.
- உணவுப் பாதுகாப்பு — நவீன விவசாயம், வீட்டுத் தோட்டங்கள், கால்நடை வளர்ப்பு, ஊட்டச்சத்து பாதுகாப்பு.
- வழங்கல் வலையமைப்பு மற்றும் அணுகல் — சாலைகள், சந்தைகள், போக்குவரத்து, களஞ்சிய வசதிகள்.
- மனிதவள மேம்பாடு — கல்வி, தொழிற்பயிற்சி, இளைஞர் மற்றும் பெண்கள் திறன் மேம்பாடு.
- பாதுகாப்பு மற்றும் சமூகப் பாதுகாப்பு — பாதிக்கப்படக்கூடிய குழுக்களுக்கான ஆதரவு, சட்ட உதவி.
- உற்பத்தி மற்றும் பொருளாதாரம் — சிறு தொழில்கள், கூட்டுறவுகள், மதிப்புக்கூட்டப்பட்ட உற்பத்தி.

இந்த ஆறு தூண்களும் தனித்தனியாக அல்ல, ஒன்றுக்கொன்று வலுவூட்டும் வகையில் இயங்குகின்றன — தரமான கல்வி திறமையான மனிதவளத்தை உருவாக்க, அது உற்பத்தியையும் வருமானத்தையும் அதிகரிக்க, அது உணவுப் பாதுகாப்பையும் உடல்நலத்தையும் மேம்படுத்தும் வகையில் ஒரு ஒருங்கிணைந்த அபிவிருத்தி சுழற்சி உருவாகிறது.

### 5. சமூக அபிவிருத்திச் சபைகள் (CDC)

பிரஜா சக்தியின் தனிச்சிறப்பு, கிராம மட்டத்தில் சமூக அபிவிருத்திச் சபைகள் (Community Development Councils) உருவாக்கப்பட்டு, மக்களே தமது கிராமத்தின் எதிர்காலத்தைத் திட்டமிடுவதாகும். முன்பு மேலிருந்து கீழாகத் திணிக்கப்பட்ட திட்டங்கள் பல மக்களின் உண்மையான தேவைகளுடன் பொருந்தாததால் நிலையான பலனளிக்கவில்லை. CDC-கள் கிராமத்தின் பிரச்சினைகளை அடையாளம் கண்டு, முன்னுரிமைகளை நிர்ணயித்து, ஒருங்கிணைந்த கிராம அபிவிருத்தித் திட்டத்தைத் தயாரித்து, சமூகக் கணக்காய்வு மூலம் வெளிப்படைத்தன்மையை உறுதிப்படுத்துகின்றன.

தலைவர், செயலாளர், சமூக-பெண்கள்-இளைஞர் பிரதிநிதிகள் மற்றும் அரச அலுவலர் ஒருங்கிணைப்புடன் அமைந்த CDC-கள், பிரச்சினையின் மூல காரணத்தைக் கண்டறிய '5 Why' முறையையும் பயன்படுத்துகின்றன. பெண்கள் மற்றும் இளைஞர்களின் தலைமைத்துவத்தை ஊக்குவிப்பதன் மூலம் தலைமுறை மாற்றத்தையும் இவை உருவாக்குகின்றன. அதேநேரம், மக்கள் பங்கேற்பின் குறைவு, அரசியல் தலையீடு, நிதி மற்றும் திறன் பற்றாக்குறை போன்ற சவால்களும் CDC-களுக்கு உள்ளன.

### 6. நல்லாட்சி, சமூகக் கணக்காய்வு மற்றும் டிஜிட்டல் மாற்றம்

நல்லாட்சி, வெளிப்படைத்தன்மை, பொறுப்புக்கூறல் மற்றும் மக்கள் பங்கேற்பு இல்லாத அபிவிருத்தித் திட்டங்கள் நீண்டகாலம் நிலைக்காது. பிரஜா சக்தி இதற்காக சமூகக் கணக்காய்வை (Social Audit) முக்கிய நிர்வாகக் கருவியாகப் பயன்படுத்துகிறது — இது நிதிக் கணக்காய்விலிருந்து வேறுபட்டு, மக்களே திட்டங்களின் தரம், பயன் மற்றும் வெளிப்படைத்தன்மையை மதிப்பீடு செய்யும் செயல்முறையாகும். தகவல் பகிர்வு, ஆவணத் தயாரிப்பு, மக்கள் சந்திப்பு, கேள்வி-பதில் மற்றும் திருத்த நடவடிக்கை என ஐந்து படிகளில் இது நடைபெறுகிறது, மேலும் இது ஊழலைக் குறைக்கும் சமூக கட்டுப்பாட்டு அமைப்பாகவும் செயல்படுகிறது.

டிஜிட்டல் தொழில்நுட்பத்தின் மூலம் பயனாளிகளை துல்லியமாக அடையாளம் காணுதல், முன்னேற்றத்தைக் கண்காணித்தல் மற்றும் தரவு அடிப்படையிலான முடிவெடுத்தல் சாத்தியமாகி, நிர்வாகத்தின் திறனும் நம்பகத்தன்மையும் உயர்கின்றன. இவை அனைத்தும் இணைந்து SDG 16 (நல்லாட்சி மற்றும் வலுவான நிறுவனங்கள்) இலக்கை அடைவதற்கும் பங்களிக்கின்றன.

### 7. உள்ளடக்கிய அபிவிருத்தி: பெண்கள், இளைஞர்கள் மற்றும் விவசாயம்

பொருளாதார அபிவிருத்தியின் பலன்கள் அனைவருக்கும் சமமாகச் சென்றடையும் 'உள்ளடக்கிய அபிவிருத்தி' (Inclusive Development) பிரஜா சக்தியின் மையக் கொள்கையாகும். பெண்களின் பொருளாதார பங்கேற்பு அதிகரிக்கும்போது குழந்தைகளின் கல்வி, சுகாதாரம் மற்றும் ஊட்டச்சத்து நேரடியாக மேம்படுவதால், பெண்கள் CDC உறுப்பினர்களாகவும், சுயதொழில் மற்றும் சுய உதவிக் குழுத் தலைவர்களாகவும் மாற ஊக்குவிக்கப்படுகின்றனர். இளைஞர்களுக்கு தொழிற்பயிற்சி, டிஜிட்டல் திறன்கள் மற்றும் தொழில்முனைவோர் பயிற்சி வழங்கி, அவர்களை வேலை தேடுபவர்களாக அல்ல, வேலை உருவாக்குபவர்களாக மாற்றும் நோக்கம் கொள்ளப்பட்டுள்ளது.

கிராமப்புற வறுமையின் மையத்தில் விவசாயம் இருப்பதால், சொட்டு நீர்ப்பாசனம், வறட்சியைத் தாங்கும் பயிர்கள் போன்ற காலநிலை தகவமைப்பு தொழில்நுட்பங்களையும், பழச்சாறு மற்றும் தேங்காய் சார்ந்த பொருட்கள் போன்ற மதிப்புக்கூட்டலையும் பிரஜா சக்தி ஊக்குவிக்கிறது. சிறு மற்றும் நடுத்தர தொழில்களுக்கு பயிற்சி, நிதி மற்றும் சந்தைப்படுத்தல் ஆதரவு வழங்கப்படுகிறது. தனிநபரை விட குடும்பத்தை அபிவிருத்தியின் அடிப்படை அலகாகக் கருதி, வருமானம், கல்வி, சுகாதாரம் மற்றும் குடிநீர் ஆகியவற்றை ஒருங்கிணைத்து மேம்படுத்தும் போது மட்டுமே வறுமையிலிருந்து நிரந்தரமாக விடுபட முடியும் என்பதே இதன் அடிப்படைக் கொள்கை. இது முழுமையாக செயல்படுத்தப்பட்டால் வேலைவாய்ப்பு, குடும்ப வருமானம் மற்றும் கிராமப்புற உற்பத்தி அதிகரித்து, தேசிய பொருளாதாரமும் வலுவடையும்.

### 8. SDGs, சவால்கள் மற்றும் கொள்கைப் பரிந்துரைகள்

பிரஜா சக்தி வேலைத்திட்டம் 2015-இல் அறிவிக்கப்பட்ட 17 நிலையான அபிவிருத்தி இலக்குகளில் (SDGs) பலவற்றுடன் — குறிப்பாக SDG 1 (வறுமை ஒழிப்பு), SDG 2 (உணவுப் பாதுகாப்பு), SDG 4 (தரமான கல்வி), SDG 5 (பாலின சமத்துவம்), SDG 8 (கண்ணியமான வேலை) மற்றும் SDG 16 (நல்லாட்சி) — நேரடியாக இணைகிறது. எனினும், அரசியல் மாற்றங்கள், வளப் பற்றாக்குறை, சமூக பங்கேற்பின் குறைவு, திறன் குறைபாடு மற்றும் தரவு மேலாண்மைச் சவால்கள் இதன் நீண்டகால வெற்றியை பாதிக்கக்கூடும்.

இவற்றைச் சமாளிக்க, வலுவான சட்ட அடிப்படை, தொடர்ச்சியான திறன் மேம்பாட்டுப் பயிற்சி, தேசிய டிஜிட்டல் தரவுத்தளம், இளைஞர் தொழில்முனைவு மையங்கள், பெண்கள் பொருளாதார வலுவூட்டல், பல்கலைக்கழக ஒத்துழைப்பு, தனியார் துறை பங்கேற்பு மற்றும் சமூகக் கணக்காய்வைக் கட்டாயமாக்குதல் ஆகிய கொள்கைப் பரிந்துரைகள் முன்வைக்கப்படுகின்றன. இந்தியா, பங்களாதேஷ், வியட்நாம் போன்ற நாடுகளின் மக்கள்

பங்கேற்பு அடிப்படையிலான அபிவிருத்தி அனுபவங்களும் இதற்கு வலுவான ஆதாரமாக அமைகின்றன.

### முடிவுரை

"ஒரு நாட்டின் உண்மையான செல்வம் அதன் இயற்கை வளங்களோ அல்லது பொருளாதாரச் சொத்துகளோ அல்ல; அதன் மக்களின் திறன், ஒற்றுமை மற்றும் சமூக வலிமையே ஆகும்." இந்த அடிப்படையில், பிரஜா சக்தி தேசிய இயக்கம் இலங்கையின் வறுமை ஒழிப்பு வரலாற்றில் ஒரு புதிய திருப்புமுனையாகக் கருதப்படலாம். இது உதவிகளை வழங்கும் திட்டமாக அல்லாமல், கல்வி, உடல்நலம், உணவுப் பாதுகாப்பு, நல்லாட்சி, பெண்கள் மற்றும் இளைஞர் வலுவூட்டல் மற்றும் பொருளாதார உற்பத்தி ஆகிய அனைத்தையும் ஒருங்கிணைத்து, சமூகங்களைத் தன்னிறைவு அடையச் செய்யும் தேசிய சமூக மாற்ற இயக்கமாக உருவாக்கப்பட்டுள்ளது. முழுமையான அர்ப்பணிப்புடன் நடைமுறைப்படுத்தப்பட்டால், இது இலங்கையின் கிராமப்புறங்களை மட்டுமல்ல, முழு நாட்டின் சமூக-பொருளாதார அமைப்பையே மாற்றக்கூடிய திறன் கொண்டதாகும்.



**H.M.M. றுவைத்**
**பிரதிப் பணிப்பாளர் - திட்டமிடல்**
**கிராம அபிவிருத்தி பயிற்சி மற்றும் ஆராய்ச்சி நிறுவனம்.**

# 08. සමාජ සජීවීකරණය සහ ප්‍රජා සවිබලගැන්වීම

සමාජ සජීවීකරණය සඳහා නිශ්චිත වූ නිර්වචනයන් සැපයීම අපහසු වුවත් ඒ පිළිබඳව ඉදිරිපත් වි ඇති අදහස් කිහිපයක් මෙසේ දැක්විය හැකිය. සමහර සමාජ විද්‍යායින්ට අනුව, සජීවිකරණය යනු තමන්ගේම සහභාගිත්වය තුළ තමන්ට බලපාන ප්‍රශ්න හඳුනා ගැනිමට, ඒවාට විසඳුම් සැලසුම් කර ගැනිමට  සහ ඒ සඳහා සාමූහිකව ක්‍රියාකිරීමට ප්‍රජාව යොමු කිරීමේ ප්‍රජා මූලික සංවර්ධන ක්‍රියාදාමයකි. තවත් සමහරෙක් සමාජ සජීවිකරණය අර්ථකථනය කරන්නේ උත්ප්‍රේරක මැදිහත් වීමත් තුළ ප්‍රජාව විශේෂයෙන් දිළිඳු ප්‍රජාවගේ දැන්වත්භාවය සහ සාමූහික ශක්තිය වර්ධනය මුල් කර ගත් ප්‍රජා සවිබලගැන්විමේ ක්‍රියාවලියක් ලෙසය.

දකුණු ආසියාතික රටවල විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සමාජ සජිවිකරණය යන්න බහුලව භාවිතා කරන්නේ  සමාජ ආර්ථික ප්‍රගමනය සඳහා ග්‍රාමීය දිළිඳු ප්‍රජාව දැනුවත්භාවයට සහ සාමූහිකව ක්‍රියා කිරීමට  යොමු කෙරෙන සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් ලෙසය. ශ්‍රී ලංකාවේ විසූ ප්‍රකට සමාජ ආර්ථික විද්‍යාඥයකු වන මහාචාර්ය සිරිසේන තිලකරත්න මහතා එවකට (1978) ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මගින්  ක්‍රියාත්මක වූ,  පසු කාලයේදී විපර්යකාරක වැඩසටහන මගින් ප්‍රචලිත වූ නියාමක ව්‍යාපෘතිය ගැන සඳහන් කරමින් කියා සිටියේ ව්‍යාපෘතිය විසින් නිර්මාණය කරන ලද සජිවිකරණ ක්‍රමවේදය සිය සංවර්ධන අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ග්‍රාමීය දිළිඳු ප්‍රජාව බලමුළු ගැන්විමේ (Empowerment  of poor) මානව සංවර්ධන ක්‍රියාවලියක් ලෙසය.

සජිවිකරණය වැඩිහිටි අධ්‍යාපන ක්‍රියාවලියක් ලෙස දකින පාර්ශවයක් ද සිටි. ඔවුන්ට අනුව පීඩනයට සහ  දුගී බවට පත් ජන කොටස් ඉන් මුදවා ගැනීම, ඔවුන් දැනුවත් කිරිම සහ උත්ප්‍රේරණය සඳහා ඔවුනට ඔරොත්තුදෙන ආකාරයේ අධ්‍යාපන ක්‍රියාවලියක් අවශ්‍යය. බ්‍රසීල අධ්‍යාපන විශේෂඥයකු වූ Paulo Freire (1970) ට අනුව වැඩිහිටි අධ්‍යාපන ක්‍රියාවලිය තුළ සිදුවිය යුත්තේ අධ්‍යාපනය ලබා දීමට වඩා අධ්‍යාපනය ලබා දෙන්නා සහ අධ්‍යාපනය ලබන්නන් අතර කෙරෙන ද්විපාර්ශ්වීය සාකච්ඡා සහ සංවාද තුළ දෙපාර්ශවයම පවත්නා සමාජ අර්ථික යථාර්තයන් අවබෝධ කර ගැනීමය. සමාජ සජීවීකරණ ක්‍රියාවලිය තුළද මූලික වශයෙන් අපේක්ෂා කරන්නේ සජීවීකාරක (මැදිහත්කරු) සහ දුප්පත් ප්‍රජාව අතර සිදුවන සාකච්ඡා  හා සංවාද තුළ දෙපාර්ශවයම පවත්නා සමාජ ආර්ථික ක්‍රියාවලියේ යතාර්ථය තේරුම් ගැනීමටත්  තමන්ට වාසිදායක ලෙස එම තත්වය වෙනස් කර ගැනීමට සාමූහිකව ක්‍රියාත්මක වීම සඳහා ඔවුන් යොමු කිරිමත්ය. එසේ බලන විට Freire ගේ ලිබරල්වාදී අදහස් සහ සමාජ සජිවිකරණයේ වර්ථමාන අපේක්ෂා අතර බොහෝ දුරට සමානකමක් දක්නට ලැබේ. ඒ අනුව සජිවිකරණ සංකල්පය 1970 දශකය මුල් භාගය දක්වා ඈතට ගමන් කරන බැව් පෙනී යයි.

SIDA ආයතනය මගින් විපර්යකාරක වැඩසටහන ඇතුළු ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සඳහා සපයනු ලැබූ මූල්‍යාධාර භාවිතය පිළිබඳව ඇගයීමක යෙදුනු Lindal (1991) ට අනුව දැනුවත් කිරීම,

කණ්ඩායම් ලෙස ඒකරාශී කිරීම, සහ සාමූහිකව ක්‍රියාකිරීම යන කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් තමන් අත්විඳින අවාසිදායක තත්වයන්ගෙන් මිදීම සඳහා දිළිඳු ප්‍රජාව බලමුළු ගැන්වීමේ සජීවීකරණ ක්‍රමවේදයක් පිළිබඳ වූ මුල්ම වැඩසටහන ශ්‍රී ලංකාවේ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මගින් ක්‍රියාත්මක වූ විපර්යකාරක වැඩසටහනය.

“This process leads to empowerment of poor enabling them to escape from disadvantaged situation they are subject to. Social mobilisation does not take place automatically. It needs catalytic intervention. Change Agent Program initiated by Rural Development Training and Research Institute (RDTRI), Sri Lanka is a pioneer program of this nature where emphasis on awareness orientation, group formation and collective action.”

ලින්ඩාල් සඳහන් කල පරිදිම සජීවීකරණ ක්‍රමවේදයන් තුළ දිළිඳු ප්‍රජාව සවිබලගැන්වීම මුල් කරගත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ මුල්ම ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය 1978 වර්ෂය අගභාගයේදී ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ මැදිහත් වීමෙන් ආරම්භ කර ක්‍රියාත්මක කරනු ලැබූ විපර්යකාරක වැඩසටහනයි.

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ පැවති එක් සංවාදශීලී වැඩමුළුවකදී ඊට සහභාගිවූවන් විසින් ඒකමතිකව ලබා දුන් පහත දැක්වෙන නිර්වචනය ද සමාජ සජීවිකරණය යන්න පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට ප්‍රයෝජනවත් වේ යයි අදහස් කරමි.

"ප්‍රධාන සංවර්ධන ක්‍රියාවලියෙන් ගිලිහී ගිය සියලුම ආකාරයේ අසාධාරණ සහ අවාසිදායක තත්වයන්ට භාජනය වූ දිළිඳු ජන කොටස් උත්ප්‍රේරක ක්‍රියාවලියක් ඔස්සේ දැනුවත්භාවයට සහ සංවිධානයවීමට ඉඩ ප්‍රස්ථා ඇති කිරීම සහ ඔවුන් සාමූහිකව ක්‍රියා කිරීමට යොමු කිරීම තුළින් ඔවුන් දැනට අත්විඳින සියලුම ආකාරයේ අවාසිදායක තත්වයන් ජයගෙන ප්‍රධාන සංවර්ධන ප්‍රවාහය තුළ ඔවුන්ට ප්‍රතිලාභ ලබා ගැනීමට සැලස්වීමේ අඛණ්ඩ ක්‍රියාවලිය සමාජ සජීවිකරණය නම් වේ.”

1960 සහ 70 දශකයන්

1960 - 70 එක්සත් ජාතීන්ගේ පළමු සංවර්ධන දශකය තුළ දකුණු ආසියාවේ වෙනත් රටවල් මෙන්ම ශ්‍රී ලංකාවේ ද ග්‍රාමසංවර්ධන ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමේදී වැඩි අවධානයක් යොමු කරනු ලැබුවේ නිෂ්පාදනය වැඩි කිරීම සහ සමාජ සුභ සාධනය මුල් කර ගත් වැඩසටහන් සඳහාය. එහෙත් මෙම ක්‍රියාවලිය තුළ නිෂ්පාදනය සහ සමාජ සුභ සාධනය පැත්තෙන් යම් වර්ධනයක් සිදු වුවද දිළිඳුකම සහ රැකියා වියුක්තිය අවම වීම යන කරුණු බලන විට සාර්ථක ප්‍රතිඵලයක් පෙන්නුම් කිරීමට අපොහොසත් වී ඇත. ඒ අනුව එක්සත් ජාතීන්ගේ දෙවන සංවර්ධන දශකයේදී (1970-1980) ලෝක බැංකුව වැඩි අවධානයක් යොමු කළේ නිෂ්පාදනය මෙන්ම නිෂ්පාදන ඵලදායකත්වය වැඩි කිරීම තුළ ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීමේ වැඩසටහන් කෙරෙහිය.

70 දශකය අවසාන භාගය වන විට ඉන්දියාව, බංග්ලාදේශය, තායිලන්තය වැනි දකුණු ආසියාතික රටවල් ද එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිපික් සංවර්ධන ආයතනයේ ( UNAPDI) සහය ඇතිව ග්‍රාමීය දිළිඳුකම පිටු දැකීම පිළිබඳව විකල්ප සංවර්ධන ප්‍රවේශයක් සෙවීමේ ප්‍රයත්නයක නිරතව සිටියහ. එහිදී එම කාර්යයෙහි නිරත වූ සමාජ ආර්ථික විද්‍යාඥ කණ්ඩායම එම රටවල එවකට ක්‍රියාත්මක වූ ග්‍රාම සංවර්ධන ප්‍රතිපත්ති හා සැලසුම් ද ග්‍රාම සංවර්ධන වැඩසටහන් ද ගැඹුරින් අධ්‍යනය කළ අතර ඔවුනට පෙනී ගිය එක් ප්‍රධාන කරුණක් වූයේ එවකට ක්‍රියාත්මකව පැවති ග්‍රාම සංවර්ධන ක්‍රියාවලිය තුළ දිළිඳු ප්‍රජාවට ප්‍රමාණවත් ප්‍රතිලාභ නොලැබෙන බව සහ ඒ ක්‍රියාදාමය ග්‍රාමීය දිළිඳුබව පිටුදැකීමට අපොහොසත් වී ඇති බවය.

ඉහත කී පර්යේෂණ කණ්ඩායමට ශ්‍රී ලංකාවේ සම්මානනීය සමාජ ආර්ථික විද්‍යාඥයින් දෙදෙනෙකු වූ ජී.වී.එස්. ද සිල්වා සහ ආචාර්ය පොන්න විග්නරාජා යන දෙපළ ද අයත් වූ අතර, දකුණු ආසියාතික රටවලදී ලද දැනුම හා අත්දැකීම් ශ්‍රී ලංකාව තුළද හුවමාරු කර ගැනීමට ඔවුනට අවශ්‍ය විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1978 අප්‍රියෙල් මාසයේ දී UNAPDI සහ කොන්රාඩ් ඇඩිනූර් පදනමේ මූල්‍ය සහාය ඇතිව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී වැඩමුළුවක් පැවත්වවුණි. වැඩමුළුවේ තේමාව වූයේ ශ්‍රී ලංකාව තුල ඒ වන විට පැවති ග්‍රාම සංවර්ධන ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් අධ්‍යනය කිරීම, විශ්ලේෂණය කිරීම සහ දකුණු ආසියාතික රටවල අත්දැකීම් සමඟ හුවමාරු කර ගැනීමත්, ග්‍රාමීය දිළිඳුබව පිටුදැකීම මුල් කරගත් නව ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් විවරකර ගැනීමට ඇති ඉඩකඩ සොයා බැලීමත්ය.

වැඩමුළුවේදී හඳුනාගත් ප්‍රධාන කරුණු අතර,

I. ශ්‍රී ලංකාවේ එවකට ක්‍රියාත්මක වූ ග්‍රාම සංවර්ධන ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් ග්‍රාමීය ප්‍රජාවගේ විශේෂයෙන්ම ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගේ ප්‍රශ්න සහ ගැටළු සඳහා ප්‍රමාණවත් විසඳුම් ලබා දීමට අපොහොසත් වීම.
II. පිටතින් සැලසුම් කර ගමට එන සංවර්ධන ව්‍යාපෘති බොහෝවිට අසාර්ථකත්වයෙන් කෙළවරවීම.
III. ග්‍රාමීය ජනතාවගේ සහභාගිත්වය ඇතිව ගමේ අවශ්‍යතා මත පදනම් වූ කුඩා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති තුළ සාර්ථකත්වයක් දක්නට ලැබීම
IV. සංවර්ධනයේ දී භෞතික සම්පත් ද ඇතුළු මානව සංවර්ධනයක අවශ්‍යතාවය
V. ප්‍රජා සහභාගිත්වය මුල් කරගත් සංවර්ධන ක්‍රියාවලියක සහ ඒ සඳහා මානව හිතවාදී මැදිහක්කරුවකුගේ / විපර්යකාරකයකුගේ අවශ්‍යතාවය

වැඩමුළුව අවසානයේ ප්‍රජා සහභාගිත්වය මුල් කරගත් නව සංවර්ධන ප්‍රවේශයක් විවර කර ගැනීමේ හැකියාව සොයා බැලීමේ සහ ඊට අවශ්‍ය මානව හිතවාදී මැදිහත්කරුවන් පුහුණු කිරීමේ වගකීම බොරැල්ල ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයට (RDTRI) පැවරුණි. ඒ අනුව 1978 සැප්තැම්බර් මාසයේදී ආයතනය විසින් එහි ආරම්භක පියවරක් ලෙස ග්‍රාම සංවර්ධනය පිළිබඳ දීර්ඝ අත්දැකීම් ඇති කණ්ඩායමක් තෝරාගෙන කාර්ය බද්ධ වූ පුහුණු හා පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ

කරන ලදී. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දී (SLIDA) පැවති වැඩමුළුවේදී සම්පත්දායකයින් ලෙස කටයුතු කළ ජී.වී.එස් ද සිල්වා සහ ආචාර්ය පොන්න විග්නරාජා ඇතුළු සමාජ විද්‍යාඥ කණ්ඩායමක උපදේශකත්වයෙන් ක්‍රියාත්මක වූ මෙම පුහුණු හා පර්යේෂණ ව්‍යාපෘතිය තුළ මූලික වශයෙන් බලාපෙරෙත්තු වූ කරුණු දෙකකි.

01. කාර්යබද්ධ පුහුණුව තුළ මූලික පුහුණුකරුවන් කණ්ඩායමක් බිහිකර ගැනීම සහ ඔවුන් හරහා නව පුහුණුකරුවන් පිරිසක් පුහුණු කර පුහුණුකරු සංචිතය වැඩිකර ගැනිම.
02. ප්‍රජා සහභාගිත්වය මුල් කරගත් සංවර්ධන ක්‍රියාවලියක් ආරම්භ කිරීමට හැකිවන පරිදි ග්‍රාමීය මට්ටමින් නිර්මාණශීලී විපර්යකාරකයින් පිරිසක් හඳුනා ගැනීම සහ ඔවුන්ට ඒ සඳහා පුහුණුවක් ලබා දීම.

මෙම කාර්යබද්ධ පුහුණු වැඩසටහනේ විශේෂත්වය වූයේ මැදිහත්කරුවන් සහ ග්‍රාමීය දිළිඳු ප්‍රජාව අතර පැවැත්වෙන නිරතුරු සාකච්ඡා සහ සංවාද තුළ දෙපාර්ශවයම විසින් ගමේ ක්‍රියාත්මක වන සමාජ ආර්ථික යථාර්ථයන් තේරුම් ගැනීමත්, විශේෂයෙන් දුගීබව සහ ඔවුන් පීඩනයට පත් කළ සමාජ ආර්ථික බලවේග හඳුනාගෙන සාමූහිකව ක්‍රියා කිරීම තුළ එම තත්වයන් තමන්ට වාසිදායක ලෙස වෙනස්කර ගැනීමට ඇති ඉඩකඩ විවර කර ගැනීමත්ය. සාමාන්‍ය පුහුණු කටයුතුවලදී කෙරෙන දැනුම බෙදා දීමේ සාම්ප්‍රදායික ක්‍රමයට වෙනස් වූ මේ ක්‍රියාදාමය තුළ මූලික වශයෙන් අපේක්ෂා කෙරුනේ ග්‍රාමීය සංවර්ධන අත්දැකීම් හුවමාරුව, ඒවා අධ්‍යයනය, විශ්ලේෂණය සහ අත්දැකීම්වලින් ඉගෙනීම තුළ අලුත් ක්‍රියාකාරකම්වලට යොමු කිරීමය.

1978 – 1984 කාල පරිච්ඡේදය විපර්යකාරක වැඩසටහනේ ප්‍රාථමික අවධිය නැත්නම් පර්යේෂණ අවධිය ලෙස දැක්වීමට පුළුවන. ග්‍රාමීය දුගීබව පිටු දැකීම පිළිබඳව ප්‍රජා සහභාගිත්වය මුල්කරගත් නිර්මාණශීලී සංවර්ධන ප්‍රවේශයක් සංකල්ප ගතවූයේ මෙම කාලසීමාව තුළය. එසේම මෙම කාලසීමාව තුළ ගම්වලට අනුයුක්තව සිටි මූලික පුහුණුකරුවන් හරහා ග්‍රාමීය මට්ටමින් විපර්යකාරකයින් පිරිසක් හඳුනා ගැනීම, ඔවුන් සජීවීකරණ පුහුණුවකට ලක් කිරීම සහ ඉහත දැක්වූ ප්‍රජා මූල සංවර්ධන ප්‍රවේශය ක්‍රියාවට නැංවීම සඳහා ඔවුන් උපයෝගී කර ගැනීමද සිදුවිය. මෙහි ප්‍රතිඵලය වූයේ පුහුණුකරුවන්ගේ සහ විපර්යකාරකයින්ගේ විමර්ශනයට ලක් වූ ගම්වල දුගී ජන කොටස් තමන් දුගීබවට පත් කළ බලවේග සහ මුහුණ පා ඇති අවාසි සහගත තත්වයන් අවබෝධ කරගෙන එයින් මිදීම සඳහා කුඩා කණ්ඩායම් වශයෙන් ඒකරාශී වී සාමූහිකව ක්‍රියා කිරීමට ඉදිරිපත් වීමේ ප්‍රවණතාවයක් මතු වීමය. මූලික පුහුණුකරුවන් ගම් විමර්ශනයට, විපර්යකාරකයින් හඳුනා ගැනීමට හා ඔවුන්ගේ පුහුණුව සඳහා වැඩි කාලයක් ගත කිරීම නිසා මේ කාලය තුළ සංවර්ධන ප්‍රවේශයක් ලෙස කණ්ඩායම් ක්‍රියාවලිය ගොඩනැගුනේ ඉතා මන්දගාමී ස්වරූපයකින් බැවිද මෙහි ලා සඳහන් කළ යුතුය.

මෙම පර්යේෂණ කාලපරිච්ඡේදය තුළ කුඩා කණ්ඩායම් ක්‍රියාවලියේ කිසියම් ප්‍රගතියක් දක්නට ලැබුණද 1983-84 වන විට මෙම නියාමක ව්‍යාපෘතිය දිගටම පවත්වාගෙන යාම පිළිබඳව ගැටළු

කිහිපයක් පැන නැගී තිබුණි. විශේෂයෙන් ව්‍යාපෘතිය පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍යාධාර අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වීම, පුහුණුවලත් සමහර පුහුණුකරුවන් සහ විපර්යකාරකයින් වැඩසටහන අතහැර යාම සහ වැඩසටහනේ රැඳී සිටි සමහර පුහුණුකරුවන් අතර වූ මතභේදාත්මක තත්වයන් නිසා වැඩසටහන ඉදිරියට පවත්වාගෙන යාමේ කිසියම් අවිනිශ්චිත තත්වයක් උදාවිය. එහෙත් 1984 වර්ෂය වන විට ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය සඳහා පූර්ණකාලීන අධ්‍යක්ෂවරයකුගේ සහාය ලැබීම ඇතුළු පරිපාලනයේ ඇති වූ වෙනස්කම් සහ ඇදිහැස (CARE) සංවිධානය විපර්යකාරක වැඩසටහනේ සජීවීකරණ පුහුණුව දිගටම පවත්වාගෙන යාම සහ එහි ව්‍යාප්තිය සඳහා මූල්‍යාධාර සැපයීමට ඉදිරිපත් වීමත් සමඟ පැන නැගී තිබූ අවිනිශ්චිත තත්වය ක්‍රමයෙන් බැහැර වන්නට විය.

ඇදිහැස සංවිධානයේ මූල්‍යාධාර යටතේ වැඩසටහන ක්‍රියාත්මක වූ 1984-87 දක්වා කාලය තුළ වැඩසටහනේ සජීවීකරණ ක්‍රමවේදය තුළ විශාල වෙනසක් නොවූවද වැඩසටහන පර්යේෂණ තත්වය අභිබවා ගම් මට්ටමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දක්වා පැතිරුණ දිළිඳුකම පිටු දැකීමේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක් බවට පරිවර්තනය වීම විශේෂත්වයක් විය. විශේෂයෙන් මේ කාලය තුළ දුප්පත් ජන කොටස්වල ආදායම් වර්ධනය, ඉතිරි කිරීම් ප්‍රවර්ධනය සහ චක්‍රිය අරමුදල් පවත්වාගෙන යාමට උනන්දු කරවීම තුළ ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනයක් දක්නට ලැබේ.

1987-1997 – SIDA මූල්‍යාධාර යටතේ වැඩසටහන ක්‍රියාත්මක වූ කාලපරිච්ඡේදය තුළ විපර්යකාරක වැඩසටහනේ සීඝ්‍ර ව්‍යාප්තියක් පෙන්නුම් කළේය. එම කාලසීමාව තුළ ග්‍රාමීය දිළිඳු පවුල් 64,465 ක් ආවරණය කරමින් කුඩා කණ්ඩායම් 6,708 ක් ගොඩ නැගී තිබුණි.

මේ කාලය වන විට කණ්ඩායම් ක්‍රියාවලිය තුළ ඉතිරි කිරීම් හා කණ්ඩායම් අරමුදල් ගොඩ නැගීම හා ආදායම් වැඩි දියුණු කිරීමේ කටයුතුවලට අමතරව සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු පිළිබඳවද කණ්ඩායම්වල විශේෂ අවධානය යොමුවී තිබුණි. වැඩසටහන පිළිබඳව කරනු ලැබූ ඇගයීම් වාර්තා අනුව 1997 අවසානය වන විට කණ්ඩායම් ක්‍රියාවලිය තුළ වැසිකිළි 7,247 ක් හා පානීය ජල ළිං 2,348 ක් ද, නිවාස ඉදිකිරීම් සහ අලුත්වැඩියාවන් 5,337 ක් ද ගොඩනැගී ඇත. සීමිත හා ඒකාකාර ක්‍රියාකාරකම් කිහිපයකට සීමා වී තිබූ කණ්ඩායම් ක්‍රියාවලිය තුළ විස්තීර්ණ ණයක්‍රම උපයෝගී කරගෙන සාමාජික පවුල් අතර ස්වයං රැකියා උත්පාදනය සහ අලුත් ව්‍යවසායක පන්තියක් බිහිවීමේ ප්‍රවණතාවයක් ද මේ කාලය තුළ මතුවෙමින් තිබුණි. රිදීගම ආසිරි මානව සංවිධානය සහ රඹෑව ප්‍රජාශක්ති සංවිධානය වැනි කාර්යස්ථානවල චක්‍රිය අරමුදල් භාවිතා කර සිදුවෙමින් පැවති සමාජ හා ආර්ථික පරිවර්තනය මේ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකිය.

සාමාන්‍යයෙන් විදේශ ආධාර මත ක්‍රියාත්මක වූ වැඩසටහන්වල ක්‍රියාකාරිත්වය විදේශ ආධාර අවසන් වීමත් සමඟ පසුබෑමට ලක්වීම ඉතිහාසය පුරා දක්නට ලැබේ. එහෙත් 1997 වන විට වැඩසටහනට සපයන ලද SIDA ආධාර අවසන් අදියරට පැමිණ තිබුණද SIDA ආධාර යටතේ විපර්යකාරක වැඩසටහන තුළ ගොඩනැගුනු කණ්ඩායම් ක්‍රියාවලිය ස්වාධීන ආයතන ලෙස මේ දක්වා ක්‍රියාත්මක වෙමින් පවතී. කණ්ඩායම් ක්‍රියාවලියට පහසුකම් සැපයූ මැදිහත්කරුවන් බොහෝ දෙනෙකු SIDA

මූලාධාර අවසන් වීමත් සමඟ වැඩසටහනින් ඉවත්ව ගියද කණ්ඩායම් ක්‍රියාවලිය තුළින්ම බිහිවූ සජීවිකරුවන්ගේ / විපර්යකාරකයන්ගේ සහාය ඇතිව කුඩා කණ්ඩායම් ඒකාබද්ධ වී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මගින් ගොඩනගාගත් ප්‍රජාශක්ති නමින් වූ මධ්‍ය සංවිධාන හරහා වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී. 1998 වන විට රාජ්‍ය නොවන සංවිධාන ලෙස ලියාපදිංචි වූ ප්‍රජාශක්ති සංවිධාන ගණන 64 ක් විය. මෙම ප්‍රජාශක්ති සංවිධානවල කටයුතු සම්බන්ධීකරණය සඳහා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI) සහ SIDA ආයතනවල ආශිර්වාදය ඇතිව ප්‍රජාශක්ති මහා සංගමය නමින් ජාතික මට්ටමේ සංවිධානයක්ද පිහිටුවාගෙන ඇත.

විපර්යකාරක වැඩසටහන තුළින් නිර්මාණය වී ක්‍රමානුකූලව වර්ධනය වූ සජීවිකරණ ක්‍රමවේදය ග්‍රාමීය සංවර්ධනයේදී විශේෂයෙන් දිළිඳුකම දුරුලීමේ වැඩසටහන්වලදී කෙතරම් සාර්ථක ලෙස භාවිතා වීද යන්න වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන තුළ මෙම ක්‍රමවේදය බද්ධ කර ගැනීමට ක්‍රියාකිරීම තුළ මනාව පැහැදිලි වේ.

1980 දශකය මැද භාගයේ හම්බන්තොට ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ (IRDP) දිස්ත්‍රික්කය තුළ නොදියුණු ගම්මාන දියුණු කිරීමේ විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වූ අතර, ඒ පිළිබඳව කරන ලද විමර්ශනයකදී පෙනී ගියේ ව්‍යාපෘතිය මගින් තෝරාගත් ගම්මානවල දිළිඳු ජන කොටස් සඳහා සපයනු ලැබූ ආධාර වැඩි වශයෙන් දිළිඳු ජන කොටස්වලට වඩා දිළිඳු නොවන ජන කොටස් අතට පත්වී ඇති බවයි. ඊට විසඳුමක් ලෙස ව්‍යාපෘති කළමනාකාරිත්වය විසින් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය සමඟ සාකච්ඡා කර, අදාළ ගම්මානවලින් තරුණ කණ්ඩායමක් තෝරාගෙන විපර්යකාරක ක්‍රමවේදය යටතේ ඔවුනට සජීවිකරණ පුහුණුවක් ලබා දී ව්‍යාපෘති සහනාධාර ලබා දීමට පෙර එම ගම්මානවල ප්‍රතිලාභීන් දැනුවත් කිරීමට සහ කණ්ඩායම් ක්‍රියාවලියකට යොමු කරන ලදී. ඉන්පසු ව්‍යාපෘතියෙන් සපයනු ලැබූ සේවා, ගම්මානවලින් ගොඩනැගුනු කුඩා කණ්ඩායම් හරහා ඉතා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉලක්ක පිරිස වෙත යොමු කිරීමට ව්‍යාපෘතිය සමත් වූ අතර, මාතර හා මොනරාගල දිස්ත්‍රික්කවල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන්ද හම්බන්තොට IRDP අනුව යමින් මෙම ක්‍රියාවලිය සාර්ථක ලෙස ක්‍රියාවට නංවන ලදී. තවද අදාළ ව්‍යාපෘති කාර්යාලවල මේ සඳහා සමාජ නියාමක නමින් විශේෂ ඒකක පිහිටවූ අතර ඒ සඳහා අනුයුක්ත වූ නියාමක පිරිස් සමාජ නියාමක නමින් හැඳින්වූහ. පසුකාලීන ජනසවි ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ සජීවිකරණ ක්‍රියාවලිය ආරම්භ කරන විට විපර්යකාරක ක්‍රමවේදය මෙන්ම IRDP ක්‍රියාත්මක වූ සමාජ නියාමක වැඩසටහනේද (Social Mobilization Program) අත්දැකීම් පාදක වූ බැව් මෙහිලා සඳහන් කළ යුතුව ඇත.


දිළිඳුබව පිටුදැකීම මුල්කරගත් ජාතික මට්ටමින් ක්‍රියාත්මක වූ ජනසවිය සහ සමෘද්ධි වැඩසටහන්ද ප්‍රතිලාභීන් දැනුවත් කිරීම සහ සවිබලගැන්වීම සඳහා මූලික වශයෙන් යොදා ගත්තේ විපර්යකාරක වැඩසටහන තුළින් ගොඩනැගුනු සහ IRDP සමාජ නියාමක වශයෙන් පෝෂණය වූ සජීවිකරණ ක්‍රමවේදයයි. මෙම ව්‍යාපෘති දෙකම සමාජ සජීවිකරණය යොදාගෙන ඇත්තේ දුප්පතුන්ට ලබාදෙන

සහනාධාර ඇතුළු පහසුකම් මැනවින් පරිහරණය කර ඔවුන් දිළිඳුබවින් මුදවා ගැනීමේ ක්‍රමෝපායක් ලෙසය. මීට අමතරව විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වූ ප්‍රජා ජලසම්පාදන ව්‍යාපෘතිය, ඖෂධ පැළෑටි සංරක්ෂණය හා තිරසාර භාවිතය පිළිබඳ ව්‍යාපෘතිය, ඉඩම් අහිමි හා සුලු ගොවීන් සඳහා වූ ණය පහසුකම් සැලසීමේ ව්‍යාපෘතිය ඇතුළු රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශයේ වැඩසටහන් රැසකම ව්‍යාපෘතීන්ට ගැලපෙන පරිදි ප්‍රජාව දැනුවත් කිරීමේ සහ සංවිධානය කිරීමේදී යොදාගෙන ඇත්තේ විපර්යකාරක ව්‍යාපෘතියෙන් නිර්මාණය වූ සජීවීකරණ ක්‍රමවේදයයි.

විපර්යකාරක වැඩසටහන යටතේ ගොඩනැගුනු සමාජ සජීවීකරණ ක්‍රමවේදයේ සාර්ථකත්වය පිළිබඳව සහ එම ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක වූ සමහර වැඩසටහන් ලබාගෙන ඇති ප්‍රගතිය පිළිබඳව මේ වන විට යහපත් පිළිගැනීමක් ඇත. ඒ අනුව සමහර විදේශීය ආධාර ආයතන පවා සංවර්ධන පහසුකම් සැලසීමේදී ප්‍රජා සහභාගිත්වය පූර්ව කොන්දේසියක් ලෙස ඉදිරිපත් කිරීමට තරම් පෙළඹී ඇත. කෙසේවුවද සජීවීකරණය පූර්ව කොන්දේසියක් ලෙස යොදාගත් සමහර ව්‍යාපෘති පිළිබඳව දැඩි විවේචන ඇති බවද මෙහිලා සඳහන් කළ යුතුව ඇත. උදාහරණයක් ලෙස ගතහොත් සමෘද්ධි වැඩසටහන තුළ සමෘද්ධි නියාමකයින් බඳවා ගැනීම සහ සමහරවිට සමෘද්ධිලාභීන් තේරීමේදී පවා සංවර්ධන අභිලාෂයන් අභිබවා දේශපාලන අභිලාශයන් මුල්වීම නිසා එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත මට්ටමේ ප්‍රතිලාභ ලැබී නැති බවත් ඒ වෙනුවට මාසිකව ලබා ගන්නා සමෘද්ධි සහනාධාර මත යැපෙන පිරිසකුත් වැඩසටහන තුළ නිර්මාණය වී ඇති බවත් ඒ සඳහා ඉදිරිපත් වී ඇති එක් ප්‍රභල විවේචනයකි.

සමාජ සජීවීකරණය නිරායාසයෙන් සිදු නොවේ. ඒ සඳහා උත්ප්‍රේරක මැදිහත් වීමක් අවශ්‍යය. අපගේ අත්දැකීම අනුව සජීවීකරණය මූලික කරගත් වැඩසටහන්වල සාර්ථකත්වය රඳාපවතින්නේ සජීවීකරුවන්ගේ නැත්නම් මැදිහත්කරුවන්ගේ දැනුම, ආකල්ප, ඔවුන්ගේ නිර්මාණශීලීත්වය, කාර්යක්ෂමභාවය සහ කැපවීම මතය. එසේම ග්‍රාම සංවර්ධනය පිළිබඳ වැඩසටහන්වලදී විශේෂයෙන් ග්‍රාමීය දිළිඳුබව පිටුදැකීම පිළිබඳ වැඩසටහන්වලදී සජීවීකරු / නැත්නම් මැදිහත්කරු ගැමියන් සමඟ එකට වැඩ කිරීමට කැමති, ඔවුන්ගේ දැනුම හා අත්දැකීම්වලට ගරු කරන පුද්ගලයකු වීමද වැදගත්ය. සජීවීකරණ ක්‍රියාවලියක් තුළ මූලිකව සිදු වන්නේ දිළිඳු ජන කොටස් දැනුවත් වීම, සංවිධානගත වීම සහ සාමූහික කටයුතු කිරීම තුළ ඔවුන්ට බලපාන අවාසිදායක තත්වයන්ගෙන් මිදීමට අවශ්‍ය බලය හා ශක්තිය නැත්නම් සවිබලගැන්වීමේ ක්‍රියාදාමයක් ගොඩනැගීම බැවින් සජීවීකරු / මැදිහත්කරු ඊට ගැලපෙන මානව හිතවාදී පුද්ගලයකු විය යුතුය.

සජීවීකරණ ක්‍රමවේදය




නිර්මාණශීලී මැදිහත්වීමක් තුළ සාර්ථක සජීවීකරණයක් සිදුවන අතර සාර්ථක සජීවීකරණයක් තුළ සාර්ථක ප්‍රජා සවිබලගැන්වීමක් සිදු කෙරේ.

වර්තමාන රජයද ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජාසවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රජාශක්ති වැඩසටහන යටතේ සමාජ සජීවීකරණය සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන

ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මේ පසුබිම යටතේ දැනට ක්‍රියාත්මක වන සජීවීකාරකයින්ගේ දැනුම යථාවත් කිරීම, නව සජීවීකරුවන් පුහුණු කිරීම, අදාළ නිලධාරීන් දැනුවත් කිරීම, සජීවීකරණ අත්දැකීම් හුවමාරුව සහ විශ්ලේෂණය සඳහා වේදිකාවක් නිර්මාණය කිරීම, ක්ෂේත්‍ර අත්දැකීම් අධ්‍යයනය, ඒවා ලේඛනගත කිරීම සහ ප්‍රචාරණය සඳහා ජාතික මට්ටමේ ශක්තිමත් ආයතන ව්‍යුහයක් අවශ්‍යය ය. ඒ අනුව බලන කළ සජීවීකරණ ක්‍රියාවලිය පිළිබඳ පූර්ව අත්දැකීමක් ඇති, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයට පැවරෙන වගකීම අති විශාලය.



**ඒ.පී.ඩයනීස්**

**හිටපු අධ්‍යක්ෂ,**

**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.**

# 09.

දිරිය කතුන්ට මල් මිටක් කොට පුදනු කැමැත්තෙමි.
මාර්තු 8 නිසාම නොලියමි..
වැඩ ඇරී... වැඩට යන
"ඇය".... නිසා ලියමි...
...................

කඳුකඩා වැටෙන විට
පොළොව මෙන් දරාගෙන
වැව් පුරා පිරෙන කළ
බැම්ම සේ උහුළගෙන
හෙන ගසා ගුගුරු දෙන
වළාකුළු පලාගෙන
නුඹ.. වැස්ස ඉරිතැලුනු
වියළිබිම් සරු කරන

ලේන කුලයේ ඉපිද
මහ සයුර කැළඹූ .........
පටාචාරා නුඹය
දරු පෙමින් හැඩවූ
යසෝධර දේවියයි
සසර මග හමු වූ
ගිනි ගහන දිවි කතර
නිව නිවා සැනසූ ........

මල් වරන කාලයට
මලක් වී පිපීයන්
බොල් පොලොව හඬන කළ
පින්න වී වැටීයන්
නිල් අහස තනිනොකර
සඳක් වී නැගීයන්
සිල් පුරන හිත් ගාව
බණක් වී රැඳීයන් ........



**ක.ප.ම.පතිරණ**
**සමෘද්ධි කළමනාකරු, සමෘද්ධි සන්නිවේදක**
**( A+ නිලධාරී), TOT සමෘද්ධි / ප්‍රජා ශක්ති මෘද්ධි ප්‍රජාමූල බැංකුව,**
**වීරගොඩ.**

# 10.

ප්‍රජා ශක්තිය ගොඩනඟන්නට….......

දැයක් නංවන හෙටක්
ගමක් තනනා දිනක්
එකම යදමක බැඳී ...
රොද බඳිමු අපි ...
ප්‍රජා ශක්තිය ගොඩනඟන්නට ..
අපේ දේශයෙ යළිත් ...

පරපුරේ අභිමානයෙන්
අධිෂ්ඨානේ බල රාවයෙන්...
සතුට සැනසුම උදා කරවන
රට පුරා ගම් දනව් සරණා ...
ප්‍රජා ශක්තිය ගොඩ නගමු අපි ..
එකා මෙන් හැගුමින්...

නැවුම් පැතුමන් සරින්
නවමු නිපැයුම් තනා ...
දියුණුවේ රන් කිරුළ ගවසා
පවුරු බිඳ පහුරු බැද ...
ප්‍රජා ශක්තිය ගොඩ නගමු අපි ..
එකා මෙන් හැගුමින්...



**එස්.එම්.මංජුල දිසානායක**
**සංවර්ධන නිලධාරී (සමථ),**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අරණායක.**

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන *ප්‍රජාශක්ති* විද්‍යුත් මාධ්‍ය සඟරාව ඔස්සේ විවිධ සංවර්ධන ක්‍රියාකාරකම්..........

- පර්යේෂණ
- පුහුණු වැඩසටහන්
- අධ්‍යයනයන්

වල නිරතව ඔබ ලද අත්දැකීම් බෙදා හදා ගන්නට අප සූදානම්.

ඔබේ අත්දැකීම් ලියන්න අපට..................

- ✓ ***ලිපියක් නම්.........*** A4 පිටු 3-6 අතර
- ✓ ***නිර්මාණයක් නම්.........*** සඳැස් හෝ නිසැඳැස් A4 පිටු 1
- ✓ Font - Skoola potha
- ✓ Font Size – 12

dodd.dtri@gmail.com

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය,
ග්‍රාම සංවර්ධන මාවත,
පිළිමතලාව